

# පද්‍යමඩුව



සන්න සහිත

# ප ජ්ජ ම ධු ව.

ශ්‍රීමත් ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය
බුද්ධප්‍රිය ස්වාමිපාදයන් විසින්
විරචිතයි.

කොළඹ විද්‍යෝදය පිරිවෙණේ වාසී *
හෙයියන්තුඩුවේ දේවමිත්ත ස්වාමීන් විසින්
ශුද්ධ කොට සංස්කරණලදී.

සියලු අයිතිකාරයන්ගේ කැමැත්ත ඇතුව
ඇන්. ඇම්. පෙරේරා විසින්
කොළඹ ලඞ්කාභිනව විශ්‍රැත නම් යන්ත්‍රාලයෙහි
අච්චු ගස්වනලදී.

ශ්‍රී බුද්ධවර්ෂ 2431.

# THE PAJJA MADHU

PĀLI POETRY BY
THE VENERABLE BUDDHAPRIYA
WITH THE
SINHALESE TRANSLATION OF THE AUTHOR.

EDITED BY THE
REVD. H. DEVAMITTA
OF
VIDYODAYA PARIVENA COLOMBO.

Published by N. M. PERERA
at Lankabhinawawistruta Press
COLOBO.

1887.

INTRODUCTION.

# සංඥාපනය.

## පද්‍යමධු.

ශෛලාභරණ නැමැති මධුව පද්‍යමධු නම් වේ. *

**මේ** කාව්‍යය කවර කාලෙක කවර රටක වූ කවරෙකු විසින් කරණ ලද්දේ ද?

ශ්‍රීබුද්ධවර්ෂයෙන් 1703 නේදී ලඞ්කාරාජ්‍යපදප්‍රාප්තව නානාදෙශයන් යටත් කොට සකලනගරයන්හි විරාජිත පොළොන්නරුව අග්‍රරාජධානිය කොට රාජ්‍ය කළ ශ්‍රීසඞ්ඝබෝධිපරාක්‍රමබාහු නම් මහාරාජාධිරාජෝත්තමයානන් විසින් මාහැඟි කොට කරවනලද දක්ෂිණාරාම නම් විහාරාධිපති ව වැඩ වුසූ බුද්ධප්‍රියස්වාමිපාදයන් විසින් කරණලදී —— ඒ මේ බුද්ධප්‍රියස්වාමිපාදයන් වහන්සේ නම් ආනන්ද නම් වනරතන මහාස්ථවිරපාදයන් වහන්සේගේ ශිෂ්‍යයෙකැයි කියනලදී, ඒබව මේ ප්‍රකාරණයෙන් හා මාගධිභාෂාහි පදසිද්ධි අවබෝධය පිණිස මුන්වහන්සේ විසින් කාතන්ත්‍රන්‍යාසයන් ආශ්‍රය කොට කරණලද මහාරූපසිද්ධිප්‍රකරණාවසානයෙහි "විඛ්‍යාතානන්දථෙරවහයවරතරූනං තම්බපණ්ණිද්ධජානං, සිස්සො දීපඞ්කරාඛ්‍යො දමිලවසුමතී දීපලද්ධප්පකාසො, බාලාදිච්චාදිවාසද්විතයමධිවසං සාසනං ජෝතයී යො, සොයං බුද්ධප්පියව්හො යති ඉමමුජුකං රූපසිද්ධිං අකාසි" යන මේ ගාථා සෙනුදු ප්‍රකාශිතයි, මුන්වහන්සේට දීපඞ්කර බුද්ධප්‍රිය යන නාමවය ද තිසිකලෙක සොළිරට බාලාදිත්‍යවාසය වූ චාමණිකම්මවිහාරය යන විහාරවලෙහි වැඩවසමින් එහි බුදුසසුන් බැබලවූ බැවින් චොළියබුද්ධප්පිය යන නාමයද කියනලදී; † මුන්වහන්සේ ශ්‍රද්ධාශීලාද්‍යනේකගුණසමුදයසම්පන්නවිපුලවිමල බුද්ධි ඇති ත්‍රිපිටකධාරී මහාස්ථවිර කෙනෙකුන්ව ත්‍රිපිටකධර්මාදි ශාස්ත්‍රයන් මනා කොට උගත් බොහෝ පණ්ඩිතශිෂ්‍යයන් ඇතිව බුදුසසුන් බැබලවූ උතුමෙකි. ඒබව තවත් අතිවිශිෂ්ට වූ සිද්ධාර්ථ නම් පණ්ඩිත ස්ථවිරයන් වහන්සේ විසින් විරචිතසාරසඞ්ග්‍රහ නම් වූ විවිධ ධර්මප්‍රකරණාවසානයෙහි "දක්ඛිණාරාමපතිනො පිටකත්තයධාරිනො බුද්ධප්පියව්හථෙරස්ස යො සිස්සානමනිමො අහු; තෙන සිද්ධත්ථනාමෙන ධීමතා සුචිවුත්තිනා ථෙරෙන ලිඛිතො එසො විචිත්‍රො සාරසඞ්ගහො" යනාදියෙන් හැඟේ —— මේ යතිතුමන්වහන්සේ ව්‍යාකරණාදි නොයෙක් ශබ්දශාස්ත්‍රයන් ද තර්කානුමානාදිය ද පිටකත්‍රයධර්මය ද මනා කොට උගෙණීමෙන් බුද්ධධර්මයෙහි ද නානා ශාස්ත්‍රයෙහි ද නානා සමයෙහි ද විශාරද පටුත්වයක් ඇතිව මාහැඟි ප්‍රකරණයන් කළ

* 103 වෙනි ගාථාව බලනු.

† සොළිරට උපන්කෙනෙකැයි ඇතැම් පණ්ඩිතයෝ කියත්.

උත්තම්ග්‍රන්ථකර්තෘ කෙනෙකි, එබව රූපසිද්ධ්‍යාදියෙන් සුප්‍රකාශිතයි, රූපසිද්ධිය නම් පාණිනීයව්‍යාකරණයට සිද්ධාන්තකෞමුදිය මෙන් කච්චායනව්‍යාකරණය ඉගෙණගන්නන්ට ඉතා උපකාරයි, රූපසිද්ධියෙන් මෙන් කසයින් විරිතෙන් එහි සූත්‍රයන්ගේ අදහස් සුබොධ නොවේ, රූපසිද්ධිකාවත් මුන්වහන්සේ විසින්ම කළබව එහි සඳහන්කරණලදි.——පද්‍යමධු නම් මේ ග්‍රන්ථය කුමක් නිසා කවර පරිද්දෙකින් කරණලද්දේද? රත්නත්‍රයගුණානුස්මරණය හා සියලු සතුන් කෙරෙහි මෛත්‍රී කිරීම සියලු ගුණප්‍රතිලාභයට මූලකාරණ වන බැවින් ඒ රත්නත්‍රයගුණානුස්මරණමුඛයෙන් සත්‍යාභිහිතාශිංසනය ද ඒ සත්‍යාභිහිතාශිංසනමුඛයෙන් රත්නත්‍රයගුණානුස්මරණය ද ඒකවාක්‍යප්‍රයොගයෙන් නිපදවා ඒ අනුස්මරණකුශලය සත්ත්වයන්ට පිරිනමා එයින් හිතාශිංසනවශයෙන් මෛත්‍රී කරණ නිසා පද්‍යරචනාවශයෙන් කරණලදි. —— මේ කාව්‍යය නම් මධුරමනොහර කාව්‍යලක්ෂණයෙන් සම්පන්නවූ ගරු කටයුතු උත්තම්ග්‍රන්ථයන්ගේ වර්ගයට ඇතුළත් වූ බුද්ධවචනානුගත මාහැඟි ධර්මයන්ගෙනුත් ශබ්දාලඞ්කාරයෙනුත් ප්‍රතිමණ්ඩිතවූ බුද්ධධර්මය පුහුණුකරන්නන්ටත් එකවාක්‍යසම්බන්ධයෙන් බුද්ධාදිරත්නත්‍රයගුණානුස්මරණය හා මෛත්‍රීභාවනා කරණු කැමති සැදැහැඇති සජ්ජනයන්ටත් මාගධීභාෂාවිජානනාභිලාෂීන්ටත් ශබ්දාලඞ්කාරොපදෙශයන් දැනගණු කැමැත්තන්ටත් අත්‍යන්තොපකාරවූ උගතුන් විසින් සම්භාවනා කටයුතු වූ සන්දර්භගුම්ඵය ඇති මාහැඟි ග්‍රන්ථයෙකි, මෙහි 'උණ්ණපුණ්ණ' යනාදි පළමුවෙනි ගාථාව පටන් හැටනවවැන්න අවසන් කොට සර්වඥයන් වහන්සේගේ රූපකාය අනුස්මරණය කොට යටකී ලෙස මෙත් කරණලදි-එතැන් පටන් ගාථා එකුන්විස්සකින් සර්වඥයන් වහන්සේගේ ධර්මකායවර්ණනාවක් ද, * එතැන් පටන් ගාථා තුණකින් සර්වඥයන් වහන්සේගේ හෙතුඅවස්ථාඵලාවස්ථා දෙක්හි පැවති චරිතාද්භූතවර්ණනාවක් ද, එතැන් පටන් ගාථා පසකින් සර්වඥයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් මෑත සත්‍යාධිෂ්ඨානකරවූ චරිතාද්භූතයන් තත්සදෘශවූ පූර්වචරිතයන් හා එක්කොට වර්ණනාවක් ද, අනූහත්වැන්නෙන් බුද්ධගුණනිගමනයෙන් ආශිංසනයක් ද, අනූඅටවැන්නෙන් පර්‍ය්‍යාප්තිධර්මවර්ණනාවක්ද, අනූනවවැන්නෙන් ප්‍රතිපත්තිධර්මවර්ණනාවක් ද, එක්සියවැන්නෙන් ශාසනමුඛයෙන් සද්ධර්මවර්ණනාවක් ද, එක්සියඑක් වැන්නෙන් නිර්වාණවර්ණනාවක් ද, එක්සියදෙවැන්නෙන් අෂ්ටාර්‍ය්‍යසඞ්ඝරත්නවර්ණනාවක් ද කරණලදි; එක්සියතුන්වැන්න ග්‍රන්ථකර්තෘගේ බුදුන් කෙරෙහි ද සදගුරුන් කෙරෙහි ද භක්තියත් ශාක්‍යගුරුසන්දර්ශනයත් ආත්මසන්දර්ශනයත් ශාක්‍යපද්‍යවර්ණනාමුඛයෙන් ප්‍රණිධානයත් යන මේ සියල්ල එක්කොට රචනාකරණලදී, එක්සියහතරවැන්නෙන් ප්‍රක

* මේ හැම්තන්හි ම ඒ ඒ ගුණවර්ණනාකරමින් යටකී ලෙස මෙත් කළබව දතයුතු.

රණකාරිකා විසින් රචනානුයකුණු සුසම්පූර්ණද්වනායන් උපචිතකුශලය
ඥගීනය කොට තමන්ගේ ප්‍රාර්ථනා කියනලදී.——මෙසේ මේ ග්‍රන්ථ
ය සිවුතුරුපදිසියකින් හොබවා ගොතනලදී, එයින්! එක්සියතුණක්
වසන්තතිලකා නම් වෘත්තයෙකුත් අවසාන පද්‍යය ශාර්දූලවික්‍රීඩිත නම්
වෘත්තයෙකුත් රචනාකරණලදී.——මෙහි සන්නයත් බුද්ධප්‍රියස්වාමීන්ද්‍ර
යන් විසින් ම කළබව මිස අන්‍යපණ්ඩිතයෙකු විසින් කළබවට හෙතු නො
පෙනේ, මේ සන්නය නම් නොයෙක් නිදසුන් දක්වා නොවිලාව අද
හස් සුබොධ වන ලෙස මාහැඟි කොට කරණලද්දේය, එය පදාර්ථ
ණිණ නා මුඛ්‍ය කොට කරණලද්දේ විනුමුත් දුරවබොධ වූ කිසිතැනක
මාහැඟිවූ භාවමාත්‍රයෙකුදු දක්වනලද්දේය, කිසිතැනක සමුදායාර්ථාදි
යත් දක්වනලද්දේය.——බොහෝදෙනාට මහත් අභිවෘද්ධියකාවූ මේ ග්‍ර
න්ථය කාලාන්තරයෙන් ලිපිකරුවන්ගේ ප්‍රමාදදීයෙන් භාගත් නොයෙ
ක් දොෂයන්ගෙන් ආකුලව තිබෙන බැවින් මා විසින් උඩපාත දෙරපින්
පොත් කීපයක් සපයා මාගේ ආචාර්යවූ කොලඹ මාලිගාකන්දේ විද්‍යෝද
ය පරිවෙණාධිපති හික්කඩුවේ ගෞරවාර්හ ආචාර්ය ශ්‍රීසුමඞ්ගලාභිධාන
නායකස්වාමිපාදයන් වහන්සේගේද අසමදවාත්‍රවූ ගෞරවාර්හ බටුවන්
තුඩාවේ පණ්ඩිතදෙවරක්ෂිතාචාර්යයාණන්ගේද උපදෙශන් ඇතුව අවශ්‍ය
කතාලෙඛකයන්ගේ ප්‍රමාදයෙන් ජනිතවිරුද්ධපාඨයන් පහ කිරීමෙන්
ශුද්ධ කොට සංස්කරණලදී.——මේ ප්‍රකරණය ශුද්ධ කරන්නාවූ මාවිසි
න් පද්‍යකිපයක කාලාන්තරයෙන් භාගත් දෙසින් විසුල්වූ පද අර්ථානු
කූල ලෙස යොදනලදහ; ඇතම්තැන සුබාවබොධය සඳහා ද නානා
පාඨයන් දක්වනු සඳහා ද අධොලිපිද යොදනලදී, මෙහි මාගධ ව්‍යව
හාරයෙන් නිෂ්පන්නව ප්‍රාකෘතලෙස ලක්දිව ව්‍යවහාරව එන 'කුම්භ
පෘෂ්ඨි' යනාදි ඇතම් සංස්කෘතනාමයන් ශබ්දශාස්ත්‍රනයටත් වැඩි වි
රුද්ධ නොවන බැවින් වෙනස් නො කරණලදී, අර්ථයට විරුද්ධ වූ 'යපත
බොධිතනා' යනාදිය අව්‍යක්ත ව්‍යවහාරයයි හැඟෙන බැවින් අර්ථානුකූ
ලලෙස සප්තාබොධාන කියා යොදනලදී, සප්තාබොධ්‍යංගයනුදු මීට යො
ග්‍යබැවින් කිසිතැනක එසේද යොදනලදී.——මෙසේ මේ ප්‍රකරණය
මට හැකිපමණින් ශුද්ධ කොට සංස්කරණලද්දේ වී නමුත් මෙහි තව
ත් දොෂ තිබෙන්නට පුළුවනි, එබැවින් මේ ප්‍රකරණය බලන්නාවූ ප
ණ්ඩිතයන් විසින් මෙහි යම් දොෂයක් දකිනුයේ නම් කාරුණ්‍යවය්
ලොකාර්ථසිද්ධිය සඳහා ඒ දෙස් ශුද්ධ කරණුලැබේවා.

මාවිසින් ශුද්ධ කරණලද මේ ග්‍රන්ථය දළුගම පදිංචි ඇන්. ඇම්. පෙරේරා
ආදි කීපදෙනෙකුන් විසින් අච්චුගසනු පිණිස මගෙන් ලබාගන්නාලදී.

මේ සංඥාපනය හෙයියන්තුඩුවේ දෙවමිත්‍ර
ස්ථවිරයන් විසින් ලියනලදී.

H. DEVAMITTA.

# ශුද්ධිපත්‍රය.

——**——

| පි. ට. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 9 | උචිත | උචිත |
| ,, | 31 | ඇට | ඇවිත් |
| 6 | 33 | චතුවනාභිය | චතුමහාභිය |
| 8 | 29 | සතුටුපඬුරැ | සතුටුපඬුර |
| 11 | 17 | ගංගාවෝ | ගඞ්ගාවෝ |
| 12 | 11 | අවඥානනීය | ආඥානනීය |
| 13 | 6 | දෙවා | දෙවාවා |
| 16 | 5 | සෙවුනාවු | සෙවුනාහු |
| ,, | ,, | නදහිං වීය | නහිං වීය |
| ,, | 10 | සංසුවසනන | සංසුවසනනී |
| ,, | 14 | බෙධි | බොධි |
| ,, | ,, | සංසුවසනනා | සංසුවසනනී |
| 22 | 23 | උාර්ණ | උාර්ණා |
| ,, | 34 | ඊශජීවිතයිනවු | ඊශදවිතයිනවූ |
| 23 | 2 | දසනශ්‍රෙණී | දශනශ්‍රෙණී |
| 25 | 22 | තුෂ්ටිකාරණු | තුෂ්ටිකාරණ |
| 29 | 3 | ශොඩස | ශොඩශ |
| ,, | 5 | අමනාරැසී | අමනාර්සී |
| ,, | 14 | බොධිසමභාර්සාලු | බොධිසම්භාර්සාල |
| 30 | 19 | නිසබිවිපෙහා | නිශාබිවිපෙවා |
| ,, | 34 | හිශුනු | හිශුණු |
| 35 | 15 | ආපාද | ආපද |
| ,, | 19 | ආපාද | ආපද |
| 36 | 22 | ප්‍රාසාදයෙන් | ප්‍රසාදයෙන් |
| 39 | 16 | නොවාවූ | නොඅව වූ |

මෙහි නවත් අච්චුනසන්නන්ගේ ප්‍රමාදයෙන් වූ යම් දොසක් ඇත්නම් එද පරීක්ෂා කොට අභිඥාවබොධ කටයුතු

# THE

# PAJJA MADHU:

## PĀLI POETRY

## WITH

## REAL TRANSLATION IN SINHALA.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

රත්නත්‍රයගුණානුස්මරණය හා සර්වසත්ත්වහිතපරිණාමය යම්හෙයකින් සර්වඥගුණාධිගමයට මූලකාරණ ද එහෙයින් ඒ රත්නත්‍රයගුණානුස්මරණමුඛයෙන් සත්ත්වහිතාශිංසනය ද ඒ සත්ත්වහිතාශිංසනාමුඛයෙන් රත්නත්‍රයගුණානුස්මරණය ද ඒකවාක්‍යප්‍රයොගයෙන් කරණු පිණිස ඉතරරත්නද්වයට ද බුද්ධරත්නය ප්‍රධාන හෙයින් ඒ බුද්ධරත්නයාගේ ද රූපකායධර්මකාය දෙකින් රූපකාය ධර්මකායට අධිෂ්ඨාන හෙයින් පළමු කොට රූපකාය අනුස්මරණය කොට ඒ අනුස්මරණකුශලය සත්ත්වයන්ට පිරිනමා එයින් හිතාශිංසනවශයෙන් මෙත් කරන්නානු ‘උණ්ණාපුණ්ණ,’ යනාදීන් නඛයෙහි පටන් කියුනු. *

---

* කුමක්හෙයින් නඛයෙහි පටන් කියුද, මහාපුරුෂලක්ෂණදෙශනා කරණ සර්වඥයන්වහන්සේ විසින් ‘සුප්පතිට්ඨිතපාදො,’ යනාදීන් පාදලක්ෂණය පටන් දෙසිත බැවින් තදනුවර්තීනයෙන්ද ‘දෙවතානාං රූපං පාදඞ්ගුෂ්ඨප්‍රභෘති වර්ණ්‍යතෙ මානුෂාණං කෙශාදාරභ්‍යෙති ධාර්මිකාඃ,’ යන අප්තවචනානුවර්තීනයෙන් ද විශුද්ධදෙවවූ සර්වඥයන්වහන්සේගේ රූපකායවර්ණනා කරණුවන් විසින් නඛයෙහි පටන් වර්ණනා කරණ ලද්දේ යුක්තතරහෙයිනි —— එබැවින් මේ ග්‍රන්ථයෙහි සර්වඥයන් වහන්සේගේ රූපකාය නඛපඞ්ක්තියෙහි පටන් කෙතුමාලාව අවසන් කොට වර්ණනා කරමින් උක්තක්‍රමයෙන් මෙත් කරණලදී, ඒ ගාථා හැට නවයකින් නිෂ්පන්නයි.

පදාර්ථසහිත

# පජ්ජමධුව.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

උණ්ණාපපුණ්ණ සසිමණ්ඩලතො ගලිත්වා
පාදඞ්ගුලිදලස් සුධාලවානං
පන්තීව සන්තනඛපන්ති පජා විසෙසං
පීණෙතු සුද්ධසුඛිතං මනතුණ්ඩපීතා—1.

උණ්ණ - ඌර්ණමණ්ඩලය වැනිවූ (දේහෝ නොහොත්) ඌර්ණමණ්ඩල නැමැති; පපුණ්ණ - ප්‍රකාරයෙන් පිරුණාවූ (නොහොත්) ක්‍රමයෙන් කලා ස්වාභාවයෙන් හෝ ප්‍රකෘතිවත්‍යා මෙන් සඳුවින් නොව සදාසර්වාසීවශයෙන් හෝ ප්‍රකාරයෙන් පිරුණාවූ; සසිමණ්ඩලතො, චන්ද්‍රමණ්ඩලයෙන්; ගලිත්වා, ගිලිහී; පාදඞ්ගුල - පාදයට බඳු පද්මයෙහි (දේහෝ නොහොත්) පාදනැමැති පද්මයෙහි; අඞ්ගුලිදලස් - අඞ්ගුලියට බඳුවූ පත්‍රයෙහි පිහිටි යාවූ (දේහෝ නොහොත්) අඞ්ගුලිනැමැති පත්‍රයෙහි පිහිටියාවූ; සුධාලවානං, අමෘතබිඳුන්ගේ; පන්ති, ශ්‍රේණියොමෙව්; සන්තනඛපන්ති ඉව, ශාස්තෘනුගේ නඛශ්‍රේණිය වැනිවූ (නොහොත්) සුධාලවානං පන්ති ඉව, අමෘතබිඳුන්ගේ පන්තියක් මැනිවූ; සන්තනඛපන්ති, ශාස්තෘනුගේ නඛශ්‍රේණි තොමෙව්; සුද්ධසුඛිතා, හුදු සුඛිත කොට; මනතුණ්ඩපීතා, මනතුඩින් බුවාවූ; පජා, සත්වයන්; විසෙසං, අත්‍යර්ථයෙන්; පීණෙතු, පිණවාවා (නොහොත් උභයපත්තිය ම) මනතුණ්ඩපීතා, මනඃප්‍රේර්තවූ තුඩින් බොනලද්දී (දේහෝ නොහොත්) සිත් නැමැති තුඩින් ආලම්බනරසාස්වාදනවශයෙන් බොනලද්දී; පජාවිසෙසං, වශකාරබවූ (දේහෝ නොහොත්) පවිත්‍රවූ සත්වවිශේෂයා (නොහොත් උභයපක්ෂයෙහි ම) අවිශේෂයං පජං, සමස්තසත්වයා; සුද්ධසුඛිතං, ක්ෂුත්පිපාසාජරාරෝගාදි දුඃඛයෙන් මිදුනොවීමෙන් හුදු සුඛයට පැමිනියනු (නොහොත්) සුඛ, වාතපිත්තාදි දෙෂවිගමනයෙන් (දේහෝ නොහොත්) රාගාදි දෙෂවිගමනයෙන් ශුද්ධව; සුඛිතා, අජරාමරසුඛයෙන් (දේහෝ නොහොත්) අමෘතමහානිර්වාණසුඛයෙන් සුඛිතවූනු (නොහොත්) සුඛිත කොට; පීණෙතු, පිණවාවා —— තත්තවස්තු සාදෘශ්‍යවූ තත්තද්රූපස්ථුණ්වයවයෙහි තත්තදාකාරචින්තනවශයෙන් පැවැත්තාවූ ප්‍රසාදමයකුශලචේතනාවෝ විෂයවිෂයී දෙදෙනාගේ අභෙදෝපචාරයෙන් තත්තද්රූපස්ථුණ්වයවනාමයෙන් මෙහි කියනු ලැබෙත් කුමක් මෙන් දයත්, පඨවිකසිනාදිය විසය කළාවූ ධ්‍යානයන්ට පඨවිකසිනාදිනාමය ලැබෙන්නාක් මෙන් ඒ චෙතනාවන්ගේ ද

වැඩිත් තමන් පැවති ආරම්භයෙහි ආරොපිතකාත්‍යගුණාදීන්ට අනුරූපව සියලුසතුන්ට හිත සිඩකිරීමෙහි ද අහිත දුරු කිරීමෙහි ද ආශීංසනය මෙහි හැම නැත්ති ම ගතිය ය එහෙයින් ම ඔවුන්ගේ ඖචිත්‍යානුගතත්වය ද වන්නේයි එසේ මැයි මෙහි සමෙස් ශියලු ලොකාකාභ ලෞකික ලොකොත්තර හිතොපදෙශකත්වයෙන් ශාස්තෘභාවය ද චක්‍රාංකමණ්ඩලය සේ අතිමනොඥවූ ඌර්ණමණ්ඩලයෙන් හා පද්මතුල්‍යපාදයෙන් ශොභනාවූ වින් සකල ලොකනයනානන්දකරණසමර්ථවූ රූපශොභාසම්පන්නයක් ඇතියේ ද එබඳු කොනෙකුන්ගේ පාදනඛශ්‍රේණිය චන්ද්‍රාකොරන් ශිලිෂ්ට පද්මපත්‍රාග්‍රයෙහි හුනු අමෘතබින්දු ශ්‍රේණිතුල්‍ය ද වෙ තත්තුල්‍ය හෙයින් හා පාතව්‍යහෙයින් චක්ෂුශ්‍රොත්‍රවශොවාරිස විතෘප්තිබයෙන් බොන්නාවූ සඳවයන් ප්‍රකෘතිඅමෘතබින්දුන් මෙන් ජරාරෝගාදීන්ට නිදනවූ වාතපිත්තාදි දෙෂයන් නසා අජරාමරසුඛයෙන් පිණවීමෙහි සාමර්ථ්‍යය යුව්‍යක්තයි, මෙසේ මේ ඖචිත්‍යය අභෙදසමාරොපයෙන් තත්තම්ෂයී කුශලචෙතනාවගේ වනාහි රාගාදිදෙෂයනුත් නසා අජරාමරබාවූ අමෘතමහානිර්වාණසුඛයෙකුත් පිණවීමෙහි සාමර්ථ්‍යය ද ඒ ඖචිත්‍යය අනුව ම ව්‍යක්ත වන්නේයයි මෙසේ මේ ආරොපිතඋපමෙයකෘත්‍යය තත්ක්‍රියා කෙරෙහින් ආරොපණයෙන් ඒ කුශලයාගේ ඖචිත්‍යානුගතත්වය දතයුතු.

භින්නාය මාරරිපුනා පරිවත්ත්‍ය සත්තු
පාදස්සයා ජිතදිසාය සිතප්ඵලාය
යා ජෙති කබනසරවලියා සිරිංසා
දෙතඞ්ගිනං රොජයඞ්ගුලිපන්ති කන්තා—2.

යා, යම්සක් තෙමෝ; මාරරිපුනා, මාරශත්‍රුහු විසින්; භින්නාය, බිඳුනා ලද; පරිවත්ත්‍ය, පෙරළී (හෙවත්) ශෙෆාලිකාමුකුලාදී පුෂ්පවෙශයෙන් හෝ මාරයාහට විමුඛව හෝ පෙරළී; සත්තුපාදස්සයා, ශාස්තෘනුගේ පාදයන් ආශ්‍රය කිරීමෙන්; ජිතදිසාය, පරදවනලද එම මාරශත්‍රුහු ඇති; සිතප්ඵලාය, සුදුවූ ඵලඇති; කබනසරවලියා, රත්හිඳඹුපෙළෙක්හි; සිරිං, ශොභාව; ජෙති, ජය ගණී ද (හෙවත්) පරදවා ද; කන්තා, මනොඥවූ; සා අඞ්ගුලිපන්ති, ඒ අඞ්ගුලිශ්‍රේණි තොම; අඞ්ගිනං, සත්ත්වයන්ට; රජොජයං, යුධයෙහි ජය (දෙව්හෝ නොහොත්) පාපජය; දෙතු, දේවා — මාරයාගේ ආයුධවර්ෂා වැස්වීමෙන් කළාවූ යුධයෙහි ඒ ආයුධතාක් බිඳුන් කරා පැමින කිසිවක් මල්වෙසින් පෙරළී ශ්‍රීපාද සමීපයෙහි හුනුවා ද කිසිවක් මාරයාට ප්‍රතිපක්ෂව ඔහු විදින්ට මෙන් ආපස්සෙහි පෙරළී පාදසමීපයෙහි හුනුවා ද දක ඒ යුධයෙහුත් ඔහු පැරදීහෙයින් තමවෙශතද්කාරයෙන් පෙරළී ශ්‍රීපාදභජනය කිරීමෙන් මාරයා පරදවා ශාස්තෘහට ජයගෙණ දුන් නානු නම් වෙත් නුයි— "පරිවත්ත්‍ය සත්තු පාදස්සයා ජිතදිසාය" යි කියන ලදි — මේ ප්‍රකාරයෙන් ද වැලිත් අඞ්ගුලිශ්‍රේණිය කාන්තනො ද තම [illegible]

නාමුඛයෙන් ම සෑශව විසිරපරාගය ද අනුස්මරණය කෙරෙති, මත්තෙහි ද මෙබඳු තන්හි මෙසේ ම ගුණ විශෙෂයන් සිතියයුතු — අනිකුත් ධ නාමාඛ්‍යාත ශබ්දයන් ඈතද සත්‍ය ශබ්ද ප්‍රයොගය ඉන්ද්‍රාචාර්‍ය්‍යාගේ ඕ. විනනු වටිය පිණිසයි, එසේමැයි යමෙක් උපදෙශානුශාසනාවෙන් ශාසනා ද එ කිදුකෙනෙකුන්ගේ අඹුතුව පාදගර්තනය කළ කෙනෙකුන් ශත්‍රු පරාජය කොට ජය ගෙණ දිමෙහි සමර්ථ ද වෙති, එවැන්නවුන් ද පරදවා සිටි නාවූ නිරන්තරයෙන් ශාසනානුපාදගතනයන් ශත්‍රු පරාජය කොට සියලු සතුන්ට ජය ගෙණ දිමෙහි සමර්ථ වෙති යනු කියනුව කිසිමක් දුසිනමය වනහෙයින් උචිත ම වේ — උපමානකාතනය උපමෙයයා කෙරෙහි ආරොපණය ද උපමෙය නිශ්‍රිතනාගේ ඔචිතානුගතාඩිය ද මෙතැන පටන් හැමතැන්හි ම ආදිගාථායෙහි උක්තානුක්‍රමයෙන් ම දතයුතු.

සොවණ්ණවණ්ණ සුඛුමච්ඡවි සොම්මකුම්ම
පිට්ඨිව පිණ්හී කමතුන්නතානි භාති යෙසං
තෙ සුප්පතිට්ඨිත සුකොමල දීඝපණ්හී
පාදා ජිනස්ස පදදන්තු පදං ජනස්ස—3.

යෙසං, යම් පාදකෙනෙකුන්ගේ; පිණ්හී, පාෂ්ණී නොම; සොවණ්ණවණ්ණ-රන්වන්වූ; සුඛුමච්ඡවි-සියුම්වූ ඡවි ඇත්තී (නොහොත්) රන්වන් සියුම් ඡවියෙන්; සොම්ම-මනොඥවූ; කුම්මපිට්ඨි ඉව, කූර්මපෘෂ්ඨියක් මෙන්; කමතො උන්නතානි, කැමියෙන් උන්නතියක් ඇතිව; භාති, බබලා ද; ජිනස්ස, සර්වඥයාගේ; තෙ, ඒ; සුප්පතිට්ඨිත-භූමියෙහි හැමතැන ම මනාව පිහිටන්නාවූ; සුකොමල-ඉතා ම කොමලවූ; දීඝපණ්හී; දික්වූ විලුම් ඇති; පාදා, ශ්‍රීපාදයෝ; ජනස්ස, සත්ත්වසමූහයාට; පදං, තමන් ප්‍රාර්ථනා වස්තු හෙයින් තමන් යේ ම පිහිටක්; පදදන්තු, දෙත්වා (නොහොත්) නිර්වාණපදය දෙත්වා.

අච්ඡෙරපඞ්කජසිරිං සිරියා සකාය
යෙ මද්දිතාවිය චරන්ති සරොජසිසෙ
සඞ්ඛිත්තාවිය ච භාන්ති පරාගරාගා
තෙ හීරජා මුනිපදා පදදන්තු ලක්ඛිං—4.

අච්ඡෙරපඞ්කජසිරිං, ප්‍රභාණකාලයෙහි සමුත්පිතවූ ආශ්චර්ය්‍යපද්මයන්ගේ සොභාව; සකාය සිරියා, ස්වකීය ශොභායෙන්; මද්දිතාවිය ච *, මද්දිතාවුන් මෙන් ද (හෙවත්) යටකරන්නවුන් මෙන් ද; පරාගරාගා, අනිකෙකු කෙරෙහි පැවති අභිලාෂයෙන් (හෙවත්) තදති නමිතු ශරාශිහෙයින් හෝ ස්වාතුරසතාවූ ස්වශ්‍රිය හා සදෘශහෙයින් හෝ ඒ තමා කෙරෙන් අනන්‍ය

* මදදිතො විය, මද්දිතාවිය, මඩනාවුන් මෙන්ද-කියා ඇතම් පොතක පැණේ.

වූ ආශ්‍රව ශ්‍රීපද්මශ්‍රිය කෙරෙහි පැවැත්තාවූ අභිලාෂයෙන්; තානි, ඒ ශ්‍රීපති
තාවූ ආශ්‍රයශ්‍රීපද්මයන්; සංචුම්බිතා විය ච, සිඹිනාවුන් මෙන් ද (නොහොත්)
පරාගරාගා, ප්‍රකෘතියෙන් අනුරාග ඇත්තාවුන් කෙරෙහි අනුරාගයෙන්; තා
නි; ඒ සඤ්ජාතරාගයන්; සංචුම්බිතා විය ච, සිඹිනාවුන් මෙන් ද (නොහොත්)
පරාග, ප්‍රකාශිතවූ හෝ නීලපීතාදි ප්‍රකාරවත්වූ හෝ වර්ණයෙන්; රාගා, රඤ්ජ
නය හෙතු කොට ගෙණ (හෙවත්) රඤ්ජනය පිණිස; තානි, ඒ නීලාදිව
ර්ණවත් පඞ්කජයන්; සංචුම්බිතා විය ච, සිඹිනාවුන් මෙන් ද (නොහොත්)
පරාග, නීලාදි ප්‍රකාරවර්ණයන් ඇති ඒ පද්මයන් මෙන්; රාගා, එසේ ම නා
නාවර්ණයෙන් වර්ණවත්වූවාහු; තානි, ඒ නානාවර්ණවතුන්; සංචුම්බිතා විය
ච, සංයොගයෙහි සමාන ධාතුකයන් බවු නොවුන්ට කාරණ සාදරයක්
මෙන් සිඹිනාවුන් මෙන් ද (නොහොත්) පරාගරාගා, තමන් රේණුරහිත
හෙයින් පුෂ්පරේණුයෙහි අභිප්‍රායයෙන්; තානි, ඒ පරාගවත් ආශ්‍රයශ්‍රීප
ද්මයන්; සංචුම්බිතා විය ච, සිඹිනාවුන් මෙන්ද; යෙ, යම්කෙනෙක්; සරොජශ්‍රී
යෙ, පියුම් ශ්‍රීහු තෙති; චරන්ති, හැසිරෙද්ද; නීරජා, රජස්රහිතවූ (දේ‍රාහා
නොහොත්) ජලජවූ ජලජයන් වැනිවූ; තෙ මුනිපදා, ඒ සර්වඥපාදයෝ;
ලක්ඛිං, තමන් කෙරෙහි පිහිටියාවූ ශ්‍රිය (නොහොත්) ලෞකිකලොකො
ත්තර සම්පත්තීන්; පදදන්තු, ප්‍රකාරයෙන් දෙත්වා— මෙයින් ම ගමනෙ
හි පැවති ආශ්‍රයශ්‍රීයන් හා ශරීරයෙහි රජස් නො ඇලෙනනියාවත් සිහි
කෙරෙත්.

ආගාමිකාල ජනමඞ්ගලහත්ථභාවං
ඛ්‍යාතන්තමත්ථ කුසලෙහිව නිම්මිතානි
යත්‍රාසුමඞ්ග සතමඞ්ගල ලක්ඛණානි
සාධෙන්තු තං පදයුගං ජයමඞ්ගලානි—5.

ආගාමිකාල-එන්නාවූ කාලයෙහි; ජනමඞ්ගලහත්ථභාවං, ජනයාගේ පූජා
විසින් කරණ මඞ්ගලට ආධාර බව (නොහොත්) ජනාභිවෘද්ධිකාරණයක් ම
භජනය කරණ බව; අත්‍ර, මේ ලොකයෙහි; ඛ්‍යාතන්තුං, ප්‍රකාශකරණු
පිණිස; කුසලෙන, මාපනයෙහි දක්ෂයන්නු විසින්; නිම්මිතානි ඉව, මවන
ලද්දවුන් වැනිවූ (නොහොත්) අත්‍ර, මේ ලොකයෙහි; ඛ්‍යාතන්තුං ඉව,
ජනමඞ්ගලහත්ථභාවය ප්‍රකාශ කරණු පිණිස මෙන්; කුසලෙන, කුශල
කර්මය විසින්; නිම්මිතානි, මවනලද්දවූ; අසීත මඞ්ගලලක්ඛණානි, අ
ෂ්ටොත්තරශතමඞ්ගල ලක්ෂණයෝ; යත්‍ර, යම් ශ්‍රීපාදමණ්ඩලයෙක් හි; ආසුං,
වූද; තං පදයුගං, ඒ පාදයුගම්ය; ජයමඞ්ගලානි, ජයෙහි වූ මඟුල් (නො
හොත්) ජය හා මඟුල්; සාධෙන්තු, තමා කෙරෙහි මඞ්ගලසාධක චිත්තයන්
ඇතිහෙයින් සිද්ධ කෙරේවා — තදුපචාරයෙන් ගත් කුසලචෙතනාව ඉ
හලොකපරලොකයෙහි දුඃඛාපනයනය හා සුඛාභිවෘද්ධිය සාධාවා, මෙයින්
ම පූජාශී බවත් ජනාභිවෘද්ධියෙන් සමෘද්ධි බවත් සිහි කෙරෙත්.

සංසෙවිජනතුවරසන්තිපුරප්පවෙසෙ
නිච්චං සුසජ්ජිතානිව මඞ්ගලාය
යෙ තෙ දධන්ති කන්තමඞ්ගලලක්ඛණානි
වත්තන්තු තෙ ජිනපදා ජයමඞ්ගලාය—6.

සංසෙවිජනතු - භජනා කෙළාවූ ජනයන්ගේ; වර - උතුම්වූ; සන්තිපුරප්පවෙසෙ, ශාන්තිපුරයට වැදීමෙහි; මඞ්ගලාය, මඟුල් පිණිස; නිච්චං, අනවරතයෙන්; සුසජ්ජිතානි ඉව, මනා කොට සඳ තබනලද්දවුන් වැනිවූ; කන්ත-මනොඥවූ; මඞ්ගලලක්ඛණානි, මඞ්ගලලක්ෂණයන්; යෙ තෙ, යම් ඒ ශ්‍රීපාද කෙනෙක්; දධන්ති, දරද්ද; තෙ ජිනපද, ඒ සර්වඥපාදයෝ; ජයමඞ්ගලාය වත්තන්තු, තමන් මඞ්ගලසාධකචිහ්නයන් ධරා සිටිනා හෙයින් ජයමඞ්ගල පිණිස පවතිත්වා — තදුපචාරයෙන් ගත් කුසලචෙතනාවෝ අපාදක් ජයගැන්ම පිණිස හා ස්වර්ගාපවර්ගසුඛාභිවෘද්ධි පිණිස වෙත්වයි යේයි — මෙයින් යම් කෙනෙක් තමන් භජනය කෙරෙද්ද ඔවුන් ශාන්ති භජනය කරණනියාව ද සිහි කෙරෙත්.

සබ්බාභිභුය සපදෙසු නිපාතනස්ස
සඤ්ඤාණකං විය යදඞ්කිතසබ්බලොකො.
පාදා තෙ ධොකතතිලොකසිරොවිතාපි
ලොකං පුනන්තු ජයමඞ්ගලකාරණානි—7.

යදඞ්කිත - යම් ශ්‍රීපාද කෙනෙකුන් අඞ්කිතවූ නිසා පැවැත්තාවූ; සබ්බලොකො; සියලු ලොකය තෙම (හෙවත්) සියලු ලොකයාගේ රූපය තෙම; සබ්බ අභිභුය, සියල්ලවුන් අභිභවනය කොට; සපදෙසු, සර්වඥයන් තමන් පාපිට; නිපාතනස්ස, හෙළා ගැන්මට; සඤ්ඤාණකං විය, කුශලාචාර්‍ය්‍යයා විසින් කරණලදසලකුණක්වැනි ද; තෙ පාද, ඒ ශ්‍රීපාදයෝ; ධොකතතිලොකසිරොවිතපි, ඒ සඤ්ඤාණභූතවූ ව යටකරණලද තුන් ලෝවැසීන්ගේ උතුම් උත්තමාඞ්ගයන් ඇත්තාහු; ජයමඞ්ගලකාරණානි, ජයමඞ්ගලයට කාරණවූවාහු; ලොකං පුනන්තු, ලොකයා පවිත්‍ර කෙරෙත්වා — මෙයින් මානදර්පිත සියල්ලවුන් තමන් පාපිට හෙලා ගැන්ම ද එයින් ම ඔවුන්ට වන ශ්‍රේයස් ද සිහි කෙරෙත්.

ලොකත්තයෙකසරණත්තවිභාවනාය
සජ්ජොව තිට්ඨති යහිං සුවිභත්තලොකො
තං සබ්බලොකපටිබිම්බිතදප්පණාභං
පාදද්වයං ජනසුසජ්ජනහෙතු හොතු—8.

යහිං, යම් ශ්‍රීපාදද්වයෙක්හි; සුවිභත්ත-මනා කොට විභාග කරණලද මනාව විභාගවත්වූ; ලොකො, ලොකතෙම; ලොකත්තය-තුන්ලෝවාසීන්ට; එකසරණත්ත-සර්වඥයන්ගේ අසහායසරණභාවය; විභාවනාය, ප්‍රකාශ කරණු පිණිස; සජ්ජො එව තිඨති, සැරහුනේම සිටි ද (නො

හොත්) සරෝජානීති ඉව, පැරණි පියුම් වැනි ද; සබ්බලොකපටිබිම්බිත සියලු ලොකයා විසින් පිළිබිඹු දෙනලද සියලුලොකයාගේ ප්‍රතිබිම්බය හුනුවා වූ; දප්පණානං, දර්පණයන් හා සදෘශවූ; තං පාදයුගං, ඒ ශ්‍රීපාදයුග්මය; ජනස්සලජ්ජනහෙතු හොතු, තමා දර්පණයි හෙයින් ජනයාගේ මනාව සැරසීමට කාරණ වේවා — මෙයින් සියලුලොකයාහට අසහාය පිහිට බව සිහි කෙරෙත්.

මෙසේ සාමාන්‍යයෙන් පාදයෙහි මඞ්ගලලක්ෂණසමූහයින් ශුභාශිංසනාව ගාථායෙන් සත්ත්වයන් කෙරෙහි මෙන් පතුරුවා දැන් ඔවුන් ම අවයවවශයෙන් සංවර්ණනය කරන්නානු ප්‍රධාන වූ චක්‍රලක්ෂණය ආදි කොට කියා ඒ වටා සිටි ලක්ෂණසමූහයින් සංවර්ණනය කෙරෙත්—

ලොකුත්තරාය සිරියාධිගමාය සුද්ධු
රජ්ජන්ති යත්ථ දිගුණා නිව පාතුභූතා
චක්කා සනාභිසහනෙමිසහස්සරානි
තෙඞ්ඝී දිසන්තු සකලිස්සරියං ජනස්ස—9.

සනාභි-නාභිසහිතවූ; සහනෙමිසහස්සරානි, නෙමි හා දහසක් දහසක් දැවි සහිත වූ; චක්කා, චක්‍රයෝ දෙදෙන; ලොකුත්තරාය සිරියාධිගමාය, ලොකොත්තරශ්‍රීයගේ පැමිනීම පිණිස; දිගුණානි පාතුභූතා ඉව, ලෞකිකශ්‍රීයගේ පැමිනීම පිණිස එකක් පහළවූ හෙයින් දියුණුව උතුරුවූ පහළවූව වුන් මෙන්; යත්ථ, යම් පාදයෙක්හි; සුද්ධු, අතිශයින්; රජ්ජන්ති, බබලද්ද; තෙඞ්ඝී, ඒ පාදයෝ; ජනස්ස, සත්ත්වයාට; සකලිස්සරියං, සියලු ලොව්ලොවුතුරු ඉසුරු; දිසන්තු, ඓශ්වර්‍ය්‍යකාරණවූ චක්‍රයන් තමා කෙරෙහි පවත්නා හෙයින් දෙත්වා — මෙයින් ලොකොත්තර සියලු ගුණ විශේෂයට පැමිණියාව ද සිහි කෙරෙත්.

යත්‍රුල්ලසන්ති දුවිධානිව පාතුභූතා
ධම්මස්ස සබ්බභුවනස්ස ච ඉස්සරත්තා
චක්කානි ඡත්තසදිසානි සුදස්සනස්ස
තානජ්ජ ජන්තුසරණා චරණානි හොන්තු—10.

ධම්මස්ස, ධර්මයට ද; සබ්බභුවනස්ස ච, සියලු ලොකයාහට ද; ඉස්සරත්තා, ඉසුරු බැවින්; දුවිධානි පාතුභූතා ඉව, ද්විප්‍රකාරව පහළවූවාක් වැනිවූ; සුදස්සනස්ස, සුදසුන්සක්විතිනුගේ; ඡත්තසදිසානි, ඡත්‍රය හා සදෘශවූ; චක්කානි, චක්‍රයෝ දෙදෙන; යත්‍ර, යම් චරණයෙක්හි; උල්ලසන්ති, නැවූනානු ද; තානි චරණානි, චක්‍රවත් ඒ චරණයෝ; අජ්ජ ජන්තුසරණා හොන්තු, එසමයෙහි චක්‍රවර්ත්‍ය සත්ත්වයන්ට පිහිටවූවාක් මෙන් දැන් සත්ත්වයන්ට පිහිට වෙත්වා (නොහොත්) අනන්තරායසංක්ලේශාදිය නසත් වා — මෙයින් ධර්මාධිපතිබව ද ලොකාධිපතිබව ද පූර්වචරිතාද්භූතයක් ද සලකත්.

# පජ්ජමධුව.

සබ්බඤ්ඤු වච්ඡතු සිරි සිරිවච්ඡකෙන
සොවත්ථි සොත්ථිමනු භිස්තු පුග්ගලෙසු
නන්දිං ජනානමනුවත්තතු නන්දිවත්ති
සියානලං කුරුතු පාදවතංසකොපි—11.

සිරිවච්ඡකෙන, ශ්‍රීවත්සාඛ්‍ය කාරණ කොට ගෙණ; සිරි, ශ්‍රීතොමෝ; සබ්බඤ්ඤු, රූපාදිපංචකාමගුණයි යසාතුයන් කෙරෙති; වච්ඡතු, වෙසේ වයි; සොවත්ථි, ස්වස්ති තොම, * පුග්ගලෙසු, දීක් අනුනව කාන්තවුන් කෙරෙහි; සොත්ථිං, සමෘද්ධියක් සුව ඇතිබවක් සභාන ක් හෝ; අනු තිඨතු, කෙරේවයි; නන්දිවත්ති, නන්දාවර්ත්තය; ජනානං, කම්පලොකයන් විසින් උපදවනලද කාමාවචරාදිකුතයන්ට; නන්දිං අනු වත්තතු, සන්තොෂය අනු ව පවතිවා (නොහොත්) නන්දිං අනු, සන්තොෂය පිණිස; වත්තතු, පව තිවා; පාදවතංසකොපි, පාදයෙහි අවතංසකය ද; සියානි, සඵෝතාවූ ත්‍රිවිධනාශිකසත්වයන්ගේ ශිඛියන්; අලං කුරුතු, තමා ශිඛාලංකාරහෙයි න් සභාවා—— නම්‍යවූ කුශලචෙතනාව කපනකපඩ්නාගදිශිඛී දෙන රඤ්ජිත කොට සරහාවා.

භද්දාය පීඨමුපගච්ඡතු භද්දපීඨං
වුද්ධිං ජනානමනු වත්තතු වඩ්ඪමානං
පුණ්ණත්තමඞ්ගිමනු කුබ්බතු පුණ්ණකුම්භො
පාතීව පාතු සතතං ජනතං අපායා—12.

භද්දපීඨං, භද්‍රපීඨය තෙම; භද්දාය, මඞ්ගල්‍ය පිණිස නිර්වාණය පිණි ස හෝ; පීඨං, ආසනවූයේ ආධාරවූයේ හෝ; උපගච්ඡතු, සත්වයන් කරා පැමිණේවයි; වඩ්ඪමානං, වර්ධමානචිහ්නය; ජනානං, සත්වයන්ට; වුද්ධිං අනු, අභිවෘද්ධිය පිණිස; වත්තතු, පවතිවයි; පුණ්ණකුම්භො, පූර්ණකුම්භය තෙ ම; අඞ්ගිං, සත්වයා; පුණ්ණත්තං, පරිපූර්ණවූ ශරීර ඇත්තාහු සිත් ඇත්තානු හෝ; අනු කුබ්බතු, කෙරේවයි; පාතිව, පූර්ණපාත්‍රය ද; අපායා, අපායෙන්; ජනතං, ජනසමූහයා; සතතං, අනවරතයෙන්; පාතු, රකීවා.

මෙසේ ශ්‍රීවත්සාදි අෂ්ට නාමයෙන් ශ්‍රව්‍ය වන්නාවූ අර්ථයට අනුරූප පරි ද්දෙන් ශිතා සිංසනය කොට මෙයින් මත්තෙහි සෘතුයගට ආකාරයට අ නුරූප කොට ආසිංසනය කෙරෙත්-

සොත්ථිකපත්ථමපනෙතුමසාතලෙපං
ඛග්ගො විභිජ්ජතු සදා දුරිතාරිවග්ගෙ
සංඛො කලඞ්කමපනෙතු සතාලවණ්ට
සංවිජ්ජනී කුමතිමක්ඛිකමොරහත්ථො—13.

---

* ස්වස්තික- ශතුද්පාඨයි,

නං සෙතාතපත්තං, සටකීයනලද ලක්ෂණවූ ඒ ශ්වේතාතපත්‍රය; ඇසාන පෙ, දුඃඛාතපයන්(නොහොත්)පාපාතපය; අපනෙතං, දුරු කෙරේ වයි; ඛග්ගො, ඛඩ්ගය නෙම; දුරිතාරිවග්ග, පාපසතුරු සමූහයන්; සදා, හැමකල්හි; ඡින්දතු, විශෙෂයෙන් සිඳිවයි; සතාලවණ්ටසංවීජනී, තාලවෘන්තයන්සහිතවූවීජනීනොවි: පංතෙලදහං, දුඃඛදහන; අපනෙතු, දුරු කෙරේ වයි; මොරහත්ථා, මියුරහස්තය නෙම; කුම්භිමක්ඛිකා, කුඹුඹී නැමැති හෝ කුත්සිතවූවීජා නැමැති හෝ මක්ෂිකාවන්; අපනෙතු, පලවාවා.

ආකඩ්ඪනො ජනවිලොචනතමභිනිතානං
වාරෙතු සබ්බගතිවාරණමඞ්කුසො සො.
පාදම්බුජස්සිරිවිලාසනිකෙතනාව
පාසාදලක්ඛණමුපෙතු මනොපසාදං—14.

ජනවිලොචනං, සත්වයන්ගේ නෙත්‍රයන්; අත්තාභිනිතානං, තමහට කොම් කොට තමා කරා; ආකඩ්ඪනො, අදනාවූ; සො අඞ්කුසො, අෂ්ටොත්තරශතමඞ්ගලලක්ෂණ ගණගතවූ ඒ අඞ්කුශය නෙම; සබ්බගති-හැමතැන්හි ගමන්ඇති හෝ පවත්හි නැමැති හෝ; වාරණං, හස්තීන්; වාරෙතු, වළකාවයි; පාදම්බුජස්සිරි-පාදපද්මයෙහි ශ්‍රීකාන්තාවට; විලාසනිකෙතනං ච, සැරසීම්ගෙයක් වැනිවූ; පාසාදලක්ඛණං, ප්‍රාසාදලක්ෂණය; මනොපසාදං, අත්මසමෘද්ධින් මනොඥහෙයින් ජනයාගේ සිත් පැහැද්වීම ද; උපෙතු; පැමිණෙන්වා (නොහොත්) එනො, * සිතෑ පසාදං, පැහැදීමට; උපෙතු, පමුනුවාවා—භාවනාවට සුදුසුහෙයින් † තමා අභ්‍යන්තරගතවූ සිත්එකත කොට පහදවා මාගීප්සියට පමුනුවාවයි සේයි.

පාණීනමිත්ථභජතං වරපුණ්ණපත්තං
සම්මා දදාතු පදනිස්සිතපුණ්ණපත්තො
පාදෙසු ජනතුමනබන්ධනදාමභූතං
දාමං දමෙතු විමලං ජනතාමනානි—15.

පදනිස්සිතපුණ්ණපත්තො, පාදශ්‍රිතවූ පූර්ණපාත්‍රය නෙම; ඉත්ථභජතං පාණීනං, තමා සෙවුනාවූ ප්‍රාණීන්ට; වරපුණ්ණපත්තං, උතුම්වූ සතුටු පඬුරක් (නොහොත්) නිර්වාණ නැමැති සතුටුපඬුරු; සම්මා, මනා කොට; දදාතු, දෙවාවා; පාදෙසු, පාදයන් කෙරෙහි; ජනතුමනබන්ධනදාමභූතං, සත්වයන්ගේ සිත් බඳනා දමක් වැනිවූ; දාමං, සුමනදාමය නෙම; ජනතාමනානි, ජනයන්ගේ සිත්; විමලං දමෙතු, මනා කොට දමාවා (නොහොත්) තමා සුගන්ධපුෂ්පසහිතදාමයක් හෙයින් ප්‍රසාදසහිත කොට හික්මවා වා රාගාදිමලරහිත කොට හෝ හික්මවාවා.

* මෙහි අංවිභක්තියට ඔකාරාදෙශයි.

† ඇතම්පොතක-භාවනාවට නිසිහෙයින්.

උණ්හීසකුප්පලමණීපදුමෙහි පාද
සංසෙවිජන්තුකරණානි විභූසයන්තු
සසොභනත්තනාවූපගතානමනග්ඝකානි
බොජ්ඣඞ්ගසත්තරතනානි දදෙ සමුද්දෙ—16.

පාද, ශ්‍රීපාදයෝ; උණ්හීසකුප්පලමණීපදුමෙහි, උණ්හීසකය උත්පල ය මාණික්‍යය පද්මය යනමොවුන් කරණ කොට ගෙණ; සංසෙවීජන්තුකරණානි, තමන් සෙවුනා ජනයන්ගේ ශරීරයන්; විභූසයන්තු, හොබවත්වයි; සමුද්දෙ, පාදයෙහි සමුද්‍රය තෙම; සසොභනත්තනාවූපගතානං, ශොභනවූ ප්‍රීතිපූරස්සරවූ නෙත්‍ර නැමැති නෞකායෙන් එලඹියවුන්ට; අනග්ඝකානි, අනගිවූ; බොජ්ඣඞ්ගසත්තරතනානි, බොජ්ඣඞ්ගයන් වැනිවූ (ඉද්ගෙ) නොහොත්) සප්තබොද්ධාඞ්ග නැමැති සත්රුවන්; දදෙ, දේවා.

උත්තුඞ්ගනිච්චලගුණ ජිතතාය නිච්චං
සෙවිච පාදසිරි නිච්ච සමුබ්බහං ච
අත්‍රාපි සක්කාභවනුබ්බහනෙ නියුත්තො
පාදස්මෙරු භවතං භවතං විභූත්‍යා—17.

උත්තුඞ්ගනිච්චලගුණ, උස්වූ ගුණයෙන් ද නිශ්චලවූ ගුණයෙන් ද; ජිතතාය, පරදවනලදබව හෙයින්; නිච්චං සෙවිච, නිරන්තරයෙන් පාද සෙවුනාක් වැනිවූ ද; පාදසිරිං නිච්චං සමුබ්බහංච, පාදශ්‍රිය නිරන්තරයෙන් උසුලන්නාක් වැනිවූ ද; පාදස්මෙරු, පාදසථමෙරු තෙම; අත්‍රාපි, මේ පාදයෙහිදු; සක්කාභවනුබ්බහනෙ නියුත්තො, ශක්‍රභවනය ඉසිලීමෙහි නියුක්තවූ යේ; භවතං, පින්වතුන්ට; විභූත්‍යා, තමා ශක්‍රපුරධාරහෙයින් සමෘද්ධිය පිණිස (නොහොත්) විශෙෂොත්‍ථාවය පිණිස; භවතං, වේවා—මෙයින් උස්වූ නිශ්චලවූ ගුණඇතිබව සිහි කෙරෙත්.

සො චක්කවාළසිඛරීප්‍රවතං සමන්තා
සබ්බූපසග්ගවිසරා ජනතං සමග්ගං
දීපා පුථූපි චතුරො ච සහස්ස ඛුද්දා
ධාරෙන්තිවපායපතමානමදත්‍වා ජනතුං—18.

සො චක්කවාළසිඛරිපි, පාදලක්ෂණ වූ ඒ චක්‍රවාටපර්වතය ද; සමග්ගං ජනතං, සියලු ජනසමූහයා; සබ්බූපසග්ගවිසරා, සියලු උපද්‍රවසමූහයෙන්; සමන්තා, තමා පරික්‍ෂෙපවස්තුවක් වැනි හෙයින් හාත්පසින්; අවතං, රක්‍ෂිවයි; චතුරො පුථුදීපාපි, සතර මහත් විපයෝද; විසහස්සඛුද්දදීපාපි, දෙදහසක් කොදිව්ද; ජනතුං, සත්වසමූහයා; අපායපතමානං අදත්වා, අපායෙහි හිය නොදී; ධාරෙන්තු, තමන් සිඟල්ලවුන්ට පිහිට වසනුන් වැනිහෙයින් දරත්වා.

සූරො පබොධයතු ජන්තුසරොරුහානි
චන්දො පසාදකුමුදානි මනොදහෙසු
නක්ඛත්තජාතමඛිලං සුභතාය හොතු
චක්කං ධජො රිපුජයාය ජයද්ධජාය—19.

සූරො, පාදලක්ෂණවූ හිරු තෙම; ජන්තුසරොරුහානි, ජනපද්මයන් ද; චන්දො, චන්ද්‍රතෙම; මනොදහෙසු, හෘදයනාම්භාගයෙහි; පසාදකුමුදානි, ප්‍රසාද නැමැති කොරවයන්ද; පබොධයතු, ප්‍රබොධ කෙරේවයි; අඛිලං නක්ඛත්තජාතං, පාදයෙහි සකල නක්ෂත්‍රසමූහය; සුභතාය, සත්ත්ව සුභ පිණිස ද; චක්කං, චක්‍රලක්ෂණය; රිපුජයාය, සතුරුජය පිණිස ද; ධජො, ධ්වජය තෙම; ජයද්ධජාය, ජයධ්වජය පිණිස ද; හොතු, වේවා.

ජෙතුං සසංසදසුදස්සන චක්කවත්ති
චක්කානුයාතලලිතං යහිමාවහෙය්‍ය
චක්කානුවත්තිපරිසාවුත චක්කවත්ති
තං වත්තතං පදයුගං ජනතාහිතාය—20.

යහිං, යම් ශ්‍රීපාදද්වයෙක්හි; චක්කානුවත්ති, චක්‍රය අනුව පැවැත්තාවූ; පරිසාවුත-පර්ෂද් විසින් පිරිවරණලද; චක්කවත්ති, චක්‍රවර්ත්තිය තෙම ජෙතුං, ජය ගන්නා පිණිස; සසංසද-පර්ෂත් සහිතවූ; සුදස්සනචක්කවත්ති, සුදර්ශනචක්‍රවර්තීන්ගේ; චක්කානුයාතලලිතං, චක්‍රය අනුව ගිය ලීලාව; ආවහෙය්‍ය, උසුලා ද; තං පදයුගං, චක්‍රය වටාසිටි පර්ෂත් චක්‍රවර්තීන් සහිතවූ ඒ පාදමණ්ඩලය තෙම; ජනතාහිතාය, එසමයෙහි චක්‍රානුගත පර්ෂත් චක්‍රවර්තීන් හැසිරෙණහැන මෙන් ජනසමූහයාහට හිතපිණිස; වත්තතං, පවතිවා —— මෙයින් පූර්වචරිතය කුත් සිහි කෙරෙත්.

පූජෙතුමාගතවතා වජිරාසනට්ඨං
ඉන්දෙන ඡඩ්ඩිතමහාවිජයුත්තරාඛ්‍යං
සඞ්ඛං පවිට්ඨමිව මාරභයා පදදො
පාදට්ඨසඞ්ඛමිහවත්තතු සන්තියා වො—21.

වජිරාසනට්ඨං, වජ්‍රාසනස්ථ වූ සර්වඥයන්; පූජෙතුං, පුදනුපිණිස; ආගතවතා, ආවාවූ; ඉන්දෙන, ශක්‍රයා විසින්; ඡඩ්ඩිත-මාරයාකෙරෙහි භයින් හෙලනලද; මහාවිජයුත්තරාඛ්‍යං, (මහත්) විජයොත්තර යයි කියනලද; සඞ්ඛං, සඞ්ඛය; මාරභයා, මාරයාකෙරෙහි භයින්; පදදො, හැකිල ගොස් සර්වඥයන් පයයටට; පවිට්ඨමිව, වැදගියාක් මෙනිවූ; පාදට්ඨසඞ්ඛං, පාදස්ථසඞ්ඛය තෙම; වො, තොප සියල්ලවුන්ට; සන්තියා, සකිත් ශාන්තීන් කරණ හෙයින් ශාන්ති පිණිස නිවන් පිණිස හෝ; ඉහ, මේ පාදයෙහි (නොහොත්) මේ ලොකයෙහි; වත්තතු, පවතීවා —— මෙයින් ම හෙතු අවස්ථායෙහිත් ශක්‍රාදීන් විසින් පූජ්‍ය බව ද ඔවුන් හැම බිය පලායන කල සඞ්ඛල ශවත් නිශ්චලව හුන්නියාවද සිහි කෙරෙත්.

සොවණ්ණවණ්ණපදයුගලං සිවභත්තභොගෙ
ඉච්ඡාබ්භූපකරණං භවතං ජනානං
කුම්භීලධීඞ්ගහිතතොව පදුස්සිතත්තා
පාදම්බුජාකරවිගාහිතු නො ප හොන්තු—22.

සොවණ්ණවණ්ණපදයුගලං; රන්වන්වූ පත්‍රයුගලය තෙම; සිවභත්තාභොගෙ, නිර්වාණ භොජනයාගේ අනුභව කිරීමෙහි; ජනානං, සත්ත්වයන්ට; ඉච්ඡාබ්භූපකරණං භවතං, රුචි එළවන අවුළු වේවයි; කුම්භීලධීඞ්ගහිත තොව, කිඹුලුන් විසින් අධිග්‍රහීතහෙයින් ම; පදුස්සිතත්තා, වෙශ්‍යා විසින් දූෂිතවූ සිත්නු; පාදම්බුජාකරං, පාදනැමැති පියුම්විලට; විගාහිතුං, බස්නට; නො ප හොන්තු, නොපොහොසත් වෙත්වා — එක් ප්‍රසාදමය කුශලයම සතුන්ට උපදවා මේ හෙතුඅශිංසනයෙන් එකාන්තනාවිපුලාශිංසනය ම කළා නම් වේ.

සත්තාපගා ජනමනොජ්මලෙ ජහන්තු
සංසොකලඤ්ඡදූභමපනෙන්තු දහා ච සත්ත
සෙලා ච සත්ත විදධන්තු ජනස්ස තාණං
ලොකප්පසිද්ධිජනනෙ භවතං පතාකා—23.

සත්තාපගා, සප්තමහාගංගාවෝ; ජනමනොජ්මලෙ, ජනයාගේ සිත්හිවූ පාපමලයන්; ජහන්තු, දුරු කෙරෙත් වයි පලවත්වයි; සත්ත දහා ච, සප්තමහාහ්‍රදයෝ ද; සංසොකලඤ්ඡදූභං, ශොකශදූභය; අපනෙන්තු, දුරු කෙරෙත්වයි; සත්ත සෙලා ච, සප්තශෛලයෝ ද; ජනස්ස තාණං විදධන්තු, ජනයාට රක්‍ෂාවක් කෙරෙත්වයි; පතාකා, පාදයෙහි පතාකාව ද; ලොකප්පසිද්ධිජනනෙ භවතං, ලොකයාගේ ප්‍රසිද්ධි* උපදවීමෙහි වේවා.

පාටඞ්කි සන්තිගමනෙ භවතූපකාරා
දූනෙත්තනොඤ්ඤ ජහතං පදචාමරං තං
සලොකලොචනමහුස්සවඋස්සිතංව
වත්තනාය තොරණමනුත්තරමඞ්ගලාය—24.

පාටඞ්කි, ස්වර්ණශිවිකා තොමෝ; සන්තිගමනෙ, සත්ත්වයන්ගේ නිර්වාණගමනයෙහි; උපකාරා භවතු, උපකාර වේවයි; තං පදචාමරං, ඒ පාදයෙහි චාමරය; අත්තනොඤ්ඤ දූනෙ, ආත්මයෙහි දුඃඛයන්; ජහතං, දුරු කෙරේවයි; සලොක-සාධුජනයන්ගේ; ලොචනමහුස්සව-නෙත්‍රමහොත්සවයෙහි; උස්සිතංව, නගනලද්දක් වැනිවූ; තොරණං, ස්වර්ණතොරණය; අනුත්තරමඞ්ගලාය, උතුම්මඟුල් පිණිස (නොහොත්) ලොකොත්තරමඞ්ගලය පිණිස; වත්තනාය, පවතීවා.

---

* ලොකයා විසින් ප්‍රසිද්ධව-දැනවී පොත්,

යස්මිං මිගින්දගතනිබ්බලාව දන්ති
දඨා නතා සිරවිදාරණපීළිතාව
නාලාගිරී කරිවරො ගිරිමෙඛලො ච
තං සීහවික්කමපදං හනතාඝදන්තිං—25.

නාලාගිරීකරිවරො, නාලාගිරි නම් හස්තිරාජයා ද; ගිරිමෙඛලො ච, ගිරිමෙඛල නම් හස්තිරාජයා ද; යස්මිං, යම් පාදයෙක්හි; මිගින්දගත-සිංහයා කෙරෙහි පැවැත්තාවූ; නිබ්බලා ඉව, නිශ්ශක්තීන් මෙන්; දඨදන්තා, දළිසාවූ මද ඇත්තානු ද; සිරවිදාරණපීළිතා ඉව, එම සිංහයා විසින් කුම්භ විදාරණයෙන් පෙළෙනලද්දවුන් මෙන්; නතා, යම් ශ්‍රීපාදයෙක්හි නැමුනා හු ද; තං සීහවික්කමපදං, එහෙයින් ම ඒ සිංහයාගේ වික්‍රමයට ආධාර වූ පාදය (නොහොත්) සිංහයාගේ අවික්‍රාන්තිය ඇතිහෙයින් සිංහවික්‍රම ඇත්තානුගේ හෝ පාදය; අඝදන්තිං, පාපදන්තී හු; හනතං, නසාවා; (නොහොත්) දුඃඛදන්තිං, දුඃඛදන්තී හු; හනතං, නසා වා—මෙයින් නාලාගිරිදමනය ද සිහි කෙරෙත්.

පාපාහිනො හනතු පාදසුපණ්ණරාජා
ව්‍යග්ඝාධිපො කලිජනෙ අදයං අසෙසං
වාලාහ අස්සපති සම්පතිතුං අදත්වා
පායෙසු පාපයතු සන්තිපුරම්පජායො—26.

පාදසුපණ්ණරාජා, පාදයෙහි ගරුඩරාජ තෙම; පාපාහිනො, පාපොරගයන්; හනතු, නසාවයි; ව්‍යග්ඝාධිපො, ව්‍යාඝ්‍රරාජ තෙම; කලිජනෙ, කිලුටු නැමැති පරාජය නැමැති හෝ ජනයන්; අසෙසං, නිරවශෙෂයෙන්; අදයං, කාව යි; වලාහ අස්සපති, වලාහක අශ්වරාජ තෙම; අපායෙසු, අස්ථානයෙහි සතරපායෙහි හෝ; සම්පතිතුං අදත්වා, වැටීයනොදී; සන්තිපුරං, ශාන්තිපුරයට; පජායො, සත්වයන්; පාපයතු, පමුනුවා වා.

ඡද්දන්තදන්තිලලිතං ගලිතං රුසම්භා
ලුද්දෙත්තදූභිනි දිසෙ අචලං දධානො
පාදෙභහත්ථිපති සම්පති ජන්තුතාසෙ
තාසෙතු භාසමපරංදිසතං සතාණං—27.

අත්තදූභිනි, තමහට වැරැද්දවූ; දිසෙලුද්දෙ, සතුරු වැද්ද කෙරෙනි; රුසම්භා ගලිතං, රොෂයෙන් මුතවූ; අචලං, එහෙයින් ම නිශ්චලවූ (හෙවත්) රොෂයෙන් වෙවුළුමක් නැත්තාවූ; (නොහොත්) අචලං, පර්වතයක් මෙන් ධෛර්‍ය්‍ය ගුණයෙන් යුක්තවූ; ඡද්දන්තදන්තිලලිතං, ඡද්දන්තහස්තීහුගේ ලීලාව; දධානො, ධරන්නාවූ (හෙවත්) නිශ්චලවූ; පාදෙභහත්ථිපති, පාදස්ථ වූ හස්තිරාජ තෙම; සම්පති, දැන් (හෙවත්) ඡද්දන්තහස්තීනු එසමයෙහි තමා සතන රොෂය ද වැද්දසතන විතොනාත්‍රාසය ද දුරුකළාක්මෙන් ද නැවත අනුරමග උපද්‍රවයක් වැද්ද නොදී නුවරට වහාපමුනුවන

(ලදීත් ද) දල සපා දීම් වශයෙන් ත්‍රාණසහිත වූ තුෂ්ටිකාරණය දුන්නාමෙන් ද ඔහුගේ ලීලාව දරන්නාවූ මේ පාදයෙහි ඇත්රජ දන්; ජනතුතාසෙ, සත්ත්වයන්ගේ විත්තත්‍රාසකාරණ වූ රෝෂයන් (නොහොත්) විත්තත්‍රාසයන්; නාසෙතු, බවා පලවාවයි සත්ත්වසන්තානයෙහි පැවැත්ත නොදී දුරු කෙරේවයි; අපරං, එයින් අන්‍යවූ; සතාණං, රක්ෂාසහිතවූ තිවන්සහිත වූ හෝ; හාසං, තුෂ්ටියක් තුෂ්ටිකාරණයක් හෝ; දීසතං, දෙවා—විත්තත්‍රාසය ප්‍රතිඝවිඝාතයෙන් වනහෙයින් කාරණයෙහි ඵලෝපචාරයෙන් ත්‍රාසකාරණවූ රෝෂයත් ත්‍රාස යයි කියනලදී, හාසං, යනු ද මෙසේමැයි, හසන්ති එතෙනාති හාසො, යනු හෙයින් හෝ තුෂ්ටිකාරණද ගතයුතු හසතීනු විෂයෙහි උචිත හෙයින් නාසෙතුයි ප්‍රයොග කරණලද, නාසෙනොතා පලාපෙතු යන අර්ථයෙහි, නාසෙතු, යි පදසිඞ් දතයුතු.

සබ්බඞ්ගිනො චරණුපොසථහත්ථිරාජා
පාපෙතු සබ්බචතුදීපිකරජ්ජලක්ඛිං
කිත්තීව පාදපරිචාරිකතානියුත්තා
කෙලාසසෙලපටිමා සිතමාචරෙය්‍ය—28.

චරණුපොසථහත්ථිරාජා, පාදයෙහි උපෝසථහස්තිරාජ තෙමේ; සබ්බචතුදීපිකරජ්ජලක්ඛිං, සියලු සතරමහත් විපයෙහිවූ රාජ්‍යශ්‍රීයට; සබ්බඞ්ගිනො, සියලු සත්ත්වයන්; පාපෙතු, පමුනුවාවයි; කිත්ති, කීර්තිය; පාදපරිචාරිකතානියුත්තා ඉව, පාදපරිචර්‍ය්‍යායෙහි නියුක්තායක් වැනිවූ; කෙලාසසෙලපටිමා, කෛලාසපර්වතප්‍රතිමාව; සිතං, හිනායක්; ආචරෙය්‍ය, කෙරේවා.

සාමිස්ස හංසසමයෙ දහපාසබද්ධ
මාසීනවෙසගමිකො විය පාදහංසො
නිඝොසගතනිජ්ජිතතො විය මූගපොතො
වාරෙතු සබ්බජනතා භවගන්තුකන්තං—29.

සාමිස්ස, ලොකස්වාමීහුගේ; හංසසමයෙ, හංස වූ කාලයෙහි; දහපාසබද්ධ—විල්හි මලබැඳි; ආසීනවෙසගමිකො විය, හුන්වෙස් ගනවන්නක්හු වැනිවූ ද; නිඝොසගතනිජ්ජිතතො, ඒ ස්වාමීහුගේ කණ්ඨස්වරයෙන් හා පාදගමනයෙන් පරදවනලද හෙයින්; මූගපොතො විය, ගොළුපිළවූවක් වැනිවූ ද; පාදහංසො, පාදයෙහි හංස තෙම; සබ්බජනතා—සියලු ජනසමූහයාගේ; භවගන්තුකන්තං, සංසාරගතිය; වාරෙතු, චලනාවා—ගතිවිරහිත වූ රූපයෙහි ප්‍රසාදයෙන් උපන්නාවූ කුශලය විපාක දෙන්නේ තමා පැවැති ආලම්බනයා මෙන් සත්ත්වසන්තානයාගේ සංසාරගතිනිවාරණබ්‍යවූ විපාක දෙවයි යනු භාවයි.

ඔභාය දිබ්බසරසිං බිලලොකසබ්බ
රම්මඞ්ගවාපිමවගාහිතවාච පාදෙ
ඒරාවණො කරිවරො මනසාභිරූළ්හො
ජනෙතු පූරිතදපූරං ජායතංව සීඝං—30.

දිබ්බසරසිං, එනම දිව්‍යලොකවිභූතිය ඇතිහෙයින් දිව්‍යනටාකය; ඔහාය, හැර; අඛිලලොක-සම්පත්ලොකයෙහි; සබ්බ-සියල්ලෙන් සියලු වස්තුවිභූතීන්; රම්ම-සිත්කලුවූ; අඞ්ඝිවාපිං, පාදනැමැති විල්ලට; අවගාහිතවා ඉව, බටුවාක් වැනිවූ; පාදෙ එරාවණො කරිවරො, පාදයෙහි ඓරාවණ නම් හස්තිරාජ තෙම (හෙවත්) තද්පවාරයෙන් තම්ඹය කුශලය තෙම; මනසාභිරූළෙහ ජනතු, සිතින් නැඟවුන්ගේ දූරාරොහයෙන් මත්වන හෙයින් සිතින් නැඟාවූ ජනයන්; පුරින්දදපූරං, ශක්‍රපුරයට; සිඝං එව, වහා ම; නයති, පමුනුවා වා ——රූපයට සත්‍වයාගේ නැඟීම නම් සිතින් රූපය අරමුණුකිරීම් වශයෙන් ද කුශලයට නැඟීම නම් සිතින් නැවත නැවත ආසෙවනය කිරීම් වශයෙන් ද වේනුයි, උභයපක්‍ෂය ම ශ්ලෙෂ කොට ලොකව්‍යවහාරකථනවශයෙන් 'මනසාභිරූළෙහ' යනු.

හිත්වා ස කාමභවනම්භිනිසෙවනත්ථ
මාගම්ම රම්මතරතායිහ නිස්සිතොව
පාලෙතුමුනි පදවාපිතරඞ්ගභඞ්ගි
මයි කාරෙනාභිතනුවාසුකිනාගරාජා—31.

අඞ්ඝිනිසෙවනත්ථං, ශ්‍රීපාදසෙවනය පිණිස; ආගම්ම, අවුත්; රම්මතරතාය, ස්වකීය භවනයට වඩා අතිශයින් සිත්කලුහෙයින්; සකම්භවනං හිත්වා, ස්වකීයවූ නාගභවනය හැර; ඉහ, මේ පාදයෙහි; නිස්සිතො ඉව, නිබද්ධවාසවශයෙන් ආශ්‍රය කළාක් වැනිවූ; පදවාපි-පාද නැමැති පස්පියුමෙන් සැදුනාවූ මහාසයකුම්හි උපසම්පන්නවූ තටාකයෙහි; තරඞ්ගභඞ්ගිං, තරඟලීලාවක්; අභිකරෙනතතනු, ගිවිස්නාවූ ශරීරයක් ඇති (හෙවත්) තරඟයන් වැනි ශරීරයක් ඇති; වාසුකිනාගරාජා, වාසුකිනම්නාගරාජ තෙම; අමුනි, මේ භූතයන්; පාලෙතු, විශෙෂයෙන් රකීවා (නොහොත්.) අපායාදි දුඃඛයෙන් රකීවා.

නාථස්ස කඤ්චනසිඛාවලජාතිලීල
මාවිකරංව පදනිස්සිත මොරරාජා
තං ධම්මදෙසනරවෙනිව ලුද්දකස්ස
ලොකස්ස පාපඵණිනො හනතං අසෙසං—32.

නාථස්ස, ලොකස්වාමීහුගේ; කඤ්චනසිඛාවලජාතිලීලං, සුවර්ණ මයූරජාතියෙහි ලීලාව සොභාව; ආවිකරං ඉව, ප්‍රකාශ කරන්නාක් වැනිවූ; පදනිස්සිතමොරරාජා, පාදනිශ්‍රිත මයූරරාජ තෙම; තං ධම්මදෙසනරවෙන, ඒ අතීත වූ ස්වර්ණමයූරරාජයාගේ ධර්මදෙශනාධ්වනීන්; ලුද්දකස්ස ඉව, වැද්දාගේ මෙන්; ලොකස්ස, ලොකයාගේ; පාපඵණිනො, අකුශල නැමැති නාගයින්; අසෙසං, නිරවශෙෂයෙන්; හනතං, නසාවා.

සංසාරසාගරගතෙ සධනෙ ජනෙ තෙ
නෙතාම්පදෙ කාලවතුම්බුඛහෙම නාවා
නිබ්බාණපට්ටනවරං ගරුකාවජ්ජකං තං
සුපාරපණ්ඩිතගතා විය ආසු නාවා—33.

සංසාරසාගරගතෙ, සංසාරය වැනි වූ සාගරයට පැමිනියාවූ (ද්වේහෝ නොහොත්) සංසාර නැමැති සාගරයට පැමිනියාවූ; සධනෙ, මුක්තාමණිකාදි සප්තවිධධනයන් සහිතවූ (ද්වේහෝ නොහොත්) ශ්‍රද්ධාධනාදි සප්තධනයන් සහිතවූ; තෙ ජනෙ, ඒ වෙළඳජනයන්;(ද්වේහෝ නොහොත්) එතෙ ජනෙ, මේ සියලු ජනයන්; සුපාරපණිධිතගතා; සුපාරපණිධිතයට නියමුකම් විසින් පැමිනියා වූ (නොහොත්) සුපාරපණිධිතයන් විසින් නැගී සනලද; නාවා, නෞකාව; ආශු, ශීඝ්‍රව; තා හරුකච්ඡකං විය, ඒ හරුකච්ඡක නම් පටුන්ගමට මෙන්; පදෙ, ශ්‍රීපාදයෙහි; කල-මනොඥ වූ; චතුමුඛ-සතරමුහුනක් ඇති; හෙමනාවා, ස්වර්ණනෞකා තොම; නිර්වාණපට්ටනවරං, නිර්වාණ නැමැති අග්‍රවූ පත්තනග්‍රාමයට; නෙතං, වහා ම පමුනුවා වා.

සම්බොධිඤාණ පරිපාචයතො මුනිස්ස
භජෙතතා යථා හිමවතද්දි සමාධිහෙතු
එවම්මනෙන භජිතා හිමවද්දි පාදෙ
සම්බොධිඤාණපරිපාචනහෙතු හොතු—34.

සම්බොධිඤාණං පරිපාචයතො, සම්‍යක්සම්බොධිඥානය මුහු කුරුවන්නාවූ; මුනිස්ස, සර්වඥයා විසින්; භජෙතා, ඒ ඒ ජාතියෙහි භජනාය කරණ ලද; හිමවතද්දි, හිමවත්පර්වතය; යථා සමාධිහෙතු, එම මුනිහුගේ යම් සේ සමාධියට කාරණ වීද; එවං, එපරිද්දෙන් ම; පාදෙ හිමවද්දි, පාදයෙහි හිමාලයපර්වතරූපය තොම; මනෙන භජිතං, සිතින් භජනාය කරන්නාවුන් ගේ; සම්බොධිඤාණපරිපාචනහෙතු හොතු, සම්බොධිඥානයාගේ මිහිකිරීමට (නොහොත්) සම්බොධිඥානය මුහුකුරුවණ සමාධියට කාරණ වේ වා.

දළ්හං පරාජිතතයා මුනිනා සරෙන
සුඤ්ඤස්සරොපගතපඤ්ජරබන්ධනොව
සො පාදපඤ්ජරගතො කරවීකපක්ඛී
සබ්බස්සමප්පියවචං ජගතා භවන්තං—35.

මුනිනා, මුනිහු විසින්; සරෙන, අෂ්ටාඞ්ගසමුපෙතබ්‍රහ්මස්වරයෙන්; දළ්හං පරාජිතතයා, තර කොට පරදවනලදබැවින්; සුඤ්ඤස්සර-ශූන්‍ය වූ ශබ්ද ඇති ව; උපගතපඤ්ජරබන්ධනොව; උපගත වූ පඤ්ජරබන්ධන ඇතියක්හු වැනිවූ (නොහොත්) පඤ්ජරබන්ධනයට එළඹියක් හු වැනිවූ; පාදපඤ්ජරගතො, පාද නැමැති මැදිරියට පැමිනියාවූ; සො කරවීකපක්ඛී, පාදලක්ෂණ වූ ඒ කරවීකසකුණ තොම; සබ්බසං, සියල්ලවුන්ගේ; අප්පියවචං, අප්‍රිය තෙපුල්; ආභවන්තං, භවකෙළවර දක්වා; ජහතු, දුරු කෙරේ වා.

සෙත චක්කවාකමකරා අපි කොඤ්චජීව
ජීවාදිපක්ඛිවිසරා සරසීව භූතං
වෙසන්තාභරන චරණම්බුජිනී මහජ්ජන්තා
ජහාතු තංසිං විය පදෙ සුරමෙනතු නිච්චං—36.

නෙ, ඒ පාදලක්ෂණ වූ; චක්‍රවාකමකරා, සක්වාලිහිණින් හා මොරද; අපි, නැවත; කොචජ්වජීවාදි-කොස්ලිහිණිය ජීවජීවය යනාදි; පක්ෂිවිසරා, පක්ෂිසමූහයෝ ද; වෙස්සන්තරෙන භුතානං, විශ්වන්තර රජහු විසින් අනුභව කරණලද; සරසී ඉව, විලමෙන්; චරණම්බුජිනිං භජන්තා, පාදනලිනීය සෙවුනාවූ; ජනතා, සත්වයන්; තදගිං වීය, ඒ සරසියෙහි මෙන්; පදෙ, ශ්‍රීපාදයෙහි නිර්වාණපදයෙහි හෝ; නිච්චං, සතතයෙන්; සුරමෙනතු, මනා කොට ඇලවත්වා.

තං චන්දකින්නරගතිං ගතවස්ස බොධි
සත්තස්ස තස්ස සපජාපතිකස්ස භාවං
සං සූචයන්ත පදකින්නරකින්නරීව
සාමග්ගිමග්ගපටිපත්තිසු පාපයන්තු--37.

චන්දකින්නරගතිං, චන්දකින්නර ජාතියට; ගතවස්ස, උත්පත්තිවශයෙන් ගියාවූ; සපජාපතිකස්ස, කින්නරපජාපතිය සහිතවූ; බොධිසත්තස්ස, බෝධිසත්ව වූ; තස්ස, ඔහුගේ; තං භාවං, ඒ ලීලාව; සං සූචයන්තා ඉව, හඟවන්නාවුන් වැනිවූ; පදකින්නරකින්නරී, පාදයෙහි කිංපුරුෂය කින්නරාඞ්ගනාය යන දෙදෙන; මග්ගපටිපත්තිසු, යොනිඅභජන ප්‍රතිපාදනයෙහි (නොහොත්) ලොකොත්තරමාර්ග ප්‍රතිපත්තියෙහි; සාමග්ගිං, සමගබවට; (නොහොත්) අග්ගපටිපත්තිසු, උත්තම ප්‍රතිපත්තියෙහි; සාමග්ගිං, සාමග්‍රියට; වෙ, එකාන්තයෙන්; පාපයන්තු, සියලුසතුන් පමුනුවත්වා.

සං රජධානිමුසභො වහතග්ගහාරං
පීතිප්පදො * පජනයෙය්‍ය සවච්ඡධෙනු
සංසෙවිතො අභි රමේනතු ඡකාමසග්ගා
ධාරෙන්තු කායිම්හි සොළසධාතුධාමා—38.

උසභො, වෘෂභ තෙම; සංරජධානිං, ස්වකීය වූ හෝ සොභන වූ හෝ රජධානියට; (නොහොත්) නිර්වාණ නැමැති රජධානියට; අග්ගහාරං, උත්තමභාරයක් (දේහෝ නොහොත්) අභීෂ්ටාර්ථභාරය; වහතු, † පමුනුවාවයි; සවච්ඡධෙනු, වත්සාසහිත වූ දෙන් තොම; පීතිප්පදො, පිනවන්නා වූ ක්ෂීරය(දේහෝ නොහොත්)ප්‍රීති නැමැති ක්ෂීරය; පජනයෙය්‍ය, සියලු සතුන්ට උපදවාවයි එරමාවයි; ඡකාමසග්ගා, ෂට්කාමස්වර්ගයෝ; සංසෙවිතො, තමන් සෙවුනාවුන්; අභි රමෙනතු, තමන් කෙරෙහි ඇලවත්වයි; ඉහ, මේ පාදයෙහි; සොළසධාතුධාමා, ෂොඩශබ්‍රහ්මලොකයෝ; ඉහ, මේ ලෝකයෙහි හෝ; කායිං, තමන් චින්තනය කරන්නහු අලම්බ නොපතිධ්‍යාන ලක්ෂණෝපනිධ්‍යාන කරන්නහු හෝ; ධාරෙන්තු, අපායාදියෙහි හිය නොදී දරත්වා.

---

* ඇතම් පොතක-පීණප්පදො, කියාද තිබේ ඒද උචිතයි.

† උසුලාවයි.

දුන් ශ්‍රේෂ්ඨාවූ සත්ත්වරූපයන් සිටි ලීලාව උපමාවෙන් දක්වමි මුඛයෙන් රූපාන්තරයක් හුගේ ද අනන්‍යසාධාරණ මනොඥතාව නිගමනය කරන්නාවූ මෙපරිද්දෙන් සිටියවුන් වැන්න හයි සොපමා කොට දක්වත්-

සුත්වා ජිනස්ස කරවීකසරං මනුඤ්ඤං
අඤ්ඤොඤ්ඤසඞ්ගතිරහිතා අපි පච්චනීකා
හිත්වා ගතිං විය ඨිතා පදසත්තරූපා
සබ්බං භවස්සිත ජනාන ගතිං * හනන්තු—39.

ජිනස්ස, සර්වඥයාගේ; මනුඤ්ඤං, මනොඥවූ සිත් පැහැර ගන්නාවූ; කරවීකසරං, කරවීකනාදය; සුත්වා, අසා; පච්චනීකා අපි, ඔවුනොවුන්ට ප්‍රතිපක්‍ෂභූතවූ පවා; අඤ්ඤොඤ්ඤසඞ්ගතිරහිතා, ඔවුනොවුන් කෙරෙහි සිතියක් නැතිව; ගතිං හිත්වා, ගමන් හැර (හෙවත්) නොගොස්; ඨිතා විය, සිටියවුන් වැනිවූ; පදසත්තරූපා, පාදයෙහි සත්ත්වරූපයෝ; ජනානං, සත්ත්වයන්ගේ; සබ්බං භවස්සිතංගතිං, සියලු භවාශ්‍රිත ගතිය; හනන්තු, නසත්වා —— මොහු මේ බන්ද හයි විනතප්‍රසාදවශයෙන් නමිෂ්‍ය කොට පැවති කුශලචෙතනාවෝ තමන් පැවති විෂයෙහි ගුණය තමන්ගේ නිශ්‍රය කෙරෙයින් ගන්වා භවගතිනිවාරණය කෙරෙත්වයි යනු භාවයි.

සොවණ්ණකාහළසුගොපමමින්දිරාය
සනීරපුප්ඵමුකුලොපමමුස්සවාය
නිච්චං සුසජ්ජ ඨපිතං මුනි තිට්ඨතං තෙ
ජඞ්ඝාවයං ජනවිලොචනමඞ්ගලාය—40.

මුනි, ඉහලොක්පරලොක දෙක දන්නාවූ සර්වඥයෙනි; තෙ, තුඹවහන්සේගේ; ජඞ්ඝාවයං, ජඞ්ඝායුග්මය කෙණ්ඩූවූදයත්; ඉන්දිරාය, ශ්‍රීකාන්තාවගේ; උස්සවාය, උත්සවයක් පිණිස; නිච්චං, අනවරතයෙන්; සුසජ්ජ ඨපිතං, සරහා සිටුවනලද; සොවණ්ණකාහළසුගොපමං, රන්දුර දෙකක් හා සදෘශවූ ද; සනීරපුප්ඵමුකුලොපමං, නැමිලිවල් කැකුළු දෙකක් හා සදෘශවූ ද ජඞ්ඝාවය තෙම; ජන-සත්ත්වයන්ගේ; විලොචනමඞ්ගලාය, නෙත්‍රමඞ්ගලය පිණිස; තිට්ඨතු, සිටීවා; බොහෝ කලක් පවතීවා.

ලක්ඛින විලාසමුකුරච්ඡසන්නිකාසං
තාඩඞ්කමණ්ඩනවිඩම්බකමංසපුණ්ණං
ජාණුද්වයං ලලිතසාගරබුබ්බුලාභං
හොතං ජගත්තයනිජ්ජරතාවිභූසිතං තෙ—41.

ලක්ඛින, ශ්‍රීකාන්තාවගේ; විලාසමුකුරච්ඡසන්නිකාසං, ලීලාකැටපත් දෙකක් හා සදෘශවූ; තාඩඞ්කමණ්ඩනවිඩම්බකං, තාඩඞ්කාභරණවයස ව නිරුදු කරන්නාවූ ද හෙවත් ඒ ශ්‍රීකාන්තාවගේ සැරසීමට තෝඩුදෙකක්

* ඇතම් පොතක-භවස්සිතගතිං ජනානං.

වැනිවූ ද; අංසුකණ්ඩං, නික්මෙන්නා වූ රශ්මිසමූහ ඇති; ලලිතසාගර-
ලීලාසාගරයෙහි; බුබ්බුලාභං, බුබුලු දෙකක් වැනිවූ; තෙ ජාණුවයං, නුඹව
හන්සේගේ දනමඩුලු දෙක; ජයනානජනිජනනවිභූසිතං, ලොකත්‍රයා වසී
න් තමතමන්ගේ ආතම සරහනු පිණිස; හොතං, වේවා.

ජද්දන්තිදින්නවරදන්තනුගොපමානං
තං හත්ථිසොණ්ඩකමපුණ්ණගුණං තවොරුං
ලීලාපයොධිසිරිකෙලිසුවණ්ණරම්භා
ඛන්ධාව දෙන්තු පරිපුණ්ණගුණෙ ජනානං—42.

ජද්දන්ති-සදත්නු විසින්; දින්න-දෙනලද; වර-උතුම්වූ; දන්තානුගො පමානං, දළසනළ හා සමානවූ; තං හත්ථිසොණ්ඩ-එම හස්තීනුගේ සොඬසේ; කමපුණ්ණගුණං, ක්‍රමයෙන් පිරුණුගුණ ඇති; ලීලාපයොධි, ලීලාසාගරයෙහි; සිරිකෙලි-ශ්‍රීයගේ කෙළනාවූ; සුවණ්ණරම්භාඛන්ධාව, රන්කෙහෙල්කඳන් දෙකක් වැනිවූ; තව ඌරුං, නුඹවහන්සේගේ කලවා සහල; ජනානං, සත්වයන්ට; පරිපුණ්ණගුණෙ, සම්පූර්ණවූ කාමගුණයන් (නොහොත්) සම්පූර්ණ වූ ලෞකිකලොකොත්තරගුණයන්; දෙන්තු, දෙත්වා.

ජඞ්ඝක්ඛිකාවය සමප්පිත විත්තපාද
චක්කාවයී මනමනොජහයො මුනෙ තෙ
සොණීරථො සිරිවහො මනසාභිරූළ්හං
ලොකත්තයං සිවපුරං ලහු පාපයාතු—43.

මුනෙ, සර්වඥයෙනි; තෙ, නුඹවහන්සේගේ; ජඞ්ඝා-ජඞ්ඝායුගම නැමැති; අක්ඛකවය-අකුරන්ගේ දෙකෙහි; සංඅප්පිත-පිහිටුවනලද අවුනනලද; විත්ත-විසිතුරුවූ; පාද-පාදයුගම නැමැති (නොහොත්) පාදයුගමයෙහි; චක්කාවයී, යක්දෙකක් ඇති; මනමනොජහයො. චිත්තචෛතසික නැමැති යෙදූ අසුන් ඇති; සිරිවහො, ශ්‍රී උසුලන්නාවූ; සොණීරථො, ශ්‍රොණාලවූ ජඝනස්ථල නැමැති සුවර්ණරථය තෙම; මනසා, සිතින්; අභිරූළ්හං, නැඟවූ; ලොකත්තයං; තුන්ලෝවාසීජනයා; සිවපුරං, ශාන්තිපුරයට; ලහුං, වහා ම; පාපයාතු, පමුණුවාවා.

රම්මොරපාකටතටාකතටා සවන්ත
රොමාවලී ජලපණාලික කොට්ඨාසා
නාභිගභීරසරසී සිරිකෙළිතා තෙ
සඤෙසවිනං ව්‍යසනඝම්මමලං සමෙතු—44.

රම්ම-සිත්කලුවූ; උර-උරස්ථල නැමැති; පාකට-ප්‍රකට වූ උද්‍යාන වූ; තටාකතටා, තටාකයාගේ කූලයෙන් ගිහින්; සවන්ත-වැහෙන්නාවූ; රොමාවලී-රොමාවලී නැමැති රොමශ්‍රෙණී නැමැති; ජලපණාලිකා, ජලධාරාවගේ දියනලගේ; කොට්ඨාසා, කෙළවර පිහිටියාවූ; සිරිකෙළිතා,

ශ්‍රීය විසින් කෙළනාවූ; තෙ නාභිගම්භීරසරසි, නුබවහන්සේගේ නාභි නැමැති ගැඹුරු වූ පොකුණ; සමෙසාවිනං, තමා සෙවුනවුන්ගේ; ව්‍යසනාලම්බං, දුඃඛභූමිය; අලං, අත්‍යර්ථයෙන් (නොහොත්) වහා ම; සමෙතු, සන්හිඳුවා වා—ප්‍රකාශ උත්තාන හෙයින් ශ්‍රීමත්කුලස්ත්‍රියක් වැවට බැස ගැලී නාපිය නොහැක්කැයි එයින් දියතලක් තබා ඒ කෙළවරෙක ගැඹුරු රන්පනැසක් තුබුවා මෙන් ඉන්ද්‍රනීලමාණික්‍යමයවාතගරේඛා යේ අතරතුරෙහි මොරජනා දක්ෂිණාවර්තරොමාවලින් නැගෙන්නා වූ නීල කාන්තිවජවා නැමැති ජලයෙන් පිරුණු වූ පලල්ව තැණී තිබෙන්නාවූ වක්‍ෂඃස්ථල නැමැති ප්‍රකාශඋත්තානතාවාකයාගේ තටයෙන් වනාව තුඹු රොමාවලී නැමැති ඉන්ද්‍රනීලමාණික්‍යමය පිහිලිකෙළවර ශ්‍රීකාන්තාව බැස ගැලී නහා කෙලනා පිණිස තුබුවාවූ ගැඹුරුව වටවූ රන්පතසක් වැනිවූ නුබවහන්සේගේ නාභි තොමෝ තමා සෙවුනාවූ ජනයන්ගේ දුක්ඛ නැමැති සම්පීඩාව වහා ම සන්හිඳුවාවයි යනු අභිප්‍රාය යි.

කන්තිවජවාලුලිතරූපපයොධිනාභි
ආවට්ටවට්ටිතනිමුජ්ජිතසබ්බලොකො
සොභග්ගතොයනිවහං විවසො පිවිත්වා
ලොකුත්තරද්දිසුඛමුච්ඡිතතං පයාතු—45.

කන්තිවජවා—කාන්තිසමූහයෙන් (නොහොත්) කාන්තීන්ගේ රැළිනැඞිමෙන්; ආලුලිත-ඇලලුනාවූ; රූපපයොධි-රූප නැමැති ක්ෂීරසාගරයෙහි; නාභි-පෙකණි නැමැති; ආවට්ට-සලාවැටුමෙන්; වට්ටිත-දවටන ලදුව; නිමුජ්ජිත-ගලනලද; සබ්බලොකො, සියලු ලොකය තෙම; සොභග්ගතොයනිවහං, සෞන්දර්‍ය්‍ය නැමැති ජලසමූහය; විවසො, අවසවසඞ වසහ නොව රූපපයොධිවසනව; පිවිත්වා, බී; ලොකුත්තරද්දිසුඛමුච්ඡිතතං, ලොකොත්තරද්ධිසුඛ නැමැති මූර්ඡිතභාවයට; පයාතු, පැමිණේ වා.

ගම්භිරචිත්තරහදං පරිපූරයිත්වා
තං සන්දමානකරුණම්බුපවාහතුල්‍ය
රොමාලිවල්ලිහරිතාභිසුභාලවාලා
දෙතං ලහුං සිවඵලං භජතං මුනෙ තෙ—46.

මුනෙ, සර්වඥයන් වහන්සේ; තෙ, නුබවහන්සේගේ; ගම්භිර-ගැඹුරුවූ; චිත්තරහදං, සිත් නැමැති හෙජවළ; පරිපූරයිත්වා, පුරා ගෙණ; තං සන්දමාන-එයින් වැහෙන්නාවූ; කරුණම්බුපවාහතුල්‍ය, කරුණාජලප්‍රවාහයක් හා සදෘශවූ; හරි-සුවර්ණමයවූ; නාභිසුභාලවාලා, නාභි නැමැති මනොඥ වූ තොතැන්නක් ඇති; රොමාලිවල්ලි, රොමශ්‍රෙණී නැමැති ලතා තොම; භජතං, තමා සෙවුනාවුන්ට; සිවඵලං, ශාන්තිඵලය; ලහුං, වහා ම; දෙතං, දේවා.

චාරූරසාරිඵලකො කුටිලග්ගලොම
පන්තීවිභත්තිසහිතො සිරිකෙලිසජ්ජො
සග්ගාපවග්ගසුඛපූජක කෙලිගෙහං
හොතං තිලොකසුඛපූජකතොසණකානං—47.

කුටිලග්ග-ඉඳුනිල්මිණි කාන්තිවර්ණ වූ මලලු සේ ඇතුළට වක්ව ගියා වූ අග් ඇති; ලොමපන්ති-රෝමශ්‍රේණි නැමැති; විභත්තිසහිතො, ගැප්පෙලින් යුක්තවූ; සිරිකෙලිසජ්ජො, ශ්‍රීයගේ කෙළිම පිණිස සදනලද; චාරූරසාරිඵලකො, මනොඥවූ (නොහොත්) සුවර්ණමය වූ උරස්ථල නැමැති ඵලපෝරුව තෙම; තිලොක-ජගත්‍රය නැමැති; සුඛපූජකතොසණකානං, සුඛපූජකයෙකි හොබුන්ගේ; සග්ගාපවග්ගසුඛ-දිව්‍යසුව නිවන්සුව නැමැති; පූජක-පූජකයාගේ; කෙලිගෙහං, අනුභවවීමයෙන් කෙළිමඩ කාරණවූයේ; හොතං, වේවා.

ගම්භීරචිත්තරහදොදරගාහමානා
මෙත්තාදයාකරිවධූකරසන්නිකාසා
සබ්බඞ්ගිනං සිවඵලං තනුදෙවරුක්ඛ
සාඛාසඛා තව භුජා භජතං දදන්තු—48.

ගම්භීර-ගැඹුරුවූ; චිත්තරහදොදර-සිත් නැමැති හ්‍රදභ්‍යන්තරයෙහි; ගාහමාන-ගැලෙන්නාවූ; මෙත්තාදයා-මෛත්‍රීකරුණා නැමැති; කරිවධූ-ඇතින්නන්දෙන්නාගේ; කරසන්නිකාසා, සොඬදෙකක් හා සදෘශවූ; තනුදෙවරුක්ඛ, ශරීර නැමැති කල්පවෘක්ෂයෙහි; සාඛාසඛා, සාඛාවට සහායවූ සාඛා වැනි වූ; තව භුජා, නුඹවහන්සේගේ බාහු දෙදෙන; භජතං, තමන් සෙවුනාවූ; සබ්බඞ්ගිනං, සියලු සතුන්ට; සිවඵලං, අමාතඵලය; දදන්තු, තමන් සාඛාවන් වැනිහෙයින් දෙත්වා.

සිංගාරබින්දුසහිතඞ්ගදලොපසොභී
බිම්බලම්බරත්තපදුමව්‍යභඞ්ගිභාජී
පාපාරිසීසලූනතොයිව රත්තාරත්තා
රත්තා කරා තව භවුං භුවි මඞ්ගලාය—49.

සිංගාරබින්දුසහිතඞ්ග-නිම්බිඳුයෙන් යුක්තවූ අඞ්ග ඇති; දලොපසොභී, පෙතිපෙළින් හොබනාවූ; බිම්බලම්බ-එල්ලෙන්නාවූ; රත්තපදුමව්‍ය-රත්පියුම් දෙකක්හි; භඞ්ගිභාජී, ලීලා සෙවුනාවූ; පාපාරිසීසලූනතොයිව, පාප සතුරන්ගේ හිස් කැපීමෙන් නොහොත් හිස් කපන්නනු [illegible]; රත්තාරත්තා ඉව, ලේහෙයෙන් රඳුනවුන් වැනිවූ නොහොත් රඳනලද්දවුන් වැනිවූ; තව රත්තා කරා, නුඹවහන්සේගේ රක්තවූ හස්තයෝ; භුවි, ලෝකයෙහි; මඞ්ගලාය භවුං, තමන් අදහනොත්සවයක පහළවන අවලෝක [illegible] වැනිවූ හෙයින් මඞ්ගල් පිණිස වෙත්වා.

රූපස්සිරිවරිතවඩ්ඪිතමම්බරාභා තෙ
පිඤ්ඡ යථා කලලම්බුධනි හෙතුභූතා
එවං භවණ්ණව සමුත්තරණාය සෙතු
හොන්තම්ම භාකනකසඞ්ඛතමස්සනනිකාසා—50.

රූපස්සිරිවරිත-රූපශ්‍රීය විසින් හැසිරෙණලද; වඩ්ඪිතම්බරාභා, (රන්) සක්මනක් මෙන් ලීලාවත්වූ; මහාකනකසඞ්ඛතමස්සනනිකාසා, පලල්වූ රන්ගෙයක් වැනිවූ; තෙ පිඤ්ඡ, තුඹවහන්සේගේ පාදපිඤ්ඡී නොවී; කලලම්බුධනි, කුමෙඩනාමසකාලයෙහි මඩවත්තෙහි; යථා හෙතුභූතා, දීපඞ්කර සර්වඥයන් වහන්සේට සම්සේ හෙයක් වූ සේක් ද; එවං, එපරිද්දෙන්; භවණ්ණවසමුත්තරණාය, ජනයාගේ සංසාරසාගරයෙන් එතරවීම පිණිස; සෙතු හොන්තු, හෙයක් වේවා, කාරණ හෝ වේවා.

සද්ධම්මදෙසන මනොහර භෙරිනාද
සචාරණෙ සිවපුරං විසිතුං ජනානං
ගීවා සුවණ්ණමයචාරුමුතිඞ්ගභෙරි
භාවං භජා භවතු භූතවිභූතියා තෙ—51.

ජනානං, සත්වයන්ගේ; සිවපුරං විසිතුං, නිවන්පුරයට වැදීව පිණිස; සද්ධම්මදෙසන-සද්ධර්මදෙශනා නැමැති; මනොහර-මනහැරවූ සිත්පැහැරගන්නාවූ; භෙරිනාදසචාරණෙ, භෙරිබව නිසාගේ හැසිරවීමෙහි පැවැත්වීමෙහි, සුවණ්ණමය-රන්මුවාවූ; චාරු-මනොඥවූ; මුතිඞ්ගභෙරිනාවං, මිහිඟුබෙර ලීලාවක්; භජා, සෙවුනාවූ; තෙ ගීවා, තුඹවහන්සේගේ ශ්‍රීවා නොම; භූතවිභූතිය, සත්වයන්ගේ සමෘද්ධිය පිණිස; භවතු, වේවා.

ලක්ඛීනිවාසවදනම්බුජමත්තනිත්ත
මාකඞ්ඛියං ජනවිලොචනචඤ්චරීකො
සොරභිභාධම්මමකරන්දනිසන්දමානං
පිණෙන්තු තෙන සරසෙන සභාජිනො තෙ—52.

ජනවිලොචනචඤ්චරීකො, ජනයාගේ නෙත් නැමැති මධුපයන්; අනන්තිකාභා, තමාගාව සොමු කොට තමා සාරු; ආකඞ්ඛියං, අදනාවූ, සොරබහ-සුගන්ධ ස භා; ධම්මමකරන්දනිස්සන්දමානං, දහම්මුවරදවහනය කරන්නාවූ; තෙ ලක්ඛීනිවාසවදනම්බුජං, තුඹවහන්සේගේ ශ්‍රීනිවාසවූ වා සස්ථානවූ මුඛ නැමැති පද්මය; සභාජිනො, තමන් භජනය කරන්නාවුන්; තෙන සරසෙන, ඒ සවකීය වූ මකරන්ද රසයෙන් (නොහොත්) සුවඳවූව රදවහනායයි කියනලද සවකෘත්‍යයෙන්; පිණෙන්තු, පිණවා වා.

ලක්ඛීසමාරුහිතවත්තාරපෙ රථඞ්ග
චක්කඤ්ඤුකාරිම්ගරාජකපොලලීලං
තාඩඞ්කමණ්ඩලයුගං විය කණ්ණභාජං
ගණ්ඩත්ථලද්වයමලඞ්කුරුතං ජනානෙත—53.

ලක්ඛීසමාරුහිත-ලක්ෂ්මීය විසින් නැගෙනලද; වත්තාරපෙ, වදන නැමැති රථයෙහි; රථඞ්ගචක්කනුකාරිං, රථයක්දෙසක ආකෘති ඇති (හෙ

වත්) සක් දෙකක් වැනිවූ; මිගරාජකපොලලීලං, සිංහහනුහෙයි ලීලාවක් ඇති; කණ්ණභාජං, කර්ණභජනය කළාවූ කණ් තබා ගත්තාවූ; භාඩිතමණ්ඩලයුගා ව්‍ය, තෝඩුවට දෙකක් වැනිවූ; ගණ්ඩත්ථලමඩං, කපොලස්ථල දෙක; ජනතාන, ජනයන්ගේ ශරීරයන් (දේහෝ නොහොත්) විනාශයන්; අලඞ්කුරුතං, තමා අලඞ්කාර භාණ්ඩාකෘති හෙයින් ශරභා වා.

ලාවණ්ණමණ්ණවපවාලලතාවයාභං
තබ්බඞ්ගදෙවතරුපල්ලවකන්තිමන්තං
වත්තාරවින්දමකරන්දපරීතසොභං
රත්තාධරච්ඡවි මපොධා කුරුතං ජනාඝං—54.

ලාවණ්ණ අණ්ණව-සෞන්දර්‍ය්‍යසාගරයෙහි; පවාලලතාවයාභං, පබළුලිය දෙකක් වැනිවූ; තබ්බඞ්ග-තුඹවහන්සේගේ ශරීර නැමැති; දෙවතරු-කල්පවෘක්ෂයාගේ; පල්ලවකන්තිමන්තං, පල්ලවශොභාව බහුලවූවා ද ප්‍රශස්තවූවා ද නිත්‍යයුක්තවූවා ද අතිශයවත්වූවා ද සංශක්තවූවා ද ඇත්තාවූ; වත්තාරවින්ද-මුඛ නැමැති පද්මයෙහි; මකරන්දපරීතසොභං, මකරන්දයෙන් පරීතයෙක සොභාවක් ඇත්තාවූ මකරන්දපරීතයක් මෙන් හොබනාවූ; රත්තාධරච්ඡවී, රක්ත වූ අධරච්ඡවී; ජනාඝං, ජනපීඩාව; අපොධා කුරුතං, තමා ප්‍රවෂ්ජනාඝයක් හෙයින් යට කෙරේ වා.

උණ්ණා සකුන්තිගතමජ්ඣනත්ථුකූප
සුභභ්‍රූලකාරසිතොට්ඨපවාලනාවා
ගත්තුත්තරණ්ණවගතා තව ජන්තුකානං
හොතු භවණ්ණවසමුත්තරණාය නාථ—55.

නාථ, ස්වාමීනි; තව, තුඹවහන්සේගේ; උණ්ණාසකුන්ති-ඌර්ණ නැමැති දින්ලිහිනිය විසින්; ගත-පිහිටා ගලද; මජ්ඣ-මධ්‍යතයක් ඇති; නත්ථුකූප-නාසිකා නැමැති කුඹෙහි; සුභභ්‍රූලකාරසත්තා, මනාවූ භ්‍රැයුගම නැමැති රුවල් දෙකකින් යුක්තවූ; ගත්තුත්තරණ්ණවගතා, රත්වන් ශරීර නැමැති උත්තර සාගරයට පැමිණියාවූ; ඔට්ඨවාලනාවා, ඔෂ්ඨ නැමැති විද්‍රැමමය නොව; ජන්තුකානං, සත්ත්වයන්ගේ; භවණ්ණවසමුත්තරණාය, සංසාරසාගරයෙන් එතරවීම පිණිස; හොතු, වේවා.

ඊසං විකාසපදුමොදරකෙසරාලි
ලීලාවිනද්ධරුචිරා තව දන්තපන්ති
වාණීවධූධවලමාලතිමාලයතුලත
තාසං ජනස්ස මනසො ජනමාවරෙය්‍ය—56.

ඊසං විකාස-ඊෂත් විකසිතවූ හෙවත් අඩමුකුළිතවූ; පදුමොදර-පද්මගර්භයාගේ; කෙසරාලි-කෙසුරුපෙළක ලීලා වැනිවූ ලීලායෙන්; විනද්ධ-වෙළාගනලද්දවූ; රුචිරා, සිත්කලුවූ; වාණීවධූ, වාගඞ්ගනාව විසින්; *

* වාක්අඞ්ගනාව විසින්.

ධරිත-පලදනාලද; මාලතීමාලාසතුල්‍යා, දෑසමන්කැකුළු දමක් හා සදෘශ වූ; තව දන්තපන්ති, තුඹවහන්සේගේ දශනශ්‍රේණී තොමෝ; තාසං, ඒ වා ගතනාව කෙරෙහි: ජනස්ස, ජනයාගේ; මනොරජනං ආවරෙය්‍ය, තමා ඇසව නාසයට අතිශයින් ප්‍රිය බැවින් බලන්නවුන් කෙරෙහි රුචිජනක පලදනාවක් වැනිහෙයින් සිත්ඇලවීම කෙරේ වා.

සද්ධම්මනිජ්ඣරසුරත්තසිලාතලාභා
ජිව්හා වචීනවවධූකලරඞ්ගභූතා
සද්ධම්මසෙතුතරණී නිහිතපියා තෙ
සංසාරසාගරසමුත්තරණාය හොතු—57.

සද්ධම්මනිජ්ඣර-සද්ධර්ම නැමැති නිර්ඣරයට ගඞ්ගානැල්ලවූ; සුරත්තසිලාතලාභා, පද්මරාගමාණික්‍යමය වූ ශලාතලයක් වැනිවූ; වචීනවවධු-වචන නාමයස්ත්‍රීයට; කලරඞ්ගභූතා, මනොඥවූ රඞ්ගමණ්ඩලයක් වැනිවූ; සද්ධම්මසෙතුතරණී-සද්ධර්ම නැමැති රත්නනෞකාවෙහි; නිහිත-පිහිටුවනලද; පියා, පලුපත් වැනිවූ;* තෙ ජිව්හා, තුඹවහන්සේගේ ජිහ්වා තොමෝ; සංසාරසාගරසමුත්තරණාය, තමා පලුපතක් වැනිහෙයින් ජනයාගේ සංසාරසාගරයෙන් එතරවීම පිණිස; හොතු, වේවා — තීරණයි හ තං සිද්ධං, යනුමෙන්, ඵලයට කාරණකාරණය ද කාරණ්‍ඩයෙන් කියනු ලැබේනුයි සංසාරසාගරයම සමුත්තරණයට කාරණවූ සද්ධර්මනෞකාප්‍රවෘත්තියට කාරණවූ ජිව්හාපියාව සංසාරසාගරසමුත්තරණයට කාරණභාවයෙන් කියනලදී.

දන්තංසුකඤ්චිතරත්තාධරොපධානෙ
ජිව්හා සුරත්තසයනෙ මුඛමන්දිරෙ තෙ
ආමොක්ඛමුත්තිවධුයා සයිතාය තුය්හං
කුබ්බන්තු සඞ්ගමමලං ජනසොතුකාමී—58.

මුඛමන්දිරෙ, මුඛ නැමැති ගෘහයෙහි පිහිටියාවූ (හෙවත්) පනවනලද්දවූ; දන්තංසු-දන්තමරීචි නැමැති; කඤ්චිත-ගවහණියෙන් † යුක්තවූ; රත්තාධරොපධානෙ, රත්වූ ඔෂ්ඨ නැමැති කන්වයින් ඇති; ජිව්හාසුරත්තසයනෙ, ජිහ්වා නැමැති අතිරක්තවූ සයනයෙහි (හෙවත්) රත්පිඩාම්ඇති යහනෙහි; සයිතාය, හොත්තාවූ (දේහෝ නොහොත්) පැමැත්තාවූ; තුය්හං මුත්තිවධුයා, තුඹවහන්සේගේ වාගනාව හා; සඞ්ගමං, මෛථුනසංයොගය(දේහෝ නොහොත්)විසයවිසයිසංයොගය, ජනසොතුකාමී, ශ්‍රෝතෘජනයන් වැනි හෝ ශ්‍රොතෘජන නැමැති හෝ කාමීහු (නොහොත්) ඇසාර යනු කැමතිනු අසනුකැමති හෝ ජනයෝ; ආමොක්ඛං, සමහවරූපමොචනය දක්වා (දේහෝ නොහොත්) නිර්වාණමොක්ෂය දක්වා; අලං, අතිශයෙන් (හෙවත්) නිරන්තරයෙන් හෝ අවිච්ඡින්නව හෝ; කුබ්බන්තු, කෙරෙත්වා.

---

* ඇතම් පොතක-පළුපත් නැමැති. † ගවසකියෙන්.

උණ්ණා තනාභිනවපන්නවරාභිරාමා
ලීලොලලසන්තභමුකාවසථීලපත්තා
සොවණ්ණරම්මරුචිකන්දලි වදනාලවාලා
තුය්හං පවත්තතු චිරං ජනමඞ්ගලාය—59.

උණ්ණා-ඌර්ණරෝම නැමැති; තන-විදසී* පතළාවූ; අභිනව-අලුත්වූ; පන්නවරාභිරාමා, උතුම්වූ කොළකින් සිත්කලුවූ; ලීලොලලසන්ත-ලීලායෙන් සෙවුනාවූ; භමුකාවස-භෲයුග්ම නැමැති; ථීලපත්තා, තිල්පත් දෙකක් ඇති; වදන-මුඛ නැමැති; ආලවාලා, රුවන්තොටැන්නක් ඇති; තුය්හං සොවණ්ණරම්මරුචිකන්දලී, නුඹවහන්සේගේ නාසිකා නැමැති මහත්වූ සවිණි කදලි කොට; ජනමඞ්ගලාය, ජනයන්ට මඞ්ගල් පිණිස; චිරං, බොහෝකලක්; පවත්තතු, පවතීවා.

භාලත්ථලීහරිසිලාතලපීඨිකට්ඨ
භූවල්ලරීවයමයූරයුගස්ස තුය්හං
පඤ්චප්පභාරුචිරපිඤ්ඡකලාපසිරීකං
නෙත්තවනං මනසි පුඤ්ඡතු පාපධූලිං—60.

භාලත්ථලී-ලලාටප්‍රදෙශ නැමැති; හරිසිලාතලපීඨිකට්ඨ-රන්ගල්තලපිට සිටියාවූ; භූවල්ලරීවය-බැම්රෙද දෙක නැමැති; මයූරයුගස්ස, මොනරුන් දෙන්නාගේ; පඤ්චප්පභාරුචිර-පස්පැහැයෙන් සිත්කලුවූ; පිඤ්ඡකලාපසිරීකං, පිල්දෙකක් සේ සොභාවත්වූ; තුය්හං නෙත්තවනං, නුඹවහන්සේගේ නෙත්‍රවනය; මනසි පාපධූලිං, සත්වයන්ගේ සිත්හි පාප නැමැති රජස්; පුඤ්ඡතු, පාපද්‍රව්‍යකාරිත්වයෙන් පිසීවා.

ඉන්දීවරන්තගතභිඞ්ගසපන්තිසොභි
පඤ්චම්බුජස්සරතටෙ විය ගච්ඡදන්තී
නෙත්තම්බුජස්සිරිතිරොකරණීව තුය්හං
පම්හාවලී සිරිගතෙහි තිරෙ කරොතු—61.

ඉන්දීවරන්තගත-නිලොත්පලයන් දෙදෙනක්හුගේ කෙළවරට පැමිණියාවූ; භිඞ්ගසපන්තිසොභී, භෘඞ්ගයන් පිළිබඳවූ ශ්‍රේණියකගේ ලීලාවක් ඇත්තාවූ; පඤ්චම්බුජස්සරතටෙ, රක්තශ්වේතාදි පචවිධ පදුමයන් ඇත්තාවූ විල්තෙර; ගච්ඡදන්තී විය, ගස්රෙද දෙකක් වැනිවූ; නෙත්තම්බුජස්සිරි-නෙත්‍ර නැමැති අම්බුජයාගේ ශ්‍රීයගේ; තිරොකරණීව, වටඇදි තිරයක් වැනිවූ; තුය්හං පම්හාවලී, නුඹවහන්සේගේ පක්ෂ්මපන්ක්තිනු අක්ෂිරෝමාවලිය; ඉන, මේ නෙත්‍රයෙහි; සිරිගතෙ, ශ්‍රියා කරා ගියවුන් (නොහොත්) මේ ලොක්යෙහි සම්පත් පැමිණියවුන්; තිරෙ කරොතු, තදනුභව පිණිස තිර කෙරෙත්වා, අතිශයින් ශ්‍රීමත්වූවුන් කෙරෙත්වයි යේසී.

---

* විතිද.

විතතුල්ලසමුජ්ජ විලොචනහංසතුණ්ඩ
කන්තංසුපිඤ්ජරමුළාලලතාවකාසං
දොලාවයංව සවණද්වයමත්තලක්ඛිං
හොතං තවජ්ජ ජනතාමතිචාරහෙතු—62.

විතත-රන්වන්වුනුනු නැමැති; උල්ලස-පෙනුනාවූ ප්‍රභා විහිදුනාවූ; අම්බුජ-සමුණ්ණපද්මයෙනි; විලොචනහංසතුණ්ඩ-නෙත් නැමැති හංසයන් ගේ තුඩෙහි; කන්තං සුපිඤ්ජරමුළාලලතාවකාසං, ඒ මුඛපද්මරශ්මීන් පිඬුවන් වූ නෙළුම්දළලීය දෙකක් හා සදෘශවූ; අත්තලක්ඛිං, අනවශ්‍රියගේ; දෙලාවයං ඉව, රන්හොවිලි දෙකක් වැනිවූ; තව සවණද්වයං, නුඹවහන්සේගේ කන්වැල් දෙක; අජ්ජ. දැන්; ජනතා-ජනසමූහයාගේ; මතිචාරහෙතු, ප්‍රසාදභාවනාවගේ හැසිරීමට හෙතුවූයේ; හොතං, වේවා.

වම්මීකමත්ථකසයානකභූරිදත්ත
භොගින්දභොගවලිවිබ්භමමාවහන්තී
නාසාපරිස්සිති මුනෙ තව තුණ්ණමුණ්ණා
තග්ගාහිනො විය ජනස්ස දදාතු චිත්තං—63.

මුනෙ, සර්වඥයෙනි; වම්මීකමත්ථකසයානක-වාල්මීකව කෙළවරෙහි තුඹසමත්තෙහි හොත්නාවූ; භූරිදත්තභොගින්ද-භූරිදත්ත නම් නාරජහුගේ; භොගාවලිවිබ්භමං, භොගාවලිලීලාව දරණවැලෙහි සොභාව; ආවහන්ති, උසුලන්නාවූ; නාසාපරිස්සිති, නාසිකා මත්තෙහි පිහිටීම් ඇත්තාවූ පිහිටියාවූ; තව උණ්ණා, නුඹවහන්සේගේ ඌර්ණරෝමධාතු තොම; තග්ගාහිනො විය, ඒ භූරිදත්ත නාරජහු ගත්තාහට මෙන්; ජනස්ස, ආරම්භණකරණවසයෙන් තද්ග්‍රාහී වූ ජනයාහට; චිත්තං, තුෂ්ටිකාරණ වූ ම සතුන්; තුණ්ණං, වහා ම; දදාතු, දේවා.

රූපිස්සිරාය විජයෙ'ඛිලලොකරූපං
නාසාරුචාරුපරිඝොපරිබද්ධබද්ධා
නීලාභ වාතවිලුළිතාතුලයද්ධජාභා
තිට්ඨන්තු සජ්ජ දුරිතාරිජයාය තෙ භූ—64.

රූපිස්සිරාය, රූපශ්‍රීයගේ; අඛිලලොකරූපං, රූපවත්වූ සමස්තලොකයාගේ රූපය; විජයෙ, දිනීමෙහි; නාසා-නාසිකා නැමැති; උරුචාරුපරිඝඋපරි-මහත්වූ රථයක්හුගේ මුදුනෙහි; බද්ධබද්ධා, බැඳනාලද්දක් මෙන් නිපන්නාවූ; නීලාභ-නිල්වූ සොභා ඇති; වාතවිලුළිත-සුළඟින් පෙරළෙන්නාවූ; ජයද්ධජාභා, කාමරූපලොකවිජයට නැඟූ ජයකොඩි දෙකක් හා සමානවූ; තෙ භූ, නුඹවහන්සේගේ බැම දෙක; දුරිතාරිජයාය, පාපසතුරන් දිනීම පිණිස; සජ්ජ, සැරැහී; තිට්ඨන්තු, සිටිත්වා.

උණ්ණාසිතොපලනිවෙසිතබුද්ධසද්ධිං
නාසාරුපිණ්ඩකමිසාතප රුද්ධිතුං තෙ
හොතං මුඛබ්බුජසිරිස්සිරසුස්සිතාභං
භූනීලපට්ටිකලලාටසුවණ්ණඡත්තං—65.

ඌර්ණා-ඌර්ණරෝමමණ්ඩල නැමැති; සිතොපල-සප්ටිකමාණික්‍යය වෙටෙහි; නිවෙසිත-පිහිටුවනලද; බිඥසජ්ඣිං, බුද්ධසජ්ඣීයක් ඇති; ඝාණ-ඝ්‍රාණ නැමැති; ඌරු පිණ්ඩකං, මහත් රන්මුඹුවක් ඇති; මුඛබුජ-මුඛ නැමැති පද්මයෙහි; සිරි-ශ්‍රීයගේ; සිරසි, මස්තකයෙහි; උසසිතාහං, නගනල ද්දක් වැනිවූ; තෙ භූනීලපට්ටිකලලාටසුවණ්ණජතහං, නුඹවහන්සේගේ බැම නැමැති නීලපට්ටිකාවක් ඇති ලලාට නැමැති සුවර්ණවජ්‍රතුය රත් සත; අඤ්ඤ-සත්ඣයන්ගේ පාප නැමැති (නොහොත්) දුක් නැමැති; අන පං රැඬිතුං, අවිවලකන පිණිස; හොතං, වේවා.

රූපඞ්ගනාවධනවිලොචනබාණදිඨි
ධාරානිසානමණිවට්ටසිරී සිරී තෙ
සිඩාවිතොසධකතඤ්ජනපුඤ්ජලඞ්ඛී
හොතං ජනස්ස නයනාමයනාසනාය—66.

රූපඞ්ගනාවධන-රූප නැමැති ලක් විඳිනාවූ; විලොචනබාණ-නෙත්‍ර නැමැති ශරයන්ගේ; දිඪිධාරානිසාන-දෘෂ්ටි නැමැති මුවහත් තවන්නාවූ; මණිවට්ටසිරී, මිණිවැටෙක ශොභා ඇති, මිණිවැටක් සේ හොබනාවූ, සියල ලොකවාසීන්ගේ නෙත්‍රපද්මයට ආධාර වූයෙහි යේසී; සිඩාවිතොසධ-සිඩිවූ අවාබෙහෙදින්; කතඤ්ජනපුඤ්ජලඞ්ඛි, කරනලදඅඳුන්පිඩක සොභා ඇති; තෙ සිරෙ, නුඹවහන්සේගේ ශිම්ම තෙම; ජනස්ස නයනාමය නාසනාය, ජන්තූගේ නෙත්‍රරොගවිනාශය පිණිස; හොතං, වේවා.

සඞ්ඛාභබාහුයුගතොරණමජ්ඣගීවා
ධාරප්පිතස්සිරසතොපරි මුණ්ඩවාය
නීලුප්පලාව ඨපිතා සවිභත්තිකං තෙ
කෙසා භවන්තු භුවනත්තයමඞ්ගලාය—67.

සඞ්ඛාබ්බාහුයුග-සක්ඛයන් සහිත වූ බාහුයුග නැමැති; තොරණම ජ්ඣ-සිව්ණිතොරණයාගේ මැද; ගීවාධාරප්පිත-ග්‍රීවා නැමැති කළ වඩියෙහි පිහිටුවනලද; සිරසතොපරි, ශිර්ෂ නැමැති සුවර්ණකටාහයක යෙහි; උස්සවාය, නෙත්‍රොත්සවය පිණිස; සවිභත්තිකං, විභාගසහිත කොට (හෙවත්) පෙළ හෙදා; ඨපිතා, තබනලද; නීලුප්පලා ඉව, නීලොත්පලයන් වැනිවූ; තෙ කෙසා, නුඹවහන්සේගේ කෙශයෝ; භුවනත්තය මඞ්ගලාය, තුන්ලෝවාසීන්ට මඟුල් පිණිස; භවන්තු, වෙත්වා.

හෙමඞ්ගියෙ ඨපිතනීලසිලාකපාලෙ
පජ්ජොතජාලලලිතං මුනි සාරයන්තී
රූපස්සිරීසිරසි භූසිතහෙමමාලා
සාරං කරොතු සුගතං තව කෙතුමාලා—68.

මුනි, සර්වඥයෙනි; තව කෙතුමාලා, නුඹවහන්සේගේ කෙතුමාලා නොම(කෙබඳුවූදයත්); හෙමඞ්ගියෙ, රන්ඇඟැයෙහි; ඨපිත-තබනල ද; නීලසිලාකපාලෙ, ඉඳුනිලමාණික්‍යමය කබලෙහි; පජ්ජොතජාල

ලලිතං, තුන්ලොව බබුලුවන්නාවූ ප්‍රදීපශිඛාලිප්තාවක් : ධාරයනති, සිසි කර-වන්නාවූ (නොහොත්) පවත්වන්නාවූ; රූපසිරිසිරසි, රූපශ්‍රීයගේ වි-යනකරයෙහි; භූසිත-තුන්ලෝවාසීන් හට කෙරෙන අලවන පිණිස පවු-දනාලද; හෙමමාලාකාර, ස්වර්ණමාලාකාරයක් ඇත්තාවූ ප්‍රන්මාලාව-ක් වැනිවූ; කෙතුමාලා, කෙතුමාලා නොම්; සුගනං කරෙතු, අලඞ්කා-ර වස්තුව අලඞ්කාරයෙන් හොබවනහෙයින් පැදිත්තාවූ * රූපශ්‍රීය කෙ-රෙහි සත්වයන්ගේ ප්‍රිය බව කෙරේවා (නොහොත්) නම්ෂ්ඨවූ කුසලචෙ-තනාව විෂ්ණුගුණ තමාගේ නිශ්‍රය කෙරෙහි ද පිහිටුවා නදකාරවිභා-ගයෙන් ප්‍රසාද කළ සත්වයන් කෙරෙහි අනාස්යත්වයන්ගේ ප්‍රියභාවය කෙ-රේ වා.

බාහුප්පභාලි තව කාචනමෝරකාලෙ
සූරෝදයෙ විතතවණ්ණකලාපලක්ඛි
මේඝාවනද්ධසිඛරානතහේමසේලා
සන්නිඥචාපවිතතීව අදදු සොභං—69.

තව, නුඹවහන්සේගේ; කාචනමෝරකාලෙ, ස්වර්ණමයූරසමයෙහි; සූරෝදයෙ, හිරුඋදයෙහි; විතත-කාලය පිණිස පතුරුවන ලද විලහ-කලද; වණ්ණකලාපලක්ඛි, සදැස්පිල්හෙයට බඳුවූ සොභා ඇති; මේඝාව-නද්ධසිඛර-නීලමේඝයෙන් වලදනාලද මස්තක ඇති; උන්නත-උස්වූ; හේමසේලාසහාන-ස්වර්ණපර්වතසමීපයෙහිවූ; ඉන්ද්‍රචාපවිතති ඉව, ඉන්ද්‍ර-චාපවිතතියක් වැනිවූ; බාහුප්පභාලි, බාහුප්‍රභාලි නොම්; සොභං, තම-න් සොභාවස්තු හෙයින් සතුන්ට සොභාවක්; අදදු, දේවා.

මෙසේ රූපකායානුස්මරණය කොට ඒ අනුස්මරණකුශලය සත්වයන්-ට පිරිනමා හිතාශිංසනවශයෙන් මෙත් කොට, දැන් ධර්මකායානුස්මර-ණමුඛයෙන් එසේම මෙත් කරන්නාහු සවෙසතරූපකායට හා වක්ෂ්‍ය-මාණවූ ධර්මකායට සම්හෙතුකින් පාරමිතාවෝ කාරණයෝ ද, එම පාර-මිතාගුණයෙන් නුවණෙන් පරිණත වූවාහු ලොකොත්තරභාවයෙන් සම්-හෙතුවකින් නිපන්නාහු ද එහෙයින් ඒ පාරමිතානුස්මරණයෙන් ද පසුව කොට හිතාශිංසනය කරණු පිණිස, පඤ්ඤාය තෙ පණිධිතො, යනාදි ගීතු-

පඤ්ඤාය තෙ පණිධිතො සවිදානසීල
නෙක්ඛම්මපඤ්ඤවිරියක්ඛන්තිසච්චාධිට්ඨා
මෙත්තා උපෙක්ඛිති ඉමෙ දස පූරයිත්වා
පූරෙන්තු පාරමිගුණා ජනතානමිට්ඨා—70.

දානසීලනෙක්ඛම්මපඤ්ඤාවිරියක්ඛන්තිසච්චාධිට්ඨානමෙත්තාඋපෙක්ඛා ඉති, දානය, ශීලය, නෛෂ්ක්‍රම්‍යය, ප්‍රඥාව, වීර්‍ය්‍යය, ක්ෂාන්තිය, සත්‍යය, අධිෂ්ඨා-නය, මෛත්‍රිය, උපෙක්ෂාය යන; ඉමෙ දසපාරමීගුණා, මේ දසපාරමී-ගුණයෝ; පූරිං, පරිපූර්ණ කොට; පූරතො [පූරෙන්තස්ස], පුරන්නාවූ; තෙ,

* ඇතැම් පොතක-බලන්නාවූ.

නුඹවහන්සේගේ; අනෙත, රූපවිභාවනාභාවයන්; පණිධිතො පට්ඨාය
ඉව, ප්‍රණිධියෙහි පටන් ගෙණ මෙන් (හෙවත්) ප්‍රණිධියෙහි පටන් ඉතා
මනහර කොට රූපකාය ද අශේෂසත්වහෘදයාණ්ගනාභි දැති කොට චි
ත්තය ද පිරුවා මෙන්; (නොහොත්) පණිධිතො පට්ඨාය, ප්‍රණිධියෙහි
පටන්; සුචිං, පවිත්‍ර කොට; පූරෙතො, පිරීම හෙතු කොට ගෙණ; තෙ ඉ
ව, දූත් මේ සශවිචානවිභාවයෙහි නුඹවහන්සේගේ උත්සාහයවයෙන් රූ
පකාය ද වක්‍ෂ්‍යමාණනුවයෙන් ධර්මකාය ද පිරුවා මෙන්; ජනතානං
අනෙත, ජනසමූහයන්ගේ උභයානවයන් *; පූරෙහතු, පුරන්වා, සම්පූ
ණ්ණ වූවවුන් සමෘද්ධ වූව වුන් කොරෙත්වා,

පනනූතනාරැතනාරදසා පණිධානබීජා
වෙනොධරාය කරුණාජලසෙකවුඩා·
සබ්බඤ්ඤුතඵලදා සත්වාටගුතතා
තං සම්පලං දියනු පාරමිතාලතා තෙ—71.

'තෙ පාරමිතාලතා කිම්බි හිමෙ වෙනොධරාය පණිධානබීජෙතනතදි'
වෙනොධරාය, සිත් නැමැති භිම්හි වූ; පණිධානබීජා, ප්‍රණිධි නැමැති බීජ
වටක් ඇති (නොහොත්) ප්‍රණිධි නැමැති බීජයා කෙරෙන්; පතනූතනාරැ
තනාරදසා, ප්‍රකාශිලතාව ගෙඩිසූරගවෂාදි උත්තරෙත්තරප්‍රවෘත්තිවට පැමි
ණෙන්නාක් මෙන් පැමිණෙනලද උත්තරෙත්තරප්‍රවෘත්ති ඇති(හෙවත්)
මතුමත්තෙහි උත්තමඋත්තමප්‍රවෘත්තිවට පැමිණියාවූ; කරුණාජලසෙක
වුඩා, සංසාරයෙහි දුග්ගන්නා සතුන් කෙරෙහි පහළාවූ කරුණායෙන් පා
රමිතාපූරණසාමර්ථ්‍යහෙයින් කරුණා නැමැති ජලයාගේ වත්කිරීමෙන් වැ
ඩුනාවූ; සත්වාටගුපනා, ප්‍රකාශිලතාවක් කරා ගවමහිෂාදීන් නොවැද්දදී
වැට කොට රක්නා මෙන් පාරමිතාලතාව කරා පාපගොමහිෂාදීන් නො
වැද්දදී සති නැමැති වැටින් රක්නාලද්දවූ; සබ්බඤ්ඤුතඵලද, සර්ව
ඥනාඥන නැමැති ඵලය දෙන්නාවූ (නොහොත්) සර්වඥතාඥනය හා
ලොකොත්තරඵලයන් දෙන්නාවූ; තෙ පාරමිතාලතා, නුඹවහන්සේගේ
පාරමිතා නැමැති ලතාතොමෝ; තං සම්ඵලං, ඒ යථොක්ත සර්වඥඵලය;
දියනු, තමා සෙවනය කළවුන්ට දේවා.

ආබොධිපුණ්ණමි පදිඤ්ඤිනාදිතො තෙ
සම්භාරසාලසිතපක්ඛකමාගිවුඩො
සම්පුණ්ණපාරමිගුණාමතරංසි තංව
සබ්බඪ්ගිඤ්ඤකුමුදානි පබොධයෙයය—72.

තෙ, නුඹවහන්සේගේ; පදිඤ්ඤිනාදිතො, දක්නාලද ආදිදිනයෙහි පට
න්; ආබොධිපුණ්ණමි, පූජ්‍යප්‍රබොධය ඇත්නාවූ (ද්වෙහෝ නොහොත්)
බොධිඥන නැමැති මැදිපොහොය දක්වා (නොහොත්) බුද්වූ මැදිපො

---

* ජනතානං අපෙඨ; ජනසමූහයන්ගේ උභයාර්ථයන්; යි ඇතම් පො
තක.

හොය දක්වා; සම්භාරකාලසිතපඞ්ක- කලාපසම්භරණකාලාවිකසිතපඞ්කජකලාප
සමයෙහි (දෝහෝ නොහොත්) බොධිසම්භාරසම්භරණකාලු නැමැති ශු
ක්ලපක්ෂයෙහි; කමලබන්ධුබො, ත්‍රිවිධයෙන් වැඩුනාවූ; සම්භරණ-බොධිස
ත්ත්වයන් (දෝහෝ නොහොත්) පිරිවරයින් වතලාවූ; පාරමිතාගණ-පර
මිශ්‍රගණ ඇත්තාවූ (දෝහෝ නොහොත්) පාරමිතාගණ නැමැති; උමිත
රංසි, පවත්නාවූ ශුධාංශමින් ඇතිහෙයින් (දෝහෝ නොහොත්) නිර්වා
ණරශ්මීනු ඇතිහෙයින් ශෝභනශ්‍රීය සිතියනලද වන්ද්‍ර නෙම; නාථ, ඉව,
භුබවනාථයේ මෙන්; සබ්බධම්-සියලු සත්ව නැමැති; කුමුදකුවදනි, කුමු
පුෂ්පයන් හා කෛරවපුෂ්පයන්; පබොධයෙය්‍ය, ප්‍රබොධ කෙරේවා (හෙව
ත්) නිර්වාණරශ්මිපශ්ශ් කිරීමෙන් සන්තෝෂ නිද්‍රායෙන් පිබිදා වා—
ප්‍රකෘතිවක්‍රියා ජනසාහා පත්‍රවු කොට පෙණුනුදවස් පටන් මැදිපො
හොය දක්වා ශුක්ලපක්ෂයෙහි ක්‍රමයෙන් වැඩි මුළුලොව අමෘතරශ්මිසාශ්‍රී
ය කරවා කුමුදකුමුද්පුෂ්පයන් ප්‍රබොධ කරන්නා මෙන් පාරමිතාගණව
න්‍ද්‍ර නෙම බුඩකාරකධම්මයන් කවුරු දෝහෝ සිපරීක්ෂා කොට දුටුවාවූ ආ
දිදිනයෙහි පටන් බුදවූ දිදීපංකරය දක්වා බොධිසම්භාර කල ශුක්ලප
ක්ෂයෙහි ක්‍රමයෙන් වැඩි මුළුලොව නිර්වාණබ්‍යාමෘතරශ්මිසංශ්‍රීය කර
වා භුබවනාථයේ ප්‍රබෙධනයලේ ද එපරිද්දෙන්ම සියලු සතුන් ප්‍රබොධ
කෙරේවයි යනු අභිප්‍රායයි.

මෙසේ සාමාන්‍යයෙන් දශපාරමිතානුස්මරණයෙන් භිතාශිංසනය කො
ට දන් විභාගයෙහියින් තදනුස්මරණයෙන් ආශිංසනය කෙරෙත්-

ආපච්ඡිමජ්භවිස්වපඵලලාභන්‍තා
දානප්පබන්ධමපි දානඵලප්පබන්ධං
සංවඩ්ඪයි තවමභිපත්ථනතො යමෙවං
ජනාතුත්තරුත්තරඵලං බහු සම්භුනාතු—73.

සඵං, භවතන්සේ; අභිපත්ථනතො, පැතුවාවූ ප්‍රණිධියෙහි පටන් (හෙව
ත්) ප්‍රාර්ථනායෙහි පටන්; ආපච්ඡිමභවසිවපඵලලාභන්‍තා, පශ්චිමභවයෙ
හි නිර්වාණඵලලාභය හා දානය දක්වා; දානප්පබන්ධං, දානපර
ම්පරාව ද *; අපි, නැවත; දානඵලප්පබන්ධං, දානඵලයාගේ පරම්පරාව ද;
යථා සංවඩ්ඪයි, යම්සේ වැඩූයේක් ද; එවං, එපරිද්දෙන්; ජනතු, සත්ව
යෝ; උත්තරුත්තරඵලං, උතුමන්තෙහි වැඩිවැඩිඵලයට; බහු, එකාන්ත
යෙන්; සම්භුනාතු, පැමිණෙත්වා.

ආරම්භතො පභුති යාව තවග්ගමග්ගා
විත්ථාලිතාඝකලුසං සුචි සීලතොයං
මෙත්තාදයාමධුරසීතලතාසුපෙතං
සොධෙතු තංව භවනිස්සිතජනතුමෙතං—74.

ආරම්භතොපභුති, ආරම්භයෙහි පටන් (හෙවත්) ප්‍රණිධියෙහි පටන්;
යාවගග්ගමග්ගා, අග්ගඵලමාර්ගය දක්වා; විත්ථාලිතාඝකලුසං, තදඝතිජක

---

* ඇතම් පොතක, දානපාරමිතාවද.

මහාණි විසින් ශුභ කරණලද සොඳ හරණලද පාපකාලුෂ්‍යයන් ඇති; දුව්, එහෙයින් ම පවිත්‍රවූ; මෛත්‍රාදයා-මෛත්‍රීකරුණා නැමැති මධුරසී තලනාය, මාර්ගඵලයන් හා ශීතලත්වයන් (හෙවත්) මෛත්‍රී නැමැති මිං බුයයෙන් හා කරුණා නැමැති ශෛත්‍ය ගුණයෙන්; උපෙතං, යුක්තවූ; තව සීලතොයං, නුඹවහන්සේගේ සීලපාරමිතා නැමැති ජලය; තං ඉව, නුඹවහන්සේ මෙන් නුඹවහන්සේ ශුභ කළා මෙන්; එනා භවනිස්සිතජ නාතං, මේ භව ශ්‍රිත වූ සත්වයන්; සොධෙතු, ශුභ කෙරේවා, පාපකාලුෂ්‍ය රහිත කෙරේවා.

ආපුච්ඡිවනතමිනිනික්ඛමණෙහි තෙසා
පඤ්ඤාය තම්පභාවතො පරිපුණ්ණගෙහා
එවං සබ්බපරිගහභතො අජ නික්ඛමන්තො
එවං ජනා භවදුඛා බහු නික්ඛමන්තු—75.

තං පහවතො පඤ්ඤය, ඒ දශපාරමිතාවන්ගේ ප්‍රභවස්ථානයෙහි පවත් පූරණය පිණිස සිහින් ඉවා යක්ජාතියෙහි පවන්; ආපුච්ඡිවනනං, පසුව්වාතවයෙහි අභිනිෂ්ක්‍රමණය දක්වා; පරිපූණ්ණගෙහා, සියලුගෙන් සම්පූර්ණවූ සම්බාධවූ ගෘහයෙන්; අභිනිෂ්ක්‍රමණසියොනා, අභිනිෂ්ක්‍රමණයෙන් විශිෂ්ට වූ නික්මීමෙහි අභියොගය (අභ්‍යාසය) හෙතු කොට ගෙණ; එවං, නුඹවහන්සේ; සබ්බපරිගහතො අපි, සිතුවූ භව නැමැති ගෘහයෙනුදු පවා; නික්ඛමිතෙජා, නික්මුණුසේක් ද; එවං, එපරිද්දෙන්; ජනා, සත්වයෝ; භවදුක්ඛා, සංසාරදුක්ඛයෙන්; බලු, එකාන්තයෙන්; නික්ඛමන්තු, නික්මෙත්වා.

එකග්ගතොපලතලෙ නිසිතාචිරං හි
ධාරා සුචිත්තසුඵලෙ සතිදණ්ඩබද්ධෙ
නිබ්බිජ්ඣි ලක්ඛණධනුස්සි සනාතිලක්ඛං
ඛිත්තා තයෙවමනුපස්සඛ තුජනාතුඛිත්තා—76.

සතිදණ්ඩබද්ධෙ, සරණය පිණිස ගවණය පිණිස (දේහෝ නොහොත්) සති ප්‍රබන්ධ නැමැති දණ්ඩනි බඳනාලද නිඳුවනලද; සුචිත්ත-ඉතා පිරිතුරුවූ (දේහෝ නොහොත්) සොභනවූ සිත් නැමැති; උපුඵලෙ, ශීතලමුවෙහි; ධීධාරා, හැම කල්හි ව තියුණුබව ධරන්නාවූ ධාරා (දේහෝ නොහොත්) ප්‍රඥා නැමැති ධාරා ඇතිව; එකග්ගතො, ඒක්ව යාමෙන් පැවැත්මෙන්; උපලතලෙ, සිලාතලයෙහි; (නොහොත්) එකගතා උපලතලෙ, සමාධි නැමැති සලකැටෙහි; * චිරං, නො එනාක් කලක් ශතසහස්‍රාධික චතුරසඛ්‍යකල්පකාලාබ්‍ය බොහෝකලක්; නිසිතා, ගහා තියුනු කරණලද්දී; ලක්ඛණධනුස්සි, ලක්ෂණසම්පන්නවූ (දේහෝ නොහොත්) ත්‍රිලක්ෂණ නැමැති දුන්නෙහි පිහිටිමි ඇති; තයො ඛිත්තා, නුඹවහන්සේ විසින් හරණලද්දී; සං, සවකීයවූ; තිලක්ඛා, ලක්ෂණයන්; (දේහෝ නොහොත්) තිලක්ඛං, අනිත්‍යාදි තුන්පරිද්දෙන් ලක්ෂ්‍යවූ ද

* ඇතම් පොතක-සලවටෙහි,

හසුතුවූ; සං, අනාවිය පච්ඡාකඩ්ඪකඛිතනවූ කාශ; (නොහොත්) සනාථී ලංකාබං, නිවන් නැමැති ලංකා; නිබ්බජ්ඣි, තමාගේ වද්දෙද; එවං, එපරිද්දෙන් ම; ජනතුකිනනා, සත්වයන් විසින් ද හරණලද්දී; අනුවිජ්ඣතු, ඒ අනුව විදීවා ---- ඒ යොධවූ නුඹවහන්සේගේ පුෂ්පශරය විද්ද බලා න දනුසාරයෙන් ජනතූන්ගේ පුෂ්පශර ද එකීට විදීවා.

> ත්වං පාරමීජලනිධිං චතුරිද්ධිබාහු
> සන්තිණ්ණ උත්තරි චිරං ජනකොව සින්ධුං
> සම්පත්තනාවිකතාමප්පලොයි යථා ච සොව
> එවං ජනා විරියතාපලමේධයන්තු—77.

ජනකො, ජනකරජනු; සින්ධුං ඉව, සාගරය මෙන්; ත්වං, නුඹවහන් සේ; පාරමිජලනිධිං, පාරමිතා නැමැති සාගරය; චතුරිද්ධිබාහුසන්තිං, චතුවීධවීර්‍ය නැමැති සතරගානයෙන්; චිරං, ලක්‍ෂාධිකචතුරසඞ්ඛ්‍යකා ලයක් මුළුල්ලෙහි; යථා සුතරි, තමාගේ මනා කොට පිනූ සේක්ද; සො ඉව, ඒ ජනකයා මෙන්; යථා සම්පතනාවිකතාමප්පලො ච ආසි, තමාගේ පැමිණෙනලද විශිෂ්ටඵලත් ඇතිවූ සේක්ද; එවං, එපරිද්දෙන්; ජනා, සත්වයෝ; විරියතාපඵලං, වීර්‍ය ද වීර්‍යඵලය ද; එධයන්තු, වඩත්වා.

> සත්තාපරාධදහනෙසු චිරං සුධන්තං
> ඛන්තිසුවණ්ණ කතරූපසමන්තිවතතා
> සබ්බාපරාධමසහි ත්වමසය්හමෙවං
> සබ්බෙ ජනාපි ඛමණෙන භජන්තු සන්තිං—78.

සත්තාපරාධදහනෙසු, සත්වයන් නුඹවහන්සේට කළාවූ අපරාධ වැනි වූ (නොහොත්) අපරාධ නැමැති වහනිපුටයෙහි; චිරං, ලක්‍ෂාධිකචතුරසඞ්ඛ්‍යකල්පකාලාධ්‍ය බොහෝ කාලයක් මුළුල්ලෙහි; සුධන්තං, මනා කොට දවනලද; ඛන්තිසුවණ්ණ–එහෙයින් ම කම්ෂාව වූ සුවර්ණයෙන් (දේහෝ නොහොත්) ක්‍ෂාන්ති නැමැති ඝනසානකයෙන්; කතරූපසම–කරණලද රූපයක් හා සදෘශවූ; (නොහොත්) ඛන්තිසුවණ්ණ–ක්‍ෂාන්ති සද්ගුණයෙන් ම; කතරූපසම–විමනලද රූපයක් වැනිවූ; අනන්තිමන්තනා, පශ්චිම ආත්ම ඇති; ත්වං, නුඹවහන්සේ; අසය්හං, අන්‍යසිවත්නු විසින් ස හනය කොට නොහැක්කාවූ; සබ්බාපරාධං, සියලු අපරාධ තාක්; අසහි, යම්සේ ඉවසා සළ සේක් ද; එවං, එපරිද්දෙන්; සබ්බෙ ජනාපි, සියලු ජ නයෝ ද; ඛමණෙන, ක්‍ෂමා කිරීමෙන්; සන්තිං, ශාන්තිය; භජන්තු, භජ නය කෙරෙත්වා.

> ලක්ඛාධිකං චතුරසඞ්ඛියකප්පකාලං
> සච්චෙන සුද්ධ පරිභාවිතවාචිකො තෙ
> වාචාය සච්චසුසිතාය සමෙන්ති පජානු
> එවං විසුද්ධවචනා ජනතා භවන්තු—79.

ලක්ඛාධිකං, ලක්‍ෂයක් අධික කොට ඇති; චතුරසඞ්ඛියකප්පකාලං, ච තුරසඞ්ඛ්‍යකල්පකාලයක් මුළුල්ලෙහි; සච්චෙන, සත්‍යගුණයෙන්; සුද්ධ,

අතිශයින්; පරිභාවිතවාචිනො, ගල්වනලද පුරුදුකරනලද වාසනා ඇති;
තෙ, නුඹවහන්සේගේ; සබ්බඤ්ඤුතාය, සර්වඥතා නැමැති සප්‍රභාවය
ඇති පනස් ඇති; වාචාය, වාග් අනනාව හා; ජනතා, සත්වයෝ; සමෙනති,
සම්යේ එක්වෙද්ද සමගියය මතරෙද්ද; (නොහොත්) සබ්බඤ්ඤුතාය, ස
තඃ නැමැති ජලබිඳු ඇති සැබැදියබිඳු ඇති; වාචාය, වාග් අනනාව
කාරණ කොට ගෙණ; ජනතා, සත්වයෝ; සමෙනති, ආනවදුහය ද හෙල
ශදහය ද සම්යේ සන්සිඳුවද්ද; (නොහොත්) සබ්බඤ්ඤුතාය, සර්වඥ
ය විසින් සපශී කරනලද්දාවූ (නොහොත්) චතුරාර්‍ය්‍යසත්‍යයන් සපශීය
කරන්නාවූ (නොහොත්) ප්‍රකාශ කරන්නාවූ; වාචාය, වචනය කාරණ
කොට ගෙණ; ජනතා, සත්වයෝ; සමෙනති-[සං එනති], සම්යේ නිවන්
ණයට පැමිනෙද්ද; එවං, එපරිද්දෙන්; ජනතා, සත්වයෝ, විසුඩවචනා,
පිරිසිදුවූ පිරිසිදු කරන්නාවූ වචනයන් ඇත්තානු; භවන්තු, වෙත්වා.

ඤාදිතානධම්මමක්ඛයං පිරඤ්ඤපපතිඤා
ධ්ඣානපාරම්මහාවජිරඤ්ඤි තුයහං
සතෙතන කෙනාපි යථා හි අභෙජ්ජනෙයෙජා
එවං ජනාපි කුසලෙසු අධිඣ ගහන්තු—80.

තුයහං, නුඹවහන්සේගේ; ආදිනානු-ගන්නාලද සමාදන්වනලද; ධ
ම්මචනියං, සමනාවප-පිවිතෙහි (දේහෝ නොහොත්) කුශලධම්ම නැමැ
ති පොලොවෙහි; පිරඤ්ඤප්පතිඣා, හරුම් සුපිහිටියාවූ; අධිඣානපාරම්-පිහි
ටිමෙන් උත්තමගාවයට ගියාවූ (දේහෝ නොහොත්) අධිඣානපාරමිතා
නැමැති; මහාවජිරඤ්ඤි, මහත්වූ හෝ පූජාවජ්‍ර පර්වතය තොම; කෙනාපි
සතෙතන, කවරත්සතෙකු විසින්; යථා, සම්යේ; අභෙජ්ජා, බිඳ පිය
නොහැකි ද; අනෙජෙජා හි, බිඳ පියන්නා තබා සොලවා පියන පමණ
කුත් නොහැකි ද; එවං, එපරිද්දෙන්; ජනාපි, සත්වයෝ ද; කුසලෙ,
කුශලයෙන්; සු අධිඣහන්තු, මිනා තොට ඉටත්වා; (නොහොත්) කුසලෙ
සු, කුශලධම්මයෙන්; අධිඣහන්තු, පිහිටත් වා.

ත්වං සබ්බසත්තාචිරකාපිතමෙත්තචිත්ත
තොයෙ ඝ සංසම්තනකොධමහාහුතාසො
ලොකුත්තර නනාදිතාරං හිතමාවහිතෙහි
එවං ජනෙසු ජනතා හිතමාවහන්තු—81.

ත්වං, නුඹවහන්සේ; සබ්බසත්ත-සත්නාහිතමැදහන් හැම සතුන් කෙරෙ
හි; චිර-කප්පකෙළගණනිනුදු පමණ නො කොට ගත හැක්කාවූ බො
හෝ කාලයක් මුඑල්ලෙහි; භාවිත-බවනලද; මෙත්තචිත්ත-මෙත්සිත්
නැමැති; තොයෙන, ජලයෙන්, සංසමිත-විශෙෂයෙන් නිවනලද; කො
ධ-ප්‍රතිඝ නැමැති; මහාහුතාසො, මහාවහනිශාකඩය ඇති සේක් ද;
ලොකුත්තරං, ලොකොත්තරවූ ද; නදිතාරං, ලොකිකවූ ද; හිතං, අප
මණගිත; ආවහිසො, සියලු සතුන්ට එලවූ සේක් ද; එවං, එපරිද්දෙන්;
ජනෙසු, ජනයන් කෙරෙහි; ජනතා, ජනසමූහයෝ; හිතං, හිතයක්; ආව
හන්තු, එලවත් වා,

මිත්තාපකාරපටිපක්ඛිජනාපකාරෙ
ඛන්තිංනිබ්බිකාරමනසො චිරභාවනාය
පත්තොසි ලාභපභුතීස්වපි නිබ්බිකාරං
එවං ජනානුනයකොපපහූ භවන්තු - 82.

එවං, තුඹවහන්සේ; මිත්තාපකාරපටිපක්ඛජනාපකාරෙ, මිත්‍රයන්ගේ උපකාරයෙහි හා අමිත්‍රයන්ගේ අපකාරයෙහි; නිබ්බිකාරමනසො, විකාරයක් නැත්තාවූ මධ්‍යස්ථාකාරයෙන් පැවැත්තාවූ සිත්හුගේ; චිරභාවනාය, බොහෝකලක් වැඩීම හෙතු කොට ගෙණ; ලාභපභුතීස්වපි, ලාභාලාභාදී අෂ්ටලොකධර්මයෙහි; නිබ්බිකාරං, විකාරරහිත බවට මධ්‍යස්ථ බවට; පත්තො අසි, යම්සේ පැමිණියේක් ද; එවං, එපරිද්දෙන්; ජනා, සත්වයෝ; අනුනයකොපහූ, ඉෂ්ටානිෂ්ටලාභාලාභාදියෙහි මමායනය හා කොධය (හෙවත්) තෘෂ්ණාවෙෂ දෙක නැසූවානු (හෙවත්) මධ්‍යස්ථාකාරයෙන් පැවැත්තානු; භවන්තු, වෙත්වා.

සම්පුණ්ණහෙතුවිභවො තුසිතෙ විමානං
යුත්තං ගුණෙහි නවභිපදවිවිමානං
එවංවිධපාරමිධිරොහිණියා තිලොකො
ආරොහතූභයසුඛං පදවිම්මානං—83.

සම්පුණ්ණ - සම්පූර්ණවූ; හෙතුවිභවො, ආරොහණහෙතු හා වස්තූන් ඇතිව (ද්වේහෝ නොහොත්) කුශලහෙතූන්ගේ විවිධප්‍රකාරයෙන් වැඩීම ඇතිව මුළුලෝ හෙතුසම්පත් ඇතිව හෝ; ගුණෙහි යුත්තං, භූම්‍යාදි කොට්ඨාසයෙන් හෝ සාවගුණයෙන් හෝ යුක්තවූ; තුසිතෙ විමානං, තුසිතභවනයෙහි වූ විමානයට ද එයින් වූනම පශ්චිමාත්මභාවයෙහි; දසපාරමි - විශිෂ්ටපාරමිතා නැමැති; අධිරොහිණියා, උඩට නගිණියට හෙතු වූ නිශ්‍රෙණියෙන් (හෙවත්) සමතිස්පැරුම් නැමැති සමතිස් සොපානපංක්තිමාලායෙන් පියගැට පන්තින් කරණකොට ගෙණ; නවභි ගුණෙහි යුත්තං, නවමාලකින් යුක්තවූ (ද්වේහෝ නොහොත්) අශීත්‍යාදිනවගුණයෙන් යුක්තවූ; පදවිම්මානං, සර්වඥපදවි නැමැති ප්‍රාසාදයට; එවං ඉව, තුඹවහන්සේ මෙන්; තිලොකො, තුන්ලෝවාසී තෙම; උභයසුඛං, ලෞකිකලොකොත්තරසුඛමය ම ඇත්තාවූ; පදවිම්මානං, ලෞකිකලොකොත්තරස්ථානාන්තර නැමැති මාළිගාවට; ආරොහතු, නැගේවා.

- දැන් ප්‍රස්තුතවූ නවවිධගුණයෙන් ආශිංසනය කෙරේත්.

එවං වෙ රහංසි සම්බුජ්ඣි යථා ච සම්මා
සම්පණ්ණවිජ්ජචරණො සුගතොසි ගොනතු
ලොකං විදූ පුරිසදම්මසාරථීසි
සත්ථාසි බුජ්ඣි භගවාසි තථෙව ජනාතු—84.

එවං, තුඹවහන්සේ; වෙ, එකාන්තයෙන්; යථා ච අරහං අසි, යම්සේ අර්හත් වූයේක් ද; (හෙවත්) කෙලශාරීන් හා සංසාරචක්‍රාරයන් නැසූහෙයි

න් ද පාපයන් කෙරෙන් හා අසත්පුරුෂයන් කෙරෙන් දුරින් දුරුවූ හෙයින් ද සත්පුරුෂයන්ට සමීපහෙයින් ද පූජාවට අර්හ හෙයින් ද එහෙයින් ච ලෝකයා විසින් පුදනලද හෙයින් ද පාපයෙහි රහසක් නැතිහෙයින් ද සත්පුරුෂයන් කෙරෙන් පරිත්‍යාගයක් නැතිහෙයින් ද අර්හත් නම් වූ සේක්දැයි සේයි; සම්මා, සර්වධර්මයන් සරසලක්ෂණප්‍රතිවේධවශයෙන් මනා කොට; සං අබුජ්ඣි, ස්වයං විචිතොපචිතපාරමිතානුභාවස්වයම්භූඥානයෙන් ඔම්සේ දත් සේක් ද (නොහොත්) දිනකරකිරණසමාගමයෙන් විකසිතවූ පදුමයක් මෙන් අර්හද්මාර්ගඥානසමාගමයෙන් ඔම්සේ විකාශයට පැමිනි සේක් ද (නොහොත්) සම්මොහනිද්‍රාවෙන් අතිශයින් පහවූ සේක්ද; සම්පන්නෝ—සම්පූර්ණවූ; විජ්ජාචරණෙ ආයි, ත්‍රිවිද්‍යා හා අෂ්ටවිද්‍යා හා පසළොස් චරණධර්මයන් ඔම්සේ ඇතිසේක් ද; සුගතො ආයි, සුන්දරස්ථානයට ගියහෙයින් ද සංසාරයෙන් මනා කොට ගිය හෙයින් ද සර්වඥත්වබොධිඥානයට සම්යග්ගත හෙයින් ද ආත්මසුඛපරසුඛසම්පාදන පිණිස මනා කොට ගිය හෙයින් ද මනොඥ වූ ගමන් ඇතිහෙයින් ද මනාවූ වචන ඇති හෙයින් ද ඔම්සේ සුගත නම් වූ සේක් ද; ලොකං විදෙ, සත්වසංස්කාරවකාශලොකත්‍රය ආශයානුශයාදි ආහාරවෘත්‍යාදි ආකාරවිස්තාරාදිවශයෙන් ඔම්සේ නුඹවහන්සේ දත් සේක්ද; පුරිසදම්ම—යම්සේ පුරුෂ නැමැති දම්‍යයන්ට; සුසාරථී ආයි, මනාවූ නිරුත්තරවූ සාරථිවූ සේක් ද; (නොහොත්) පුරිසදම්ම—දම්‍යපුත්‍ර සත්වයන්; සුසාරථී ආයි, ඒකම අස්නෙත්තිද දශදිශාවෙහි දිවන්නට නිසිවිසින් මනා කොට දැමූ සේක් ද; සත්ථා ආයි, ඔම්සේ නුඹවහන්සේ දිව්‍යබ්‍රහ්මාදි සියලු සත්වයන්ට ඓහලෞකිකපාරලෞකිකලොකොත්තරාර්ථයෙන් අනුශාසනා කරණ සේක් ද; (හවද) සාර්ථවාහයෙකු මෙන් විනෙයසත්වයන් සංසාරකාන්තාරයෙන් එතර කොට නිර්වාණක්ෂෙමභූමියට පැමිනවූ සේක් ද; බුද්ධො, ඔම්සේ නුඹවහන්සේ චතුස්සත්‍යාවබොධ කළසේක් ද සත්වයන් ලවා කරවූ සේක් ද; භගවා ආයි, ඔම්සේ නුඹවහන්සේ පූජ්‍ය හෙයින් ද පිනැති හෙයින් ද භක්තවූ ජනයන් ඇතිහෙයින් ද මනොඥවූ ගුණයන් භජනය කළහෙයින් ද ධර්මසංවිභාග කළහෙයින් ද සියලු පාපයන් බිඳිහෙයින් ද කීර්තිසම්පද්ධර්මශ්‍රීකාමප්‍රයත්නාධ්‍යභගයන් ඇති හෙයින් ද භවයෙහි වාන්තගති ඇති හෙයින් ද භගවත් නම් වූ සේක්ද; තථෙව, එසේ ම; ජනතු, සත්වයෝ ද; හොන්තු, වෙත්වා.

සච්චිත්තභූතිදහිතං ජනතාය තුය්හං
කාලඤ්ඤවණ්ණරතනං නවපාරිගිතතං
දුක්ඛග්ගිඝොරජලුපද්දුතපාණිගෙහෙ
තස්සා සුඛමහවතු ජීවිතුමාපදාය—85.

ජනතාය, ජනසමූහයා විසින්; සච්චිත්ත—නිධානයට නිසිහෙයින් සොභනවූ (නොහොත්) ස්වකීයවූ සිත් නැමැති; භූතිදහිතං, භූමියෙහි නිධා

නා කාරණලද; නවරත්නාභිධානා, නවරත්නයෙන් භෙදයට පැමිණියාවූ නව භෙදයක් ඇති; භවතං, නුඹවහන්සේගේ; සලක්ෂණවර්ණ-මනොඥවූ වර්ණයන් ඇති (හෙවත්) පැහැ හෝ ප්‍රශංසා ඇති (නොහොත්) මනොඥවූ ගුණ නැමැති; රතනං, රත්නය (හෙවත්) තම්‍යවූ කුශලචෙතනාව දනාදිකුශලකාරණයට බාධකවූ; දුඃඛ-අපායදුඃඛයෙනදුඃඛ නැමැති; අශනිඝොරජලඋපද්දූත-ගිනිය සොරුන් දියය යන මෙයින් උපද්‍රුතවූ; ජාතිගෙහෙ, භව නැමැති ගෙහි; ආපදං, නිධානගතවස්තුවක් විනාශගහනවස්තුවිනාශාඛ්‍ය ආපදයන් මෙන් චක්ෂුශ්‍රොත්‍රාදිවාමාදිකාරයන් හෙතු කොට ගෙණ සිඩ වන්නාවූ ද ආරෙගනාදිභාවයෙන් සිඩවන්නාවූ ද කුශලරත්නයාගේ අභාවාඛ්‍ය ආපදයක් ඇතිකල්හි (නොහොත්) දුඃඛානුභවාදිය යි කියනලද විපත්තියෙහි; තස්සා, අනෙකොපද්‍රවොපද්‍රුත ජාතිගෙහයෙහි ආපදපත්නවූ ඒ ජනතාවට; සුඛං ජීවිතුං, සුවසේ ජීවත් වනු පිණිස; භවතු, වෙවා ස්මියේ ජනයා විසින් ගෙය ගිනිගත් කල සොරුන් ගේ අත ගා ගත් කල ගම්වොලොගත් කලු ගාවතුරෙන් ගිය කල ජීවත් වම්හයි කියා නිධාන කරණලද නවරත්නජාතිය එබඳු ආපදයක් පැමිණි කල්හි ජීවත්වීම පිණිස වේ ද එපරිද්දෙන් නුඹවහන්සේගේ නවගුණ නැමැති නවරත්නය ජනතාවිසින් තමන්ගේ සිත් නැමැති පොළොවෙහි නිධාන කරණලද්දේ දුක් නැමැති ගිනිබිය සොරබිය දියබිය යන මෙයින් පීඩිතවූ භවගෙහයෙහි එබඳු ආපාදයෙහි ජනතාහට සුවසේ ජීවත්වනු පිණිස වේවයි යනු අභිප්‍රායයි.

වාචාවිචිත්තවර*නත්තුගතාභිකණ්ඨ
සබ්බමුත්තසගුණමහාරතනාවලි තෙ
වෙවණ්ණියත්තහි භවං සකලම්පහාය
හොතං ජනස්ස සිරිසගම්මහාය—36.

තෙ, නුඹවහන්සේගේ; වාචා [වචු]-වාචා නම් ස්ත්‍රියගේ (ද්‍රෙහෝ නොහොත්) මාස් නැමැති; විචිත්ත-නිරුපිතාදිවනයෙන් (ද්‍රෙහෝ නොහොත්) සංස්කෘතමාගධාදිවශයෙන් විසිතුරුවූ නානාප්‍රකාරවූ; වර-රත්නයොගයෙන් හෝ ගුණයොගයෙන් උතුම් වූ; තන්තුගතා, තන්තුවට පැමිණියාවූ හුය අමුනනලද; අභිකණ්ඨ-ආමුත්ත-සබ්ඛන්ගේ ග්‍රීවායෙහි බහා ලනලද; සගුණ-වරතන්තුගත හෙයින් ම සොභනවූ බන්ධන ඇති (ද්‍රෙහෝ නොහොත්) සොභන ගුණ නැමැති; මහාරතනාවලී, මහත්වූ (ද්‍රෙහෝ නොහොත්) පූජ්‍යවූ නවරත්නයන්ගේ වැල (හෙවත්) රුවන්සොළුව; අත්තනි භවං, ශරීරයෙහි (ද්‍රෙහෝ නොහොත්) නාමකාය රූපකාය දෙකෙහිම හෝ වූ; සකලං වෙවණ්ණියං, ශරීරවිරූපතා ශරීරනෙලශවිරූපතාවශයෙන් සියලු වෛවර්ණ්‍යය; පහාය, දුරු

* අප විසින් සොයා ගත් සියලු ම පොත්හි-වාචාවිචිත්තවගුන්තනා, යන පාඨය ම තිබේ.

කොට; ජනස්ස, ජනයාගේ; සිරිසඞ්ගමමඞ්ගලාය, ශ්‍රීසඞ්ගමය හා එක්වී වෙති මඞ්ගල පිණිස (ද්‍රෝහ නොහොත්) සොභාසම්පත්තීන් හා එක්වීමෙන් වූ අභිවෘද්ධිය පිණිස; හොතු, වේවා.

තං සඞ්ඝගුණපච්චවදීඝසුතිප්පණාලි
නිස්සන්දමානගුණනීරනිපාතනිත්තා
ඛෙත්තත්තසඤ්ඤිනි ජනා කතලොමහංස
බීජඞ්කුරී කුසලසස්සඵලං ලභන්තු—87.

තං සඞ්ඝගුණපච්ච-නුඹවහන්සේගේ ශොභනවූ ගුණසනාව නැමැති; දීඝ-විල්හි පිහිටියාවූ; සුති-කණ්ණ නැමැති; පණාලි-නාලින් (හෙවත්) වාරිමාර්ගයෙන්; නිස්සන්දමාන-වැහෙන්නාවූ; ගුණනීර-ගුණ නැමැති ජලයාගේ; නිපාත-හීමෙන්; නිත්තා, තෙත්වූ; අත්තසඤ්ඤිනි, ආත්ම සංඥ ඇති (හෙවත්) ආත්ම නැමැති; ඛෙත්තා, ක්ෂෙත්‍රයෙහි; කත-කරණලද (හෙවත්) වපුරණලද; ලොමහංස-ලොමහර්ෂ නැමැති (හෙවත්) ලොමහර්ෂොත්පත්තියට හෙතුවූ ප්‍රසාදසහිතකුශලචෙතනා නැමැති; බීජඞ්කුරී, බීජයන් සහිත අඞ්කුරයන් ඇති; ජනා, සත්වයෝ; කුසලසස්සඵලං, කුශල නැමැති ශස්‍යයන්ගේ ඵලය විපාකය; ලභන්තු, ලැබෙත්වා, පැමිණෙත්වා —— නානාප්‍රකාරයෙන් ගායනා කරන්නාවූ ගුණසනාවයෝ මධුරජලයෙන් පිරුණාවූ විල්වැන්නහ එහි යොමුවූ කණ්ණයෝ විල්හි එබූ නලවැන්නහ එයින් මනොවාරයට හමුවන්නාවූ ගුණයෝ නලින් වැහෙන්නාවූ මධුරජල වැන්නහ ඒ ගුණෙන් තෙමාලොස් වන්නාවූ ආත්මයෝ දියහීමෙන් * තෙත්වන්නාවූ කුඹුරු වැන්නහ ඒ ශරීරයෙන් ප්‍රාසාදයෙන් හඬමත් ලොමකූපසහිතවූ ලොමයෝ කුඹුරෙහි වපුරණලද බීජයන් සහිතවූ අඞ්කුරයන් වැන්නාහුයි මෙහි බීජයන් සහිත අඞ්කුරයන්ගේ ආකෘතිය ඇති හුඹුවන් ලොමකූපයන් සහිත ලොමයන්ගේ ඒ හර්ෂොත්පත්තියට හෙතුවූ ප්‍රසාදයෙන් වූ ප්‍රසාද සහ චරිත කුශලය ජන්‍ය ජනක දෙදෙනාගේ අභෙදොපචාරයෙන් ලොමහර්ෂ යයි ගෙණ බීජයන් සහිත අඞ්කුරගුණාරොපිත හෙයින් ප්‍රසාදයෙන් උපන් ප්‍රසාදසහචරිතවූ ප්‍රවෘත්ති කුශලචෙතනාවෝ බීජයන් සහිතවූ අඞ්කුරයන් වැන්නහ ආසෙවනප්‍රත්‍යලාභයෙන් බලවත්වූ කුශලචෙතනාවෝ අඞ්කුරයන්ගේ පරිණතභාවයෙන් වූ ශස්‍යයන් වැනිවූවාහු ඵල දෙන්නාහයි-'කුසලසස්සඵලං' යි කියනලදී.

ආපායිකප්පභුතිදුක්ඛනිදාඝකාල
සන්තාපිතා නිඛිලලොකමනොකදම්බා
තාවණ්ණමෙඝවුස්සනා ගසනාඩකුරෙහි
දුඩා භවන්තු මතිවල්ලරිවෙල්ලිතා තෙ—88.

ආපායිකප්පභුතිදුක්ඛ-ආපායිකාදිදුඃඛ නැමැති; නිදාඝකාල-ග්‍රීෂ්මකාලයා විසින්; සන්තාපිතා, තවනලද; නිඛිලලොකමනොකදම්බා, සමයත

* පිමෙන්.

ලොකයාගේ සිත් නැමැති යම් කදම්බවනයක් නොනෙක් ඇද්ද; තෙ, ඔනු; තංවණ්ණ-නුඹවහන්සේගේ ගුණ නැමැති; මෙඝඤ්ඤනා, මෙඝයාගේ සපශී කිරීමෙන් වූ (නොහොත්) නිඛිලලොකම්නොකදම්බා, සමස්ත ලොකයාගේ සිත් නැමැති කදම්බවෘක්ෂයෝ; තෙ, නුඹවහන්සේගේ; තංවණ්ණ මෙඝඤ්ඤනා, ඒ යථොක්තගුණ නැමැති මෙඝයාගේ සපශී කිරීමෙන් වූ; හසනඞ්කුරෙහි, සතොතාසාඞ්කුරයෙන්; ඉධා, සම්‍බද්ධවූවානු; මිතිවලලරිවෙල්ලිතා, ප්‍රඥලතාව විසින් වෙළඳනාලද්දානු; භවනතු වෙත්වා—රූපකාලශ්‍රිය නවගුණයෙහි ඇතුළත් හෙයින් යථොක්තවාර්‍යත්ගේ වශයෙන් ද වස්තුවාර වශයෙන් ද වණ්ණමෙඝසපශීන දතයුතු.

හෙතුද්දයාලඞ්කතභාසමාවෙසිතං තෙ
සබ්බඤ්ඤු සන්තානිතමාවහනෙන සිද්ධං
විඤ්ඤාපටීනිගමානුභාවවිභාවනං තං
භූතානමත්ථු චරිතබ්භුතමප්පසිද්ධං—89.

තෙ, නුඹවහන්සේගේ; යං, යම් චරිතාද්භූතයක් තෙම්; හෙතුද්දයාලඞ්කදයා-හෙතු අවස්ථා ඵලාවස්ථා දෙක්හි; සමං අවෙක්ඛිතං, ගුණාධිකයයෙන් තුම්කම්පාදිය දෙතන්හි ම පැවැති හෙයින් සමව සිටියේද; (නොහොත්) සං අවෙක්ඛිතං, මනාව ප්‍රබන්ධයෙන් හෝ පැවැත්තේ ද; සබ්බඤ්ඤු, ප්‍රණිධියෙහි පටන් පරිනිර්‍වාණය දක්වා ද එනැන් පටන් පංචසංවත්සරසහස්‍රාන්තය දක්වාද හැමතැන්හි; සන්තානිතමාවහනෙන, සත්වයන්ට හිතඵලවිමෙන්; සිද්ධං, නිපන්ද; විඤ්ඤාපටීනිග-විඤ්ඤාපථය ඉක්මූනාවූ සිතා නිමවා ගත නො හැක්කාවූ; අනුභාවවිභාවනං, අනුභාවවතිමය ප්‍රකාශ කෙරේ ද; තං චරිතබ්භූතං, ඒ චරිතාද්භූතය චරිතයෙන් වූ අද්භූතය (නොහොත්) අද්භූතවූ චරිතය; භූතානං, සත්වයන්ට; අප්පසිද්ධං, ඉෂ්ටාර්‍ථසිද්ධිය පිණිස; අත්ථු, වේවා.

දැන් චරිතාද්භූතයන් සිහි කිරීම පිණිස ආශිර්‍වාදයක් දක්වත්-

අභාරකාසුම්භිලක්ඛිය දූනකාලෙ
ගත්තත්තනො පදපටිච්ඡකපඞ්කජා ච
ජාතක්ඛණෙ තව පදෙ ධතමුක්ඛිතත්වා
පඞ්කෙරුහං සිවමධුං සරතං දදන්තු—90.

අනාරකාසුං, අභූරුරසට (නොහොත්) අභූරුවලට; අකිලක්ඛිය, පෑගා; ගන්තත්තනො, ඛදිරඞ්ගාරජාතකයෙහි ගත්තායාගේ ද සසජාතකයෙහි ආත්මයාගේ ද; තව, නුඹවහන්සේගේ; දූනකාලෙ, දෙනසමයෙහි; පදපටිච්ඡක, පාදයන් පිළිගත්තාවූ; පඞ්කජා ච, සත්බුමු මහාපද්මයෝ දෙදෙන ද; තව ජාතක්ඛණෙ, පශ්චිමජාතියෙහි නුඹවහන්සේ උපන්කෙණෙහි; උක්ඛිත්වා, පොළොව පළා පැන නැගී; පදෙ ධතං, පාදයන් දැරූවාවූ; පඞ්කෙරුහං ච, සත්බුමු මහපියුම ද යන මොහු; සරතං, තමන් සරා ඵලකියවුන්ට (නොහොත්) සිහිකළවුන්ට; සිවමධුං, කල්‍යාණමධුම

(නොහොත්) නිර්වාණමාවූව; දදන්තු, දෙත්වා ——— මෙයින් ජන්මාන්ත රයෙහි පාරමිතාපූරණවශයෙන් පැවැති චරිතාද්භූතයන් ද පශ්චිමභවයෙ හි ජන්මක්ෂණයෙහි වූ චරිතාද්භූතයන් ද උපලක්ෂණය කෙරෙත්-

සාවෙච්චනා මිච්ඡපතිට්ඨිතව ක්ඛධාරා
සන්තෙන දයාය තව වස්සිතවස්සධාරා
ගිම්හෙ ජනස්ස සමයිංසු යථා තථා තා
ධම්මම්බුවුට්ඨිව සමෙන්තු කිලෙසදාහෙ—91.

සන්තෙන, සත්ත්වයන්හට කෙරෙහි; දයාය, කරුණායෙන්; සවෙච්චන, ස ත්‍යවචනය හෙතු කොට ගෙණ; මිච්ඡපතිට්ඨිත-මත්‍යයරාජවූ නුඹවහ න්සේ විසින් වස්සවනලද; වස්සධාරා, වර්ෂාධාරාවෝ ද; (එසේ ම සැවක රුණාවෙන්) තව, නුඹවහන්සේ විසින්; වස්සිත, වස්සවනලද; වස්සධා රා, වර්ෂාධාරාවෝ ද; ජනස්ස, සත්ත්වයන්ගේ; ගිම්හෙ, ග්‍රීෂ්මයන්; යථා සමයිං සු, යම්සේ සන්හිඳුවූ ද; තථා, එසේ ම; තා, ඒ වර්ෂාධාරාවෝ; කිලෙසද ගහ, ක්ලෙශදාහයන්; ධම්මම්බුවුට්ඨිවසං එන්තු, ධර්මජලවර්ෂාවගේ වශයෙ ට පමුණුවත්වා; (නොහොත්) ධම්මම්බුවුට්ඨි එව, ධර්ම නැමැති ජලවර්ෂා වෙන් ම; සමෙන්තු, සන්සිඳුවත් වා ——— මෙයින් හෙතු අවස්ථාඵලඅව ස්ථාවශයෙන් පැවති චරිතාද්භූතයන් උපලක්ෂණය කෙරෙත්.

දැන් මෙතැන් පටන් ගාථා පසකින් පරිනිර්වාණයෙන් මැත සත්ත්වයි නාවහවූ චරිතාද්භූතයන් තත් සදෘශවූ පූර්වචරිතයන් හා එක්කොට අනු ස්මරණය කිරීමෙන් ගිත පතුරුවත්-

ඡද්දන්තනාගපතිනා බමතාපරාධං
ඡෙත්වා කරෙ ගහිතදන්තවරංව එද්දං
ලොකෙ ඝිතාය ඨපිතා තව දන්තධාතු
සෙසා ජනං සිවපුරං ලහු පාපයන්තු—92.

අපරාධං ඛමතා, තමහට කළ අපරාධය ක්ෂමා කරන්නාවූ; ඡද්දන්තනා ගපතිනා, ෂඩ්දන්ත නාගපතිනු විසින් (හෙවත්) සදත්රජහු විසින්; ඡෙ ත්වා, කපා; කරෙඨපිත-අත තබනලද; දන්තවරං, අග්‍රොත්තමයන්; එද්දං ඉව, මැද්ද නුවරට මෙන්; හිතාය, හිත පිණිස; ලොකෙ, ලොක යෙහි; ඨපිතා, නො විසිරෙණයේ අධිෂ්ඨානවශයෙන් තබනලද; තව ද න්තධාතුසෙසා, නුඹවහන්සේගේ දන්තධාතුශ්‍රෙෂ්ඨයෝ; ජනං, සත්ත්ව යා; සිවපුරං, නිවන්පුරයට; ලහු, වහා ම; පාපයන්තු, පමුණුවත් වා.

තනෙනමියාබ්‍යයත්තොඃසමමාලකමහි
ඛණ්ණම්බුතත්ථකනකා විය විප්පකිණ්ණා
කාරුඤ්ඤවාරිදවුත්ථතොදකබින්දුබන්ධු
ධාතූ සමෙන්තු තව ජන්තුසු දුක්ඛදාහෙ—93.

තනෙනමියාබ්‍යයතිනො, එනෙමිය නම් තපස්විහුගේ; අසමමාලක මහි, අසදෘමලුවෙහි; ඛණ්ණ-විසුරුවණ උද අතුරණලද; මුත්තාකන

කාච්ඡ, මුක්තාගෙඩියන් මෙන්; විප්පකිණ්ණා, විසුරුණාවූ; කාරුඤ්ඤවාරිද-කරුණා නැමැති මෙඝයෙන්; චුත-ගිලිහුනාවූ; උදකබින්දුබන්ධු, උදකබින්දූන්ට බන්ධුවූ දියබිඳු වැනි වූ; තව ධාතු, තුඹවහන්සේගේ ශරීරධාතූහු; ජනතුෂ්ටි, සත්වයන් තොරෙනි; දුනබදගෙහ, දිනබදහාන්; සමෙනතු, සන්සිඳුවත් වා.

රක්ඛාය අත්ථවරණාය අසම්මුඛස්ස
රාමෙන දින්නතිණ්ණසඞ්ඛතපාදුකාව
භුත්තා තයා චිරමසම්මුඛනාගතස්ස
ලොකස්ස අත්ථමනුතිට්ඨතු පත්තධාතු—94.

අසම්මුඛස්ස, පරාඞ්මුඛ වූ; රක්ඛස්ස, රාජ්‍යවාසීන්ට; අත්ථවරණාය, වැඩෙහි හැසිරෙණ පිණිස; රාමෙන, රම්රජහු විසින්; දින්න-දෙනලද; තිණ්ණසඞ්ඛත-තණින් කරණලද; පාදුකා ඉව, මරවැඩිසහල මෙන්; තයා භුත්තා, තුඹවහන්සේ විසින් අනුභව කරණලද; පත්තධාතු, පාත්‍රධාතු තොම; අසම්මුඛනාගතස්ස, ඤාණයට හමුනොවූ එහෙයින් ම අනාගත විනෙය වූ; (නොහොත්) අසම්මුඛ, දෙසනාඥාණලොකයට සම්මුඛ නොව; අනාගතස්ස, ලොකොත්තරමාර්ගයෙන් නිවන්පුරයට නොවාවූ නොපැමිණිකාවූ; ලොකස්ස, ලොකයාහට; අත්ථං, වැඩ; චිරං, බොහෝ කාලක්; අනුතිට්ඨතු, කෙරේවා.

වුත්තො ජනානමුපදිස්ස චරාගරඤ්ඤා
සට්ඨිං සහස්සසරදං විය ඤායධම්මො
ආදෙය්‍යහෙය්‍යමුපදිස්ස තයා පවුත්තො
ධම්මො පවත්තතු චිරං ජනතාහිතාය—95.

චරාගරඤ්ඤා, සූකරරජයා විසින්; ජනානං, සත්වයන්ට; උපදිස්ස, උපදෙස දී; වුත්තො, කියනලද; ඤායධම්මො, යුක්තිශාස්ත්‍රය; සට්ඨිංසහස්සසරදං විය, සැටදහසක් අවුරුදු මුළුල්ලෙහි මෙන්; තයා, තුඹවහන්සේ විසින්; ආදෙය්‍යහෙය්‍යං, ග්‍රාහ්‍ය ත්‍යජ්‍ය දෙක; උපදිස්ස, දක්වා; පවුත්තො, වදාරණලද; ධම්මො, ත්‍රිපිටකධර්මය තොම; ජනතාහිතාය, සත්වසමූහයාහට හිත පිණිස; චිරං, බොහෝ කාලයක් මුළුල්ලෙහි; පවත්තතු, පවතීවා.

මාරාරිමද්දනහිතාධිගමං කරොතා
භත්තො තයා වරමහාජයබොධිරාජා
සග්ගාපවග්ගහිතහෙතුජනස්ස හන්ත්වා
සබ්බන්තරායමිහ තිට්ඨතු සුද්ධ සප්ජා—96.

මාරාරිමද්දන-මාරශත්‍රුමර්දනය ද; හිතාධිගමං, හිතයට පැමිණීම ද; කරොතා, කරන්නාවූ; තයා, තුඹවහන්සේ විසින්; භත්තො, භජනය කරණලද; වර-උතුම්වූ; මහා-පූජ්‍යවූ; ජයබොධිරාජා, ජයබොධිරාජ තොම; සබ්බන්තරායං, සියලු අන්තරාය; හන්ත්වා, නසා; ජනස්ස, ජනයාහට; ස

ගොපාවසෙහිනහෙතු, සබ්බභවොපකාරිතපිණ්ඩස; පුණ්ඩු, අභිගයින්; සරෝජා, සැරනුනේ; ඉහ, මේ ලොකයෙහි; තිඨතු, ඕවිවා........නම් වෘක්ෂරාජයක් හු භාජනය කළාවූ තුඹවහන්සේ ගිතනතාරය කාර්වූ මාරගනැනු මැඩ ගි පාඩිගවය කළ ලේක් ද ඒ බොධිද්‍රැමය නොව දැනුඃ පූජා විසින් භජනය කළාවූ ජනයාගේ භිනබාධයයන් නසා සබ්බොපවර්ගිතත පිණ්ඩස අභිගයින් සැරැකී සිටිවයි යේද.

දැන් යශෝකතාවූ බුඩගුණනිගම්ගමාරයෙන් ආශිංසනය කෙරෙත්-

සාමොදවණ්ණගන්ධි ගුණමඤ්ජරියං
වයන * ලතාවිකසිතා තව සප්ඵලඞ්ගා †
බහිණ්ණ චිත්තමධුපෙ රසපිණයනති
සම්භාවිතා භුවි පවත්තතු මඤ්ජොසි—97.

තව, තුඹවහන්සේගේ; අයං, මේ යශෝකතාවූ; ගුණමඤ්ජරී, ගුණය වැනිවූ හෝ වර්ණනාවට බඳිනාසතිතවූ (නොහොත්) ගුණ නැමැති මංජරී නොම (නොහොත්) ගුණසංහති නොම; සාමොදවණ්ණගන්ධිනී, සුවඳයුතිතවූ පැහැ සෙවුනී; (නොහොත්) සානන්ද ජනයන්ගේ ප්‍රශංසාව හෝ වර්ණනාව යෙවුනී; වරිසාලතා-වරීසාව වැනිවූ හෝ ආරාගෙණ යන්නාවූ හෝ ලිගයනි (නොහොත්) ප්‍රවෘත්ති නැමැති ලියෙහි; විකසිතා, පිපියාවූ; (නොහොත් උභයපක්ෂයෙහි ම) වරිසාලතා, ප්‍රවෘත්තිය වැනිවූ ප්‍රවෘත්ති නැමැති හෝ ලියායන්; ආවි, ප්‍රකාශ කොට; කං, ජනමිසනකයෙහි හෝ වාග්ම්‍යානකයෙහි; සිතා; බඳනාලද්දී, (හෙවත්) නිපදවනලද්දී; (මෙයින් පාරමිතා ගුණයන්ගේ නිපදවීමෙහි නොහොත් ගුණසංහතිපක්ෂයෙහි වෘෂ්ඨා සිඩ කිරීමෙහි නිපදවීමෙහි) අලතා, සමජීබැවින්; ආවි, දිපඞ්කරාදිසම්බුඩයන් කෙරෙහි පටන් ප්‍රකාශවූ සුඛය පිණිස; සිතා, කම්බණ්ඩුවශයෙන් තුඹවහන්සේ විසින් බඳනාලද්දී, (හෙවත්) නිපදවනලද්දී; (මෙයින් පාරමිතාගුණයන්) සප්ඵලඞ්ගා, සාධුඵලයට (ද්‍රේ හෝ නොහොත්) ශොභනවූ ලෞකිකලොකොත්තරවිපාකඵලයට හෙතු වීමෙන්; § මඤ්ජොසි, සමස්තලොකයාගේ මස්තකයෙන්; සම්භාවිතා, පැලඳීම් වශයෙන් (ද්‍රේ හෝ නොහොත්) පූජාවශයෙන් ආදරකරණලද්දී; බහිණ්ණ-නමා කර ප්‍රාප්තිවශයෙන් (ද්‍රේ හෝ නොහොත්) ආලම්බනවශයෙන් බවුවාවූ; චිත්තමධුපෙ, ප්‍රකෘතිද්‍රුමමඤ්ජරීපක්ෂයෙහි විසිතුරුවූ හෝ සිත්වැනිවූ හෝ භෘඞ්ගයන්; රසපිණයනති, පුෂ්පරසයෙන් පිණවන්නාවූ; (ගුණමඤ්ජරීපක්ෂයෙහි) චිත්තමධුපෙ, සිත් නැමැති භෘඞ්ගයන්; රසපිණයනති, සුඛසම්පාත්තිසඞ්ඛ්‍යාතරසයෙන් පිණවමින්; (ගුණසංහති පක්ෂයෙහි) චිත්තමධුපෙ, විසිතුරුවූ ගුණම් බොන ජනයන්; රසපිණයනති, ස්වභාවයෙන් (හෙවත්) තමාගේ මධුරභාවයෙන් පිණවමින්; භුවි, පෘථිවියෙහි; පවත්තතු [පකාරෙණ වත්තතු] අතුරුදන් නොව චිරස්ථායීවශයෙන් ප්‍රකාරයෙන් පවතීවා,

දැන් ධර්මරත්නස්තුතීන් ආශිංසනය කෙරෙත්-

---

* මෙර, සනුදු යෙදේ, පොත්හි-වරියා. † සප්ඵලඞ්ගං. § හෙතුවී.

සඹුධසෙලවලයනතරජානනාවහා
අනොතත්තතො තිපථගා යතිසාගරඪා
ධම්මාපගා සුතිවසොතරිතෙ පුණනතී
සම්භාරසස්සමිහ වත්තතු පාවයනතී—98.

සම්බුධ-සර්‍වඥයන් වැනිවූ හෝ ලොකප්‍රසිද්ධවූ හෝ; සෙලවලය-පර්‍වතවක්‍රයාගේ; අනතර-අභ්‍යන්තරයෙහි සිටි; ජනන-දූත්ව හෙතු කොට ගෙණ; අවහා, අජිරාතුගත නම් හෙයින්; අනොතත්තතො, අනවතප්ත නම් විලින් නික්ම; තිපථගා, භූමිපර්‍වතාකාශසඞ්ඛ්‍යාතත්‍රිපථයෙන් ගියාවූ; (නොහොත්) සම්බුධ-සර්‍වඥ නැමැති; සෙලවලයනතරජ-පර්‍වතවක්‍රයාගේ අභ්‍යන්තරයෙන් වූ; ආනනවහ-වක්‍ත්‍ර නැමැති; අනොතත්තතො, අනවතප්තයෙන් නික්ම; තිපථගා, සූත්‍රාභිධර්‍මවිනයාඛ්‍යාතත්‍රිපථයෙන් (හෙවත්) ත්‍රිප්‍රකාරයකින් පැවැත්තාවූ; යති-භික්ෂූන් වැනිවූ හෝ විවර්‍තිතසාගරය සේ නිම්මයපිංඥ නොව වෙලානතයෙන් යුක්තවූ හෝ; සාගරඪා, ප්‍රකෘතිසාගරයෙහි පිහිටියාවූ; (නොහොත්) යතිසාගරඪ, භික්ෂු නැමැති සාගරයෙහි පිහිටියාවූ; සුතිවස-ශ්‍රැතිවශයට ජලප්‍රවාහවශයට; (නොහොත්) ශබ්දවශයට හෝ කර්‍ණවශයට; ඔතරිතෙ, බටුවවුන්; පුණනති, පවිත්‍ර කරන්නාවූ; ධම්මාපගා, ධර්‍මය වැනිවූ හෝ ස්වභාවවූ හෝ ගඟා තොම; (නොහොත්) ධර්‍ම නැමැති ගඟා තොම; සම්භාරසස්සං, සම්භාරයන් වැනිවූ හෝ ධාන්‍යයට හෙතුවූ හෝ ශස්‍යය; (නොහොත්) බොධිසම්භාර නැමැති ශස්‍යය; පාවයනති, පැසවමින් හෝ මුහුකුරුවමින්; ඉහ, මේ ලොකයෙහි; වත්තතු, පවතීවා.

මෙසේ පර්‍යාප්තිධර්‍මස්තුතින් ආශිංසනය කොට දැන් ප්‍රතිපත්තිධර්‍මස්තුතින් ආශිංසනය කෙරෙත්-

පසන්නවණ්ණකුසිතාපගහානවාසුගාහි
සද්ධාලඞ්කාරසහිතා සතිජොතවාහා
සම්පාපයාතු භවසාගරපාරතීර
සප්පටිහනං වද්ධතෙ පටිපත්තිනාවා—99.

පසන්නවණ්ණ-ශරීරාදිවශයෙන් ප්‍රතිභිය ඇත්තාවූ, (නොහොත්) සත්‍යණය වැනිවූ හෝ සත්‍යණ නැමැතිවූ හෝ; කුසිත-කුත්‍යාශ්‍රිතවූ, (නොහොත්) කුසයෙහි බඳනාලද්දාවූ; පග්ගහ-හුවා ගන්නාවූ හෝ මනා කොට ගෙණ ගන්නාලද හෝ, (නොහොත්) වීර්‍ය වැනි වූ හෝ වීර්‍ය නැමැති වූ හෝ; වාසුගාහි, සුලභ ගන්නාවූ; සද්ධා-ස්වකෘත්‍යයෙහි යොග්‍යයයි හැඳිනිය යුතුවූ, (නොහොත්) ශ්‍රද්ධාව වැනිවූ හෝ ශ්‍රද්ධා නැමැති වූ හෝ; ලඞ්කාරසහිතා, රුවලින් යුක්තාවූ; සති-අනුවර්‍තනයට කාරණ වූ හෝ, (නොහොත්) සතිය වැනි වූ හෝ සති නැමැති වූ හෝ; පොතවාහා, ජ්‍යෙෂ්ඨ ඇති; පටිපත්ති-ගාත්‍රාගමනයට කාරණවූ, (නොහොත්) ප්‍රතිපත්තිය වැනිවූ හෝ ප්‍රතිපත්ති

නැමැති හෝ; නාවා, නෞකා නොම්; වරධනෙ, උත්තම වූ මුක්තාමාණි
ක්‍යාදිවස්තූන්, (නොහොත්) උතුම්වූ ශ්‍රද්ධාධනාදිය ඇති ජනයන්; භව-සා
ගරයින් බබලනහෙයින් භව නම්වූ හෝ රත්නයන් ඇති හෙයින් භව නම් වූ,
හෝ භවය වැනි වූ හෝ; සාගරපාරතීර-ප්‍රකෘතිසාගරයාගේ පරතෙර වූ;
සම්පට්ටනං, ශෝභනවූ පත්තනග්‍රාමයට; (නොහොත්) භවසාගරපාරතීර-
නිර්වාණ නැමැති; සම්පට්ටනං, ක්ෂෙම හෙයින් සුන්දරවූ පත්තනයට; ස
මුපාපයතු, අනෂ්ටවශයෙන් මනා කොට (නොහොත්) අතිශයින් වහා ම
පමුණුවා වා—අනෙකොපද්‍රවචණ්ඩමත්ස්‍යනක්‍රකුල හෙයින් හා දුඃඛරාශි
නැමැති ජලරාශීන් භරිත හෙයින් භවය සාගරය වැන්න, එයින් මුක්ත
හෙයින් නිර්වාණය ක්ෂෙමවූ පත්තනයක් වැන්න, ශ්‍රද්ධාශීලහිරිඔත්තප්ප
ශ්‍රුතචාගපඤ්ඤා යන සත දිළිඳුබැව් නසන හෙයින් මුක්තාදිසප්තධනය
වැන්න, සාගරයාත්‍රායෙන් නිපන් මුක්තාදිධනවන්තයන් මෙන් සංසාර
සාගරයෙහි ඇවිදිනවුන් විසින් ම නිපදවියයුතුවූ ශ්‍රද්ධාදිධනවතුන් නිර්වා
ණපත්තනයට පමුණුවන හෙයින් ප්‍රතිපත්තිය නෞකාවක් වැන්න, නෛ
ර්‍යාණික ප්‍රතිපත්තියෙහි ම සම්ප්‍රයුක්ත ශ්‍රද්ධාප්‍රකාරය පවත්වා පිහිටන
හෙයින් ඥානය කූඹයක් වැන්න, වීර්‍ය්‍යවාතය ගන්නා හෙයින් ඥානාශ්‍රිත
ශ්‍රද්ධාව ඒ කූඹෙහි නැගූ රුවලක් වැන්නීය, සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන් ප්‍ර
තිපත්තිය පවත්නා හෙයින් වීර්‍ය්‍ය ප්‍රතිපත්තිනෞකාව ගෙණ යන්නා
වූ වාතයක් වැන්නේය, හැමතැන්හි ම ස්මෘතිආරක්ෂාවෙන් අනෂ්ටවන
හෙයින් සතිය ප්‍රතිපත්ති නෞකාවගේ අනෂ්ටප්‍රවෘත්තියට කාරණවූ නියා
මුවකු වැන්නීයි, ශීලවිශුද්ධියෙහි පටන් ඥානදර්ශනවිශුද්ධිය දක්වා නිර්වා
ණගාමිනිප්‍රතිපද හෙයින් ප්‍රතිපත්තිය ධර්ම නම් වේ.

මෙසේ ප්‍රතිපත්තිධර්මස්තුතියෙන් ආශිංසනය කොට දැන් ශාසනමුඛ
යෙන් උක්තානුක්තසධර්මස්තුතියෙන් ආශිංසනය කෙරෙත්—

බොජ්ඣඞ්ගසත්තරතනාකරධම්මඛන්ධ
ගම්භීරනීරමයසාසනසාගරෙ සං
සොසිල්‍යනානත්තතනුවෙඨිතඤාණනාවි
සෙලෙන මනොනවතා දිසතාමතං වෙ—103.

බොජ්ඣඞ්ග-සතර මහාසාගරාදිවිසින් දත යුතුවූ අවයවයන් ඇත්තා
වූ ද; සත්තරතනාකර-සප්තරත්නයන්ට ආකරවූ ද; (නොහොත්) බො
ජ්ඣඞ්ගසත්ත-දතයුතුවූ අවයවභෙද ඇති සප්තාංශයන්ට හා; රතනාකර-
රත්නයන්ට උත්පත්තිස්ථානවූ; (නොහොත්) බොජ්ඣඞ්ග-සප්තබොධ්‍ය
ඞ්ගයන් වැනිවූ හෝ සප්තබොධ්‍යඞ්ග නැමැති හෝ; සත්තරතනාකර-
සප්තරත්නයන්ට ආකරවූ; ධම්මක්ඛන්ධ-සුවාසූදහසක් ධර්මස්කන්ධය වැ
නිවූ හෝ සුවාසූදහසක් ධර්මස්කන්ධ නැමැති හෝ; ගම්භීරනීරමය-සුවා
සූදහසක් යොදුන් ගැඹුරු ජලස්කන්ධය ඇති; සාසන [සං ආසන]-ශෝ
භනවූ ශ්‍රීනාගනාදමෘතාදීන්ට ආසනවූ, තිබෙනතැන්වූ (හෙවත්) ආධාරවූ,

සාගරෙ, ප්‍රඥාතිසාගරය තෙම; (නොහොත්) සාසනසාගරෙ, ත්‍රිවිධ ශාසනය වැනිවූ හෝ ත්‍රිවිධශාසන නැමැති හෝ සාගරය තෙම; සං, තමා; මනජ්ජිනවතං, මනථනය කළවුන්ට; (කාවරපරිද්දෙන්ද යත්) සොසීල්‍ය-සුන්දරස්වභාවයක් ඇත්තාවූ; අනන්ත-අනන්ත නම් නාගරාජයාගේ; තන්තුවෙඨිත-බොහෝ කොට පටලුව* සිසැරීම ඇලලීමට යොග්‍ය නොවන හෙයින් තුනු කොට සිසැරීම ඇත්තාවූ; ක්‍ෂණවනථසෙලෙන, ප්‍රගීතිය ඇත්තාවූ මනථපර්වතයෙන්;(නොහොත්) සොසීල්‍ය-සෞශීල්‍යගුණය වැනිවූ හෝ සෞශීල්‍යගුණ නැමැති හෝ; අනන්තනනු, අනන්ත නම් නාගරාජයාගේ දරණවැලයෙන්; වෙඨිත-වෙළනලද පටලුව සිසාරණලද; ක්‍ෂණමනථසෙලෙන, ක්‍ෂණය වැනි (දේහෝ නොහොත්) ක්‍ෂණ නැමැති මනථපර්වතයෙන්; මනජ්ජිනවතං, ඇලලුවන්ට; අමතං, සුධාව (දේහෝ නොහොත්) නිර්වාණය; වෙ, එකාන්තයෙන්; දිසතු,දේවා.

ශාසනමුඛයෙන් දක්වූ ත්‍රිවිධසද්ධර්මයෙහි නිර්වාණය ඇතුළත් නොකළහෙයින් දැන් ඒ නිර්වාණස්තුතියෙන් ආශිංසනය කෙරෙත්–

වුත්තෙන යෙන විධිනා විධිනා තතො තං
ලද්ධානුභූතමමතං ඛිලදොසනාසං
අච්චන්තරොගජරතාමරණාභිභූතං
භූතං කරොතු අමරං අජරං අරොගං—101.

ඛිලදොසනාසං, සංදෘෂ්ටවූ වාතපිත්තාදිදොෂයන් (දේහෝ නොහොත්) පංචචෙතොඛිලදොෂයන් නසන්නාවූ; (නොහොත්) අඛිලදොසනාසං, සියලු වාතාදිදොෂයන් (දේහෝ නොහොත්) රාගාදිදොෂයන් නසන්නාවූ; තං අමතං, ඒ පීයූෂය, (දේහෝ නොහොත්) නිර්වාණය; වුත්තෙන යෙන විධිනා, අනන්තනාගභොගාවලින් වෙෂ්ටිත මනථපර්වතයෙන් මනථනයයි කියනලද,ඒ ප්‍රකාරය හා සමග; විධිනා, දෛවයෙන්; තතො, ඒ ප්‍රඥාතිසාගරයෙන්; ලද්ධා, ලදින්; නිර්වාණවූතාය සෞශීල්‍යානන්තානුවෙෂ්ටිතක්‍ෂණමනථපර්වතයෙන් මනථනය යි කියනලද ඒ ප්‍රකාරයා හා සමග පුරාකෘතඋපනිශ්‍රයකුශලයෙන් ඒ ශාසනසාගරයෙන් ලදින්; (නොහොත්) යෙන, ඒ සර්වඥයන් විසින්; වුත්තෙන විධිනා, උක්තාවූ කල්‍යාණමිත්‍රසංසර්ගාදි ප්‍රකාරය හා සමග; විධිනා, පුරාකෘතඋපනිශ්‍රයකුශලයෙන්; තතො ලද්ධා, ඒ ඒ අවසානප්‍රතිපත්තිවූ මාර්ගක්‍ෂණයෙහි ලදින්; (නොහොත්) වුත්තෙන, ප්‍රතිපත්තියෙහි; යෙන, නම්වූ; විධිනා, විශිෂ්ට වූ ප්‍රඥා ඇත්තානු විසින්; (හෙවත්) විධිනා, පුරාකෘතඋපනිශ්‍රයකුශලය හා සමග, (හෙවත්) එයින් සහිතවූ; තතො, ඒ ප්‍රතිපත්තිය හෙතු කොට ගෙණ; ලද්ධා, ලදින්; අනුභූතං, අනුභව කරණලද්දේ; අච්චන්ත-අතිශයින්; රොගජරතාමරණාභිභූතං, ව්‍යාධිජරාමරණයින් මඩනාලද්දාවූ; භූතා,

* පටළුව, පොත්හි.

සනාථසමූහයා; අමරං, මරණ නැත්තවූ; අජරං, ජරා නැත්තාවූ; අරොගං, රෝග නැත්තාවූ; කාරතු, කෙරේවා.

මෙසේ දශවිධධර්මස්තුතියෙන් ඉෂ්ටාශිංසනය කොට දැන් අෂ්ටාඞ්ගසඞ්ඝස්තුතින් ආශිංසනය කෙරෙත්–

සද්ධම්මරාජරවිනිග්ගතධම්මරංසි
ඵුල්ලා ධුතඞ්ගදලසංවරකෙසරාලී
සඞ්ඛාරවින්දහිතකාරෙ සමුබ්භං සමාධි
සත්කාරණණ්ණිකො දිසතු සාසනවාපිජාතො—102.

සද්ධම්මරාජ-ඝනකීයවූ හෝ සුන්දරවූ හෝ ස්වභාවයෙන් බබලන්නාවූ හෝ ජනයන් ඇලවන්නාවූ හෝ, (නොහොත්) සද්ධර්මරාජයන් වැනිවූ; රවි-සූර්‍ය්‍ය කෙරෙන්; (නොහොත්) සද්ධම්මරාජ-සුන්දරස්වභාවයෙන් හෝ ගුණයෙන් හෝ බබලනහෙයින් ද තමන් සද්ධර්මයට ස්වාමී හෙයින් ද සද්ධර්මරාජයයි කියනලද සර්වඥ නැමැති; රවිනිග්ගත-සූර්‍ය්‍ය කෙරෙන් නික්මුනාවූ; ධම්මරංසි-ප්‍රකාශිතරශ්මීන් හෝ ධර්මය වැනි රශ්මීන් හෝ, (නොහොත්) ධර්ම නැමැති රශ්මීන්; ඵුල්ලා, විකසිතවූ; ධුත-වාතයෙන් සොල්වනලද; අඞ්ගදල-අවයවපත්‍රයන් ඇති; (නොහොත්) ධුතඞ්ගදල- ධුතාඞ්ගයන් වැනිවූ හෝ ධුතාඞ්ග නැමැතිවූ හෝ පත්‍රයන් ඇති; සංවර-ශොභනවූ හෝ උතුම්වූ; (නොහොත්) සංවර-සංවරයන් වැනිවූ හෝ සංවර නැමැති හෝ; කෙසරාලි, කෙසුරුපෙළා ඇති; සමාධි-මනාව පිහිටියාවූ, (නොහොත්) සමාධිය සේ නිශ්චලවූ හෝ සමාධි නැමැතිවූ හෝ; සත්කාරණණ්ණිකො, ශොභනවූ කණිණිකා ඇති; සාසන—ශොභනවූ ජලාදියට ආධාරවූ (නොහොත්) ශාසනය වැනිවූ හෝ ශාසන නැමැතිවූ හෝ; වාපිජාතො, තටාකයෙහි හටගත්තාවූ; සඞ්ඛ-සඞ්ඛයා වැනිවූ හෝ සඞ්ඝ නැමැතිවූ හෝ; අරවින්දනිකාරෙ, පද්මසමූහ තෙම; සමබුං, ශොභනවූ මකරන්දයන්, (නොහොත්) ලෞකිකලොකොත්තර සුඛසම්පත් නැමැති මකරන්දයන්; දිසතු, සියලු සත්ත්වයන්ට දේවා.

ප්‍රබන්ධසංවර්ධනයට කාරණවූ සද්ගුරුසංසෙවායෙන් හා සත්‍වානුස්මරණයෙන් වැඩුනාවූ බුද්ධි ඇත්තාක්හු විසින් මේ පද්‍යබන්ධනය නිපදවනලදැයි දක්වමෙන්, සත්‍වයන්ට එහි සාදරශ්‍රවණවශයෙන් සිඩවන්නාවූ හිතාශිංසනය කෙරෙති, තදාකාරවූ ද හිතාශිංසනවාරයෙන් සියලු හිතසංසිද්ධියට මූලකාරණ හෙයින් බුදුන් කෙරෙහි භක්තියත් එසේවූ බුදුන්ගේ සම්‍යක් දක්නට සත්පුරුෂසමවාය මූලකාරණ හෙයින් සද්ගුරුන් කෙරෙහි භක්තියත් අවශ්‍යයෙන් කටයුතුබවද යන ඒ දෙකාව තමන් කෙරෙහි ඇති හෙයින් අභිව්‍යක්ත කොට තුබූ නමක් මෙන් නාමයෙන් ම ඒ අභිව්‍යඞ්ගව්‍ය වන නිසාව ද භනවත්නෝ “ආනන්ද” යනාදි ගාථාවක් ප්‍රයොග කළෝ.

ආනන්දරඤ්ඤරතනාදිමහායතින්ද
නිච්චප්පබුද්ධපදුමප්පියසෙවනඞ්ගී
බුද්ධප්පියෙන ඝනබුද්ධගුණප්පියෙන
ථේරාලිනා රචිතපජ්ජමධුම්පිබන්තු—103.

ආනන්දරඤ්ඤරතනාදිමහායතින්ද-ආනන්ද නම් වනරතන මහාස්ථවිරයා වැනිවූ, (නොහොත්) මහාස්ථවිර නැමැති; නිච්චප්පබුද්ධ-දිනකරකිරණයෙන් නිරන්තරයෙන් පිපී සිටිනාවූ, (නොහොත්) ශ්‍රැතවයඥාන ස්වභාවඥානයෙන් නිරන්තරයෙන් විකාශයට පැමිණියාවූ; පදුම-ප්‍රකාශවූ දෘෂ්‍ය (ද්වේහෝ නොහොත්) පද්මය; පියසෙවනා, ප්‍රියව ප්‍රීතිපුරඃසරව සෙවුනාසුලුවූ; ඝනබුද්ධගුණප්පියෙන, එහෙයින්ම නිරන්තරයෙන් දිනකරකිරණයෙන් හෝ ඥානයෙන් හෝ විකශිතයාගේ සෞරභ්‍යගුණයෙහි හෝ බාහුශ්‍රැතාදි ගුණයෙහි හෝ ප්‍රියවූ, (නොහොත්) ඝන-අතිශයින්; බුද්ධගුණප්පියෙන, බුදුගුණෙහි ප්‍රියවූ ඒ කාරණයෙන් වෙන්; බුද්ධප්පියෙන, බුද්ධප්‍රිය නම් වූ; ථේරාලිනා, වෘද්ධප්‍රාප්තභෘඞ්ගයා විසින්, (ද්වේහෝ නොහොත්) ස්ථවිර නැමැති භෘඞ්ගයා විසින්; රචිතපජ්ජමධුං, බඳනාලද්දවූ පද්‍යය වැනි මධුව, (ද්වේහෝ නොහොත්) පද්‍යනැමැති මධුව; අඞ්ගී, සත්ත්වයෝ; පිබන්තු, බොත්වා——ආනන්දමහායතින්දප්පබුද්ධපදුමසෙවනයෙන් ලද සම්භවකරණයෙන් බඳනාලද ශ්ලෝකාරසමධුව බොත්වයි යේසි——බුද්ධෙ විකසිතෙ සම්මාසම්බුද්ධෙ වා පියොති බුද්ධප්පියො, යන නිර්වචනයෙන් භෘඞ්ගයා ද ස්ථවිරයා ද යයි එම නිර්වචනාර්ථයන් විදහා, නිච්චප්පබුද්ධපදුමප්පියසෙවනා යන්නෙන්ද, ඝනබුද්ධගුණප්පියෙන, යන්නෙන් ද දක්වූ හු එසේ දැක්වීමෙන් ද බාහුශ්‍රැතාදිගුණප්‍රියත්වයෙන් යදගුරුසංසෙවාය ද සදගුරුසමවායෙන් සත්සමයවිවෙකය දැන බුදුන් කෙරෙහි භක්තිශ්‍රද්ධා ඇති හෙයින් * ස්ථවිරද වන්නේය එසේ ස්ථිර පරිණතවූ බුඞ් ඇත්තක්හු විසින් රචිත පද්‍යය ආස්වාදයට නිසිද වන්නේය එසේ ආස්වාදනීය හෙයින් ස්ථිරශීලත්වයෙන් වැඩුනාවූ සත්වනිතකාමිත්වයෙන් ඒ ආස්වාදකටයුත්තපිමෙහි වන්නේය ඒ පිම ද හසනාම්බිකණ්ඨාදි අවයවහට සමෘහව වන හෙයින් අධ්‍යශ්‍යබ්දප්‍රයොගය ද උචිත වන්නේයයි මෙසේ ඖචිත්‍ය ප්‍රදර්ශිය කෙරෙත්.

දැන් තමන් විසින් සම්නවූ අතිවිශිෂ්ටවූ කුශලය තෘෂ්ණපරාමර්ශාදිවශයෙන් සඞ්ලිෂ්ට නොකොට මතුමත්තෙහි වඩවඩා එයින් අසංකලිෂ්ටවූ හෙතුව ම පතන්නෝ යම්සේ ඵලාර්ථීහු ඵලදායිවෘක්ෂය ම වඩන්නෝ අර්ථී හෙයින් ඵලය ම වඩන්නෝ නම් වෙද්ද එසේ ම හෙතුවර්ධනයෙන් ලෞකිකලොකොත්තර ඵලය ම වඩනු පිණිස "ඉසුං" යනාදි ගාථාවක් ප්‍රයොග කළෝ-

---

* සත්සමය විවෙකය දැන බුදුන්කෙරෙහි ඇතිහෙයින්, පොත්හි.

ඉත්ථං රූපගුණානුකිත්තනවසා තං තං හිතාසිංසතො
වත්ථානුස්සති වණ්ණිතා ඉහ යථා සජ්ජනෙසු මෙත්තා ච මෙ
එවන්තා හි භවන්තරුත්තරතරං වත්තන්තු ආබොධි මෙ *
සංයොගො ච ධනෙහි සත්තහි භවෙ කල්‍යාණමිත්තෙහි ච—104.


ඉත්ථං, මෙසේ; රූපගුණානුකිත්තනවසා, රූපගුණයන්ගේ කථනවශයෙන්; තං තං හිතාසිංසතො, ඒ ඒ හිත පතන්නාවූ; මෙ, මා විසින්; වත්ථානුස්සති, රත්නත්‍රයගුණානුස්මරණය ද; සජ්ජනෙසු, සජ්ජනයන් කෙරෙහි; මෙත්තා ච, මෛත්‍රිය ද යන මොහු; ඉහ, මේ භවයෙහි; යථා වණ්ණිතා, යම්සේ පවත්වනලදහු ද; එවන්තාහි, මෙසේ පවත්වනලද ඔවුහු; භවන්තරුත්තරතරං, මතු භවයෙහි අතිශයින් වඩවඩා; මෙ, මාගේ; ආබොධි, සම්‍යක් සම්බෝධිය දක්වා; වත්තන්තු, පවතිත්වා; සත්තහි ධනෙහි, සප්තවිධ ආර්‍ය්‍යධනයන් හා ද; කල්‍යාණමිත්තෙහි ච, කල්‍යාණමිත්‍රයන් හා ද; සංයොගො ච, එක්වීමද; භවෙ, වේවා.

ශ්‍රීමද් ආචාර්‍ය්‍ය බුද්ධප්‍රියස්වාමිපාදයන් විසින් විරචිත පද්‍යමධු නම් කාව්‍යය හා තදර්ථවිවරණය.

සමාප්තයි.

* තාබොධි මෙ-පොත්හි,

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු